

# පාරාජිකා පාළි ගැටපදයං

# පාරාජික පාළි ගැටපදය.

—— || ——

වලලියද්දේ ශ්‍රී සුමඞ්ගල විද්‍යාලයේ ආචාර්‍ය්‍ය

— පණ්ඩිත අම්තිරිගල —

## පඤ්ඤාවංස ස්ථවිර පාදයන් වහන්සේ

— විසින් —

සම්පාදනය කරන ලදී.

---

බලගල්ලේ සරස්වතී පිරිවෙන්හි උප ප්‍රධානාචාර්‍ය්‍ය

— පණ්ඩිත හපුවලානේ —

## ශ්‍රී ඥානාලෝක ස්ථවිර පාදයන් වහන්සේ

— විසින් —

ශුද්ධිපත්‍රාවලෝකනය කරන ලදී.

---

බලගල්ලේ සරස්වතී පරිවේණාධිපති පණ්ඩිතාචාර්‍ය්‍ය

— කිස්සැල්ලේ —

## ශ්‍රී ඥානෝදය මහා ස්ථවිර පාදයන් වහන්සේ

— විසින් —

පිළිගන්නා ලදී.

---

මිගල්ලේ ඩී. පී. රාජකරුණා මුදලාලි මහත්මයා

— විසින් —

අත්තනගල්ලේ සහබෝ මුද්‍රණාලයේ මුද්‍රණය කරවා

ප්‍රසිද්ධ කරන ලදී.

---

2486 / 1942 නොවැම්බර 19 දින දී ය.

# සංඥාපනය.

**“විනයෝ නාම සාසනස්ස ආයු”** විනය සම්බුද්ධ ශාසනයාගේ ආයුෂය වේ. සසුන් ගත කුල පුත්‍රයන් ගේ කාය වාක් සංවරය පිණිස සම්බුදු රදුන් විසින් දෙසා වදාළ **පාරාජිකා- පචිති- මහ වග- සුළු වග- පරිවාර** යන ග්‍රන්ථ පඤ්චකයකින් පරිමිත වූ විනය පිටකය ඔවුන් විසින් ප්‍රගුණ කොට දැරීම හා ඒ අනුව සංවරයෙහි පිහිටා සසුන් කිස නො පිරිහෙලා සම්පූර්ණ කරන තාක් සම්බුද්ධ ශාසනය දීප්තිමත් ව බැබළේ. විනය පාළිය ඇතැම් තැන ලෞකික සංස්කෘතයට වේද සංස්කෘතය මෙන් එය ඉගෙන ගන්නා ශිෂ්‍යයාහට මහත් ආයාශය පිණිස හේතු වේ. ලංකාවේ මේ කල විනය ධාරීන් ගේ දුර්ලභත්වයට ද ප්‍රධාන හේතුව එය ම යයි සැලකීම නිවරද යයි හඟිමු. ශාසනාගත කුල පුත්‍රයෙකු අතට පළමුවෙන් ම ප්‍රගුණ කිරීම පිණිස පත් වනුයේ ප්‍රාතිමෝක්ෂය යි. එහි පෙළට සන්න කිපයක් ම මුද්‍රණද්වාරයෙන් ප්‍රචාරයට පැමිණ තිබෙන හෙයින් එය උගන්නාහට පදගතාර්ථාවබෝධය සම්බන්ධයෙන් නම් වඩා දුෂ්කරත්වයකට මුහුණ පාන්නට සිදු නො වේ. එහෙත් අටුවා ටීකානුගත අවබෝධයක් නම් ඔහුට නො ලැබේ.

ප්‍රාතිමෝක්ෂයෙන් පසුව ප්‍රගුණ කිරීම පිණිස විනය පිටකයෙන් ශිෂ්‍යයා අතට දෙනුයේ ‘**පාරාජිකා පාළිය**’ යි. සාමාන්‍යයෙන් බැලූ බැල්මට නම් එහි පාළිය බොහෝ තැන්වල සරල ය. එහෙත් අටුවා ටීකා කොතෙක් පෙරළුවත්. නවීනයෙකුට තබා ප්‍රවීනයෙකුට ද අදහස අවබෝධ කර ගැනීමට දුෂ්කරස්ථාන රාශියකි.

ශිෂ්‍යයන් හට ඇති වන මේ කරදරය මදක් වත් දුරලීමට මෙතෙක් යොදනුවස් කලක පටන් ම අදහස් කර සිටින විට අප වයස්‍ය සහෝදර **වලල්යද්දේ ගරු පඤ්ඤාවාස** ස්ථවිර පාදයන් වහන්සේ ද අප ඒ පිණිස උත්සාහවත් කළ බැවින් **පාරාජිකා පාළියේ** දුරවබෝධස්ථානයන්ට ගැට පදයක් ලියා ශිෂ්‍යයන් අතට පත් කිරීමට මේ දුෂ්කර කාලයෙහි ම ආරම්භ කොළෙමු. එය එසේ ම **සමන්ත පාසාදිකා- විමති විනෝදනී- සාරත්ථ දීපනී- විනය විනිශ්චය- ඛුද්ද සික්ඛා** ආදි විනය විවරණාශ්‍රිත ග්‍රන්ථවල සහ ගුරූපදේශවල ද ආධාරයෙන් හැකි තාක් දුරට සම්පූර්ණ කොට ලියා මෙසේ පළ කොළෙමු. ඇතැම්

වචන සම්බන්ධ අරුත් ඒ පිළිබඳ කිසි ම ග්‍රන්ථයකින් සපයා ගත නො හැකි වීම නිසා එ බඳු තැන් කීපයක දී උසස් විනය ධාරීන්ගේ හා ශුද්ධි පත්‍රාවලෝකනය කළ පණ්ඩිත හපුවලානේ ශ්‍රී ඥානාලෝක ස්ථවිර පාදයන් වහන්සේ ගේ ද අදහස් විමසා ස්ථානෝචිතාර්ථයක් දුනිමු. මෙ වර එසේ යෙදුව ද සැවද එ බඳු ස්ථාන ගැන අපි පරීක්ෂා කරන්නෙමු. දෙවන සංස්කරණයක දී පාරාජිකා - සංඝාදිසේස වාරච්ඡේදයන් සහිත තවත් විස්තර යොදා අප ගේ අනවධානත්වයෙන් වූ අඩු පාඩුත් සම්පූර්ණ කොට පළ කිරීමට බලා පොරොත්තු වෙමු.

---

# උපකාරානුස්මරණය.

---

මේ කෘතිය උගතුන් අතරට ඉතා සුළු දෙයකි. අපි දු එසේ ම පිළි ගන්නෙමු. එසේ වුව ද අප අතින් ලියැවී මුද්‍රණයට පැමිණ ප්‍රචාරයට යන පළමු වන ග්‍රන්ථය මෙය බැවින් යුතු කමක් වශයෙන් අප ගේ දියුණුවට ආධාර කළ උතුමන් ගෞරව පූර්වක ව මෙහිලා සිහිපත් කරමු. අස්මදාචාර්ය වලලියද්දේ සුභද්‍රාරාමාධිපතිව වැඩ විසූ අපවත් වී වදාළ ශ්‍රී ලඞ්කා රාමඤ්ඤ නිකායේ දිශා පාලක ධුරන්ධර නෛයාචාර්ය වේවැල්දෙණියේ නන්දාරාම තිස්ස මහා ස්ථවිර පාදයන් වහන්සේ හා පණ්ඩිත ගරු වතුරුගම පඤ්ඤාරතන ස්ථවිර පාදයන් වහන්සේ ද ප්‍රව්‍රජ්‍යාචාර්යයන් වහන්සේලා මෙන් ම දයාවෙන් අප දියුණුව ඇතිකර ලීමෙහි නිරත වූවන් බව ගෞරව පූර්වක ව පළමු කොට ම සිහි පත් කරමු.

අනතුරුව මේ ග්‍රන්ථය පිළිගැනීමෙහු දු අපට සංග්‍රහ කළ බලගල්ලේ සරස්වතී පිරිවෙණාධිපති පණ්ඩිතාචාර්ය කිස්සැල්ලේ ශ්‍රී ඥානෝදය මහා ස්ථවිර පාදයන් වහන්සේ හා එහි ම උප ප්‍රධානාචාර්ය ධුරන්ධර වූ මේ ග්‍රන්ථයෙහි ශුද්ධි පත්‍රාවලෝකනයෙහු දු අප අදහස් සම්පූර්ණ කළ පණ්ඩිත ගරු හපුවලානේ ශ්‍රී ඥානාලෝක ස්ථවිර පාදයන් වහන්සේ ද රත්නපුරේ ශ්‍රී සුමන විද්‍යාලයාධිපති පණ්ඩිත ගරු හේන්පිටගෙදර ඥාණසීහ ස්ථවිර පාදයන් වහන්සේ ද ධර්මාචාර්යයන් වහන්සේලා වශයෙන් ගෞරව පූර්වක ව සිහි පත් කරමු.

තවද, වල ලියද්දේ ශ්‍රී සුමඞ්ගල විද්‍යාලයාධිපති අප ගරු වයස්‍ය සහෝදර ගොඩගම සිරි පඤ්ඤානන්ද ස්ථවිර පාදයන් වහන්සේ හා එහි උපාචාර්‍ය වලලියද්දේ ගරු පඤ්ඤාවාස ස්ථවිර පාදයන් වහන්සේ ද සහෝදර ප්‍රේමයෙන් අප අභිවෘද්ධිය සලසා දීමෙහි ප්‍රෝත්සාහී වූ බව සිහි කරන අතර ම මේ ග්‍රන්ථය සැපයීමට මුල දී ආධාර කළ සරස්වතී පිරිවෙන්හි උපාචාර්‍ය වරයෙක්ව සිටි මගල්ගොඩ ගරු චන්ද්‍රවංශ ස්ථවිර පාදයන් වහන්සේ ද කෘතඥතා පූර්වක ව මෙහිදී සිහිපත් කරමු.

තව ද අප ගේ ඉගෙනීමේ කටයුතු අවසාන වන තෙක් සියලු වියදම් කිරීමෙන් පුත්‍රප්‍රේම යෙන් අනුග්‍රහ කළ අප පිතෘ භූත අමිතිරිගල වසමේ විශ්‍රාමලත් ගම් ආරච්චි ධූරන්ධර ජී. ඇම්. ජී. එදිරිසිංහ රාළහාමි සහ අප දයාබර සහෝදර පිරිස ද අවසාන වශයෙන් ප්‍රීති පුරස්සර ව සිහි පත් කරමු.

---

## මුද්‍රණය.

---

අද පවත්නා භයානක ලෝක සංග්‍රාම යේ දුර්විපාකයක් වශයෙන් හැම දෙයක ම මිල අධික වී තිබෙන මේ අවධියෙහි ස්වකීය ධන පරිත්‍යාග යෙන් මෙය මුද්‍රණය කරවා දුන් අප ඥාති සහෝදර මිගල්ලේ ඩී. පී. රාජ කරුණා මුදලාලි මහත්-මයාට අප ගේ හෘදයඞ්ගගම ස්තුතිය පුද කරන අතර ම කඩ දාසි හිඟකම නිසා බලවත් කරදරයට පත් ව මෙය මුද්‍රණය කළ අත්තනගල්ලේ සඟබෝ මුද්‍රණාලයෙහි ඩී. ජී. සුබසිංහ මහත්මයා ප්‍රධාන එහි කාර්‍ය මණ්ඩලයට ද අවඬක භක්තියෙන් යුක්ත ව ස්තුති කරන්නෙමු.

මෙයට-

අමිතිරිගල පඤ්ඤාවංස ස්ථවිර.

ශ්‍රී: බු: ව: 2486/1942-11-19
ක්‍රි: ව:

ශ්‍රී සුමඞ්ගල විද්‍යාලය,
වල ලියද්ද,
උඩරාපොල,

# විශේෂ නිවේදනය යි.

---

මෙහි පිටු ගණන් යොදන ලද්දේ ක්‍රි: ව: **1901** වර්‍ෂයේ **මුද්‍රිත පාරාජිකා පාළියෙන්** බව පොත පරිශීලනය කරන්නන් විසින් සැලකිය යුතු ය. මෙහි පාළි පදවල **ඤ්, ඞ** ඇති තන්හි දී ඤ්, ඞ, රූපයෙන් ම යෙදූ බව සැලකිය යුතු. සිංහල අකු-රෙන් මුද්‍රණය කරන විට එසේ යෙදීම යුක්ති යුක්තය යි වැටහුණු හෙයිනි.

මෙහි තැනින් තැන සුළු සුළු මුද්‍රණ දෝෂ ඇතත් ශුද්ධි පත්‍රයක් නො යොදන ලද්දේ ය. අර්ථාවබෝධයට දුෂ්කර නො වන හෙයිනි. එහෙත් මේ ග්‍රන්ථයෙහි 20 වන පිටුවෙහි **"ධම්මං චරන්තො"** යන්නට අරුත් වශයෙන් වැටී තිබෙන 'විශුචයෙහි යෙදෙන්නේ" යන්න විනිශ්චයෙහි යෙදෙන්නේ කියා ද, **"පුබ්බණ්ණං"** යන්නට අරුත් වශයෙන් වැටී තිබෙන "මුං මෑ ආදිය" යන්න වෙනුවට හැල් වී ආදීය කියා ද ශුද්ධ කරගත යුතු බව විශේෂයෙන් සැලකිය යුතුයි.

**චිරං තිට්ඨතු ලෝකස්මිං සම්මා සම්බුද්ධ සාසනං.**

---

# පාරාජික පාළි ගැටපදය.

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.**

## වේරඤ්ජ කණ්ඩ වණ්ණනා.

### 1 පිට.

**නළේරු පුචිමන්ද මූලේ**- නළේරු නම් (යක්ෂයා විසින් අධිගෘහීත වූ) කොසඹ රුක්මුල, **න සම්පජ්ජති එව**- නුපුදුපු ම ය.

### 2 පිට.

**මුද්ධාපි තස්ස විපතෙය්‍ය**- ඔහුගේ මස්තකය ද (ග්‍රීවායෙන් සිඳී වහා ම බිම) වැටෙන්නේ ය.

**අරසරූපො**- අරස ජාතිකයෙකි, රස ස්වභාව නැත්තෙකි. (අඤ්ජලිකර්මාදිය ලෝකයෙහි සාමග්‍රීරස නම් වේ. එය සර්වඥයන් වහන්සේ කෙරෙහි නැති බව හඟිමින් වේරඤ්ජ බ්‍රාහ්මණ තෙමේ මෙ සේ කී ය.) **පරියායො**- කාරණයක්, **උච්ඡින්නමූලා**- සිදිනලද තෘෂ්ණා අවිද්‍යාමය මූල් ඇත්තා හ, **තාලාවත්ථුකතා**- තාලවස්තු කෘතය හ (යම්සේ තාලවෘක්ෂයක් මුල් සහිතව උදුරා දමන ලද්දේ නැවත ඉපදීමක් නො වේ ද එ සේ කරන ලද්දෝ ය.) නොහොත් මස්තකයෙහි සිදින ලද තල්කඳක් මෙන් නැවත නො වැඩෙන ස්වභාවයට පත් කරන ලද්දෝ ය යනු භාව යි.

**අනභාවකතා**- අනභාව කෘතය හ. නැවත ඒ ධර්මයන්ගේ ඉපදීමක් නො වේ ද එ පරිද්දෙන් කරන ලද්දෝය යනු භාව යි අටුවාවෙහි 'අනු අභාවං කතා' යි පදච්ඡේදය කරන ලදී. 'අනභාවගතා' යි ද පාඨාන්තරයෙකි, "ආයතිං අනුප්පාද ධම්මා" යන පදය දෙස බලන විටත්, වෛයාකරණ ලක්ෂණ අනුව සලකන විටත් "අනභාවකතා" යන පාඨයට වඩා "අනභාවංගතා" යන පාඨය මැනවැයි සිතේ. **අනුප්පාද ධම්මා**- නො ඉපදෙන ස්වභාව ඇත්තා හ. **නිබ්භොගො**- භෝග රහිතයෙකි. (අභිවාදන කර්මාදිය ලෝකයෙහි සාමග්‍රී පරිභෝගය යි සිතා එය සර්වඥයන් වහන්සේ කෙරෙහි නැති බව පවසනු පිණිස මෙ සේ කී ය.) **අකිරියවාදො**- ක්‍රියාවාදී නො වන්නෙකි; (මනුෂ්‍යයෝ වයෝවෘද්ධයන්ට අභිවාද-

නාදී කුල සමුදාචාර කර්මය කෙරෙත් ද සර්වඥයන් වහන්සේ ඒ එය නො කිරීම දක්මින් මෙය කීය.) **උච්ඡෙදවාදො**- උච්ඡෙදවාදී ය; (අභිවාදනාදී යහපත් කටයුතු සර්වඥයන් වහන්සේ කෙරෙති නො දක්මින් මොහු කරා පැමිණ ලෝක ප්‍රවේණිය නසී ය යි සිතා මෙ සේ කී ය.)

3 පිට.

**ජිගුච්ඡී**- පිළිකුල් කරන්නෙක් ය; ( අභිවාදනාදී කුලාචාර කර්මයන්හට පිළිකුල් කරත්ය යි සිතා මෙ සේ කී ය.)

**සම්පත්තියා**- පැමිණීමට. **වෙනයිකො**- විනාශ කරන්නෙක් ය; නොහොත් හික්මවිය යුත්තෙක. ( අභිවාදනාදී සාමී සර්වඥයන් වහන්සේ කෙරෙහි නො දක්මින් ඒ ලොකජ්‍යෙෂ්ඨ කර්මය විනාශ කරන්නේ ය යනු සිතා මෙ සේ කී ය. නොහොත් සාමීචි කර්මාදිය නො කරන හෙයින් හික්මවිය යුත්තේ ය.) **තපස්සී**- තැවීම කරන්නෙක් ය; ( අභිවාදනාදිය කරන්නෝ වයෝවෘද්ධයන් සතුටු කරවත්. එ සේ නො කරන්නෝ ඔවුන් දෙම්නසට තැවීමට පමුණුවත්. සර්වඥයන් වහන්සේ ද අභිවාදනාදිය නො කරන හෙයින් ලෝකයා තවන පුද්ගලයෙකැ යි සිතා මෙ සේ කීය.) **තපනීයො**- තැවීම කටයුතු. **අපගබ්භො**- ගර්භ සම්පත්තිය නැත්තෙක් ය; (අභිවාදනාදී කර්මය දෙව්ලොව ඉපදීමට හෙතුවන බව සිතා එය සර්වඥයන් වහන්සේට නැත්තේ ය යි හඟිමින් මෙ සේ කී ය.)

4 පිට.

**අණ්ඩානි**- බිජුවට. **අභිසේතානි**- මත්තෙහි ශයනය කරන ලද්දා හු. **පරිසෙදිතානි**- මනා කොට උණුසුම් ගන්වන ලද්දා හු, හෙවත් කලින් කල සෑතු ගන්වන ලද්දා හු. **සම්මා පරිභාවිතානි**- මනාකොට වඩන ලද්දා හු; හෙවත් කුකුළ් ගඳ ගස්වන ලද්දා හු. **අස්සු**- වන්න හු ද. **කුක්කුටච්ඡාපකානං**- කුකුළ් පැටවුන් අතරෙන්. **පාදනඛසිඛාය වා**- පා නිය සිළින් හෝ. **මුඛතුණ්ඩකේන වා**- මුව තුඩින් හෝ. **අණ්ඩකෝසං**- බීජ කෝෂ ය. **පදාලෙත්වා**- පලාගෙන. **සොත්ථිනා**- සුව සේ. **අභිනිබ්භිජ්ජෙය්‍යා**- බිඳගෙන නික්මෙන්නේ නම්. **සෝ කින්ති වචනීයෝ අයා**-ගේ කවරෙක් දැ යි කියයුතු වන්නේ ද? **ජ්‍යෙෂ්ඨයා** කියා හෝ **කනිෂ්ඨයා** කියා හෝ කියයුතු වන්නේ ද යනු භාව යි, **අවිජ්ජාගතාය**- අවිද්‍යාවෙහි ඇතුලත් වූ. **අණ්ඩභූතාය**- අවිද්‍යා නැමැති අණ්ඩයෙහි හටගත්තා වූ. **පරියොනද්ධාය**- ඒ අවිද්‍යාණ්ඩ කෝෂයෙන් හාත්පස වෙළුණා වූ. (=බැඳුණාවූ) **පජාය**- සත්ව වර්ගයා කෙරෙහි. **ඒකො'ව**- අසහාය පුද්ගලයා ම වෙමි.

අසල්ලීනං- නො හැකුළුණේ වී ය. අපම්මුට්ඨා- නො මුළා වී ය. පස්සද්ධෝ- බර ඇරුණේ ය. අසාරද්ධෝ- පහව ගිය දරථ ඇත්තේ ය. ඒකග්ගං- එකඟ වී ය. අජ්ඣත්තං- අධ්‍යාත්මයෙහි. සම්පසාදනං- පැහැදීම් සඞ්ඛ්‍යාත ශ්‍රද්ධාව ඇති කරන. පවිසං වේදේසිං- විත්දෙමි.

සමාහිතේ- (චතුර්ථධ්‍යාන සමාධියෙන්) සමාධිගත වූ කල්හි. පරිසුද්ධේ- (උපේක්‍ෂා ස්මෘති පාරිශුද්ධියෙන්) පිරිසුදු වූ කල්හි. පරියෝදාතේ- (පිරිසුදු හෙයින් ම) ප්‍රභාස්වර වූ කල්හි. අනඞ්ගණේ- සුඛාදී ප්‍රත්‍යයන් නැසීමෙන් පහ වූ රාගාදීන් ඇති හෙයින්) අඞ්ගණ රහිත වූ කල්හි. මුදුභූතේ- (වශයෙහි පවත්නා මෙන් සුභාවිත හෙයින්) මෘදු වූ කල්හි. ආනෙඤ්ජප්පත්තේ- (ශ්‍රද්ධාදීන් හාත්පස අල්වා ගත් හෙයින්) අචඤ්චල වූ කල්හි. කම්මනියේ ඨිතේ- උත්පන්න කර්මයක් මෙන් කර්මක්‍ෂම ව සිටි කල්හි. අභිනින්නාමේසිං- නැමූයෙමි. අනේකවිහිතං- නානා ප්‍රකාර වූ. ඒකම්පිජාතිං- එක් ජාතියක් ද. අනේකේපි සංවට්ටකප්පේ- නොයෙක් සංවර්ත කල්පයන් ද හෙවත් ප්‍රලය කාලයන් ද; අනේකේපි විවට්ටකප්පේ- නොයෙක් විවර්ත කල්පයන් ද; හෙවත් උදය කාලයන් ද; අනේකේපි සංවට්ටවිවට්ටකප්පේ- නොයෙක් සංවර්ත විවර්ත කල්පයන් ද. අමුත්‍ර- අසුවල් තැන.

5 පිට.

සාකාරං- වර්ණසංස්ථානාදි වශයෙන් ආකාර සහිත වූ. සඋද්දේසං- නාම ගොත්‍ර වශයෙන් උදෙසීම් සහිත වූ. පඨමා විජ්ජා- පළමු වන විද්‍යාව; (පූර්වේ නිවාසානුස්මෘතිඥානය) පහිතත්තස්ස- කාය ජීවිතයෙහි නිරපේක්‍ෂ ව නිර්වාණ කෙරෙහි මෙහෙයන ලද සිත් ඇතිව. යථා තං- එය යම් සේ වේ ද. චුතූපපාතඤාණාය- චුති උත්පත්ති දෙක දක්නා නුවණ පිණිස. සුවණ්ණේ- මනා වර්ණ ඇති. යථාකම්මූපගේ- කර්මය පරිදි පැමිණි. දුතියා විජ්ජා- (චුතූපපාත ඤාණ නම් වූ) දෙවන විද්‍යාව. ආසවානං ඛය ඤාණාය- අර්හත්මාර්ගඥානය පිණිස. අබ්භඤ්ඤාසිං- දත්තෙමි.

6 පිට.

විමුච්චිත්ථ- මිදුණේ ය. විමුත්තස්මිං- මිදුණු කල්හි. බ්‍රහ්මචරියං- මාර්ග බ්‍රහ්මචර්යාව. කරණීයං- (චතුරාර්ය සත්‍යයන්හි සතර මාර්ගයෙන් පරිඥා, ප්‍රහාණ, ප්‍රත්‍යක්‍ෂ ක්‍රියා, භාවනා වශයෙන්

ෂොඩශ විධ ) කෘත්‍යය **අපරං**- අනෙකක්. **තතියා විජ්ජා**- ( අග්නිමාංගීඥත සඞ්ඛ්‍යාත ) තෘතීය විද්‍යාව.

**පාණුපේක්ඛං**- දිවිහිම් කොට. **වේරඤ්ජාය** - වේරඤ්ජා නගරයෙහි. **දුබ්භික්ඛා**- දුර්ලභ භික්‍ෂා ඇත්තී ය; **ද්වීහිතිකා**- දෙපරිදි වූ සිත් පැවතුම් ඇත්තීය. ජීවත් වීමට හැකි වන්නමු ද නො හැකි වන්නමු ද නොහොත් භික්‍ෂං පිණිස හැසිරෙන්නමෝ කිසිවක් ලබන්නෙමු ද නො ලබන්නෙමු ද යන ද්විප්‍රකාර චිත්ත ප්‍රවෘත්ති ඇත්තී ය යනු භාව යි. **සේතට්ඨිකා**- ( මුළු දවසෙහිදු ඇවිද කිසිවක් නො ලැබ මළා වූ දිළිඳු මිනිසුන් ගේ හිම්හතු වැනි ) සුදු ඇටවලින් ඒ ඒ ස්ථාන ගැවසී ගත්තේ ය. "**සේතට්ටිකා**" යි ද පාඨයකි. ශ්වේතරෝගය මෙහි ඇත්තු යි සේතට්ටිකා නමු. වේරඤ්ජාවෙහි ශස්‍ය පූදින කාලයෙහි සේතක රෝගයෙන් පෙළීමෙන් සිඳුණු කිරි ඇතිව, තෝ හටගත් කරල් ඇතිව, සුදුපාට හැල් කරල්, යව ගෝධූම කරල් නික්මෙයි එ හෙයින් "සේතට්ටිකා" නම් වී ය. **සලාකාවුත්තා**- ( වපුරන කාලයෙහි මනාකොට වපුළ ශස්‍යය ද ) ඉරටු මෙන් පැවතුම් ඇත්තී ය. සලාකායෙන් (= තුංඩුවෙන්) එහි ජීවිකාව කරත් නු යි හෝ 'සලාකාවුත්තා' නමු. එනම් එහි ධාන්‍ය විකුණන්නවුන් ගේ සමීපයට ධාන්‍ය ගෙන යන්නවුන් ඇමිණී හල්හි දුර්වල මනුෂ්‍ය-යන් මැඩ පවත්වා ප්‍රබල මනුෂ්‍යයෝ ධාන්‍ය මිල දී ගෙන යත්. දුර්වල මනුෂ්‍යයෝ මහත් සේ හඬ නගත්. ධාන්‍ය විකුණන්නෝ සියල්ලන්ට ම සඞ්ග්‍රහ කරන්නෙමු යි ධාන්‍ය මනින ස්ථානයෙහි ධාන්‍ය මාපකයෙකු හිඳුවා එක් පසෙක මුදල් භාරගන්නෙකු හිඳ වූහ. ධාන්‍ය කැමැත්තෝ පළමුකොට ඔහු සමීපයට යති. හේ අෘ පිළිවෙළින් මිලගෙන මෙනම් ඇත්තහුට මෙ පමණ දියයුතු ය යි සලාකාවක් (=තුංඩුවක්) දෙයි. ඔව්හු එය ගෙන ධාන්‍ය මාපකයා ගේ සමීපයට ගොස් දුන් පිළිවෙළින් ධාන්‍ය ගනිත්.

**පග්ගහෙන උඤ්ඡෙන** - පාත්‍රයෙන් පිඬු සිඟීමෙන් **යාපේතුං**- යැපෙන්ට. **න සුකරා**- නො හැකිවන්නී ය. **උත්තරාපථකා**- උත්තරාපථවාසී වූ හෝ උත්තරාපථයෙන් පැමිණියා වූ **වස්සාවාසං**- වර්ෂා සමයයෙහි විසීමට. **අස්ස මණ්ඩලිකාසු**- අශ්ව වෙළඳුන් ගේ වාසස්ථානයන්හි **පත්ථ පත්ථ පුලකං**- නැළියක් නැළියක් පමණ දහවිං ඉවත් කළ යව සහල්. **පඤ්ඤත්තං හෝති**- (නිති බත් වශයෙන් දීමට) පනවන ලද්දේ වෙයි **ආරාමං හරිත්වා**- ආරාමයට ගෙනවුත්. **උදුක්ඛලේ**- වංගෙඩියෙහි. **කොට්ටෙත්වා**- කොටා. **පිංසිත්වා**- අඹරා. **උපනාමෙති**- එළව යි. **උදුක්ඛල සද්දං**- වංගෙඩි හඬ:

### 7 පිට.

**අත්ථසංහිතේ**- අර්ථ සහිත වචනයෙහි. **අත්ථසංහිතං**- අර්ථ නිශ්‍රිතව. **සේතුඝාතෝ**- මාර්ග විනාශය. **භික්ඛූ**- භික්ෂූන් අතින්. **විජිතං**- (දුර්භික්ෂය) දිනන ලදී. **සාලිමංසෝදනං**- හැල් සහලින් කළ කැඳ කැවිලි හා මාංසෝදනයට. **අතිමඤ්ඤිස්සසි**- පරිභව කරන්නේ ය. **සම්පන්නං**- මධුරය. (=සාදු රසය) **ඛුද්දමධුං**- කුඩා මැස්සන් හෝ දඬුවෙල්බෑ මැස්සන් විසින් කරන ලද මීය. **අනීලකං**- මැස්සන්රහිත. **අස්සාදං**- රසවත්ය. **සාධු**- මෙහි ආයාචනයෙහි වැටේ. **පරිවත්තෙය්‍යාමං**- පෘථිවිය පෙරළන්නෙමි. **පප්පටකෝජං**- පෘථිවිමණ්ඩය. (= පෘථිවියෙහි ඕජස.) **පඨවිනිස්සිතා**- පෘථිවිය ඇසුරු කළා වූ **පාණිං**- අතක්. **අභිනිම්මිනිස්සාමි**- මවන් නෙමි. **සඞ්කමෙස්සාමි**- ප්‍රවේශ කරන් නෙමි. **මා රුච්චි**- රුචි නො වේවා. **විපල්ලාසම්පි**- විපරීත ග්‍රහණ යනු දු **පටිසල්ලීනස්ස**- එකී භාවගත වූ. **බ්‍රහ්මචරියං**- ශාසනය. **පටිසල්ලානා**- ඵල සමාපත්තියෙන්.

### 8 පිට.

**එළකෝ**- පුවරුවක. **විකිරති**- විසුරුව යි. **විද්ධංසේති**- තුබුණු තැනින් පහ කරයි. **භිංසනකෝ**- භයානක වූ. **අනුපාදය**- නො ගෙන. **භිංසනකතස්මිං හෝති**- භයජනක භාවය වෙයි "**භිංසනකතස්මිං**" යන තැන ප්‍රථමාර්ථයෙහි සප්තමිය යි.

### 9 පිට.

**අද්ධනියං**- දීර්ඝකාලික වූයේ. **ආගමෙති**- ඉවසව; බලාපොරොත්තු වෙව. **ආසවට්ඨානියා**- ආශ්‍රවයන්ට කරුණු වූ. **රත්තඤ්ඤූ මහත්තං**- චිරරාත්‍රඥ භික්ෂූන් ගෙන් මහත් බවට; චිර ප්‍රව්‍රජිතයන් ගෙන් මහත් බවට.

### 10 පිට.

**වේපුල්ල මහත්තං**- විපුලත්වයෙන් මහත් බවට; නොහොත් සඞ්ඝයා ගේ ස්ථවිර, මධ්‍යම, නවක, වශයෙන් මහත් බවට. **ලාභග්ග මහත්තං**- ලාභාග්‍ර මහත්වයට; නොහොත් ලාභයෙන් අග්‍ර වූ මහත් බවට. **නිරබ්බුදෝ**- අර්බුද විරහිත ය; සොරු "අර්බුද" නම් වෙත්. අශ්‍රමණ ව ශ්‍රමණයම් හ යි ප්‍රතිඥා කරන මහණ සොරුන් නැති හෙයින් "**නිරබ්බුද**" නම් වේ යනු මෙහි භාව යි. **අපගතකාළකෝ**- පහව ගිය දුශ්ශීල සඞ්ඛ්‍යාත කාළකයන් (කළු වන්) ඇත්තේ ය. **සාරේ**- ශීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්තිඥාන දර්ශන, යන සාරයෙහි. **අවිනිපාත ධම්මෝ**- අපායාදියෙහි නො

වැටීම් සවභාව ඇත්තේ ය. **ආචිණ්ණං**- පුරුදු කරන ලද්දේ ය. **අනපලෝකෙත්වා**- නො විචාරා. **සච්ඡා සමණෙන**- පසුව යන ශ්‍රමණයා වූ. **තෝ අසනානං**- නැත්තේ නො වෙයි. **නෝපි අදිනුකාමිනානා**- නො දෙනු කැමති බඩක් ද නො වෙයි. **තං**- ඒ දීමනාව. **එක**- මේ ගෘහවාසයෙහි. **කුතො**- කොයින්. **ලබභා**- ලැබිය හැකි ද? නො ලැබිය හැකි ය.

## 11 පිට.

**සන්දසෙසත්වා**- දිට්ඨධම්මික සම්පරායික අර්ථයන් දක්වා. **සමාදපෙසත්වා**- කුසල් දහම්හි සමාදන් කරවා. **සමුත්තෙජෙත්වා**- උත්සාහවත් කරවා. **සම්පහංසෙත්වා**- සතුටු කරවා. **සමසවා-රෙත්වා**- කම් නැතැයි හසන සංඥවෙන් හා මුඛ සංඥවෙන් ද ප්‍රතික්ෂේප කරවා. **ඔණිත පත්ත පාණිං**- පාත්‍රයෙන් ඉවත් කළ අත් ඇති. **තිච්චරෙන අචජාදේසි**- තුන් සිවුරු දුන්නේ ය. **අනුසගම්ම**- නො ගොස්. **පයාග පතිට්ඨානං**- ප්‍රයාග තීර්ථයට. **උත්තරිත්වා**- එතරව. **නදීවසහි**- එහි ගියේ ය.

**නිට්ඨිතා වෙරඤ්ජ කණ්ඩ වණ්ණනා.**

---

# සුදින්න භාණවාරං.

---

## 11 පිට.

**කලන්ද ගාමෝ**- කලන්දක නම් ගම; ලෙහෙණුන් ගේ වශයෙන් ලැබුණු නමකි. **කලන්ද පුත්තෝ**- කලන්ද සිටු පුත් තෙමේ.

## 12 පිට.

**සඛ ලිඛිතං**- ලියන ලද (= ඔප දමන ලද) සකක් සේ. දෙව්නා ලද සකක් සේ යන අර්ථය ද අටුවාවෙහි එන්නේ ය. **ඔහාරෙත්වා**- කපාදමා. **තිරෙත්වා**- තිඝා කොට. **සුඛෙධිතෝ**- සුවයෙන් වැඩුණේ. **සුඛ පරිහතෝ**- සුවයෙන් පෝෂණය කරන ලද්දේ. **අකාමකා**- නො කැමැත්තෝ ව. **විනා භවිස්සාම**- වෙන් වන්නෙමු.

## 13 පිට

**අනානන රකිතාය**- (කිසියම් ඇතිරියකින් නො අතුරන ලද හෙයින්) අතරක් නැති. **පරිචාරේහි**- නෘත්‍ය - ගීත - වාදිත යන්ගෙන් ඉන්ද්‍රියයන් හසුරුව. **අභි රමස්සු**- අභිරමණය කරව.

## 14 පිට.

**කා අඤ්ඤා ගති**- අනෙක් කවර ගතියක් ද; ප්‍රතිෂ්ඨාවක් ද. **පච්චාගමිස්සති**- පෙරළා එන්නේ ය. **පරිපුඤ්ඡෙත්වා**- පිසිමින් **බලං ගාහෙත්වා**- කාය බලය උපදවා.

## 15 පිට.

**අලත්ථ**- ලැබුවේ ය. **අචිරූපසම්පන්නො**- උපසපන් නොබෝකල් ඇත්තේ. **ධුතගුණෙ**- කෙලෙශයන් කම්පා කරන ගුණයන්. **සපදාන චාරිකො**- ගෙපිළිවෙළින් පිඬු සිඟා යන සුලු වූයේ. **පහූත විත්තූපකරණා**- බෝහෝ ප්‍රීති ප්‍රමෝද්‍යය වඩන උපකරණ ඇත්තා හු. **ලච්ඡන්ති**- ලබත්. **සංහාරෙත්වා**- තැන්පත් කොට. **සට්ඨිමත්තෙහි ථාලි පාකෙහි**- සැටක් පමණ සැළිබත්. **භත්තාභිහාරං**- අභිහරණය කටයුතු භොජනය කොට. **අභි හරිංසු**- අභි මුඛයට ගෙන ගිය හ. **විස්සජ්ජෙත්වා**- පරිත්‍යාග කොට. **ඤාතිදාසී**- නෑයන් ගේ දාසියක් තොමෝ. **ආභිදොසිකං**- එක රැයක් ඉක්මී කුණු වූ (=පිළුණු වූ) **කුම්මාසං**- යව කොමු පිඩුවක්. **ඡඩ්ඩෙතුකාමා**- ඉවත දමනු කැමැත්තී. **සචෙ ඡඩ්ඩනීය ධම්මා**- ඉදින් ඉවත දැමිය යුතු ස්වභාව ඇත්තේ නම්. **ආකිර**- දමව. **සරස්සච**- ස්වරයා ගේ ද. **යග්ඝෙ**- ආරෝචනාර්ථ නිපාතයෙකි. **ජෙ**- ආමන්ත්‍රණ නිපාතයෙකි. එදෙස ජනයාහට "**ජෙ**" යයි ආලපනය කරත්.

## 16 පිට.

**කුඩ්ඩ මූලං**- භිත්ති මූලයක්. **කම්මන්තා**- කර්මාන්තයෙන් ඉවත්ව. **අත්ථි**- විද්‍යමානාර්ථ නිපාතයෙකි. **නාම**- පුච්ඡනාර්ථයෙහි හා මඤ්ඤනාර්ථයෙහි ද නිපාතයෙකි. **අත්ථි නාම**- අප ගේ ධනය ඇත්තේ නො වේද. නොහොත් **අත්ථි නාම**- අප ගේ ජීවිතය ඇත්තේ නොවේ ද. නොහොත් **අත්ථි නාම**- ඔබ ගේ අභ්‍යන්තරයෙහි ශාසනය නිසා ලත් ශ්‍රමණ ගුණයන් ඇතැයි හඟිමි. **තාත සුදින්න!**- පුත්‍ර සුදින්නය! **ආභිදොසිකං**- පිළුණු වූ. **කුම්මාසං පරිභුඤ්ජිස්සසි**- කොමු පිඩු පරිභොග කරන්නෙහි ද? **තතො අයං**- එයින් මෙය. **බාහායං**- අතින් ගෙන. **හරිතේන**- පලාවන් වූ. **පුඨවිං**- පොළොව. **ඔපුඤ්ජාපෙත්වා**- උපලිම්පනය කරවා. (=පිසවා) **දෙව පුඤ්ජෙ**- ගොඩවල් දෙකක්. **තාවමහන්තා**- එ පමණ මහත්. **ඔරතො**- මොබ. **පාරතො**- ඔබ. **කිලඤ්ජෙහි**- කලාල් වලින්. **පටිච්ඡාදාපෙත්වා**= වස්වා. **තිරෝකරණීයං පරික්ඛිපිත්වා**- තිරයෙන් වට්කොට හෝ තිර යක් වට කොට. **පුරාණ දුතියිකං**- පැරැණි ( ගිහි කාලයෙහි )

හාසීංච. **මාතු මත්තිකං**- මව ගේ මව ගෙන් ලැබුණු ධනය යි නොහොත් **මාතු**- මව ගේ ධනය යි. (එද) **මත්තිකං**- මව සතු ය. **ඉත්ථිකාය ඉත්ථිධනං**- ස්ත්‍රිය ගේ ස්ත්‍රී පරිභෝගය පිණිස වුවමනා නහාණීය චූර්ණාදිය ගැනීම පිණිස ලැබුණු ස්ත්‍රී ධනය යි **පෙත්තිකං**- පියා සන්තක ධනය යි. **ලබ්භා**- ලැබිය යුත්තා හ. **හීනාය ආවත්තිත්වා**- ගිහි බවට පෙරළී.

## 17 පිට.

**න උස්සහාමි**- නො හැකි වෙමි. **නාතිකඩ්ඪෙය්‍යාසි**- නො කිපෙන්නෙහි නම්. **හිරඤ්ඤසුවණ්ණස්ස**- හිරණ්‍ය සුවර්ණවලින්. **නිබ්බාහාපෙත්වා**- පමුණුවා. **ඕසාදේහි**- ගිල්වව. **තතෝ නිදානං**- ඒ වස්තුව හේතු කොට ගෙන. **ඡම්භිතත්තං**- තැති ගැනීමක්. **පාදේසු**- පාදයන්. **සමුදාචරති**- ව්‍යවහාර කරයි. **මුච්ඡිතා**- මුසපත් වූවා. **නෝ මා විහේඨයිත්ථ**- අප වෙහෙස නො කරව.

## 18 පිට.

**බීජකම්පි**- කුලවංශ බීජක වූ පුත්‍රයකු දු. **සාපතෙය්‍යං**- වස්තුව. **මා අතිහරාපේසුං**- නො පමුණුවත්වා. **උතුනිහෝසි**- ඔසප් වන්නී වෙහි ද. **පුප්ඵං**- ඍතුලෝහිතය. **පුප්ඵං සා, පුප්ඵං අස්සා**- සුගම ය. **අනාදීනව දස්සාවී**- ආදීනව නො දක්නාසුළුවූයේ. **අභිවිඤ්ඤාපේසි**- පැවැත් වීය.

## 19 පිට.

**සද්දං අනුස්සාවේසුං**- ශබ්දය ඇස් වූ හ **නිරබ්බුදෝ**- අර්බුද රහිතවූ. **නිරාදීනවෝ**- ආදීනව රහිතවූ. **පරිපාකං**- මුහු කිරීමට. **අත්වාය**- පැමිණ. **සච්ඡාකංසු**- ප්‍රත්‍යක්ෂ කළා හු ය, **කුසාකුච්චං**- කුකුසක්. **විප්පටිසාරෝ**- විපිළිසර බවක්. **අහුජ්ව**- වූයේ ම ය. **වත**- ඒකාන්තයෙන්. **මේ**- මට. **අලාභා**- අලාභයකි. **මේ**- මට. **වත**- ඒකාන්තයෙන්. **න ලාභා**- මා විසින් ලබන ලද ප්‍රව්‍රජ්‍යාව හා ශරණාගමන ශික්ෂා සමාදනාදී ගුණයෝ වෙත් ද ඒ ලාභයෝ ද නැත්තා හ. **වත**- ඒකාන්තයෙන්. **මේ**- මා විසින්. **දුල්ලද්ධං**- ලැබුවා වූ ද මේ ශාසනය නපුරු කොට ලබන ලදී. **වත**- ඒකාන්තයෙන් **මේ**- මා විසින්. **න සුලද්ධං**- අනෙක් කුල පුත්‍රයන් මෙන් මනාව නො ලබන ලදී. **බ්‍රහ්මචරියං**- ශික්ෂාත්‍රය සඞ්ගෘහිත වූ මාර්ග බ්‍රහ්ම චර්‍යාව **උප්පණ්ඩුප්පණ්ඩුකජාතෝ**- හටගත් පඬුවන් පැහැ ඇත්තේ. **ධමනි සන්ථත ගත්තෝ**- නහර වැලින් ගැවසුණු සිරුරු ඇත්තේ **අන්තෝ මනෝ**- (අනුශෝචන වශයෙන්) අභ්‍යන්තරයෙහි ම පිහිටි සිත් ඇත්තේ.

**ලීන මනෝ**- හැකුළුණු සිත් ඇත්තේ. **දුම්මනෝ**- දෙව්මයෙන් දූෂිත වූ සිත් ඇත්තේ. (හෝ) දොම්නසින් මඩනා ලද හෙයින් විරූප වූ සිත් ඇත්තේ. **පජ්ඣායසි**- ඒ ඒ දෙය සිතී. **පීණින්ද්‍රියෝ**- පිණාගිය ඉඳුරන් ඇත්තේ. **විප්පසන්නා ඡවි වණ්ණෝ**- විප්‍රසන්න වූ ඡවි වර්ණය ඇත්තේ. **සෝ දානි ත්වං**- ඒ ඔබ වනාහී "දානි" යනු මෙහි නිපාත මාත්‍රයකි. **එතරහි**- දැන් මේ කාලයෙහි: **කචච්නු**- කුමක් නිසා. **අනභිරතෝ**- උකටලීත වූයේ. **මේ කතං පාපකම්මං අත්ථි**- මා විසින් කරන ලද පාප කර්මයක් ඇත.

## 20 පිට.

**අනේක පරියායේන**- නොයෙක් ක්‍රමයෙන් **විරාගාය**- විරාගය පිණිස. **නෝ සරාගාය**- රාගයෙන් නො ඇලීම පිණිස. **විසංයෝගාය**- කෙලෙසයන් ගෙන් වෙන්වීම පිණිස. **අනුපාදානාය**- තෘෂ්ණා දෘෂ්ටීන් නො ගැනීම පිණිස. **තත්‍ථ නාම ත්වං**- එහි ලා ඔබ. **රාග විරාගාය**- එයට පැමිණ රාගයා ගේ විරාගය වන හෙයින් "රාග විරාග" නම් වූ නිර්වාණය පිණිස. **මදනිම්මදනාය**- එයට පැමිණ මාන මදාදීන් නැසීම වන හෙයින් "මද නිම්මදන" නම් වූ නිර්වාණය පිණිස **පිපාස විනයාය**- එයට පැමිණ කාම පිපාසාවන් සන්සිඳෙන හෙයින් "පිපාස විනය" නම් වූ නිර්වාණය පිණිස. **ආලය සමුග්ඝාතාය**- එයට පැමිණ පඤ්ච කාම ගුණාලයයන් නැසීම වන හෙයින් "ආලය සමුග්ඝාත" නම් වූ නිර්වාණය පිණිස. **වට්ටුපච්ඡේදාය**- එයට පැමිණ ත්‍රෛභූමික වෘත්තය සන්සිඳෙන හෙයින් "වට්ටුපච්ඡේද" නම් වූ නිර්වාණය පිණිස.

## 21 පිට.

**අඞ්ගාරකාසුයා**- අඟුරු වලක. **සක්ඛිතතං**- දමන ලද්දේ නම්. **වරං**- උතුම්. **සජෝතිභූතාය**- ප්‍රභා සහිත වූ. **සම්පජ්ජලිතාය**- හාත්පසින් බබලන්නා වූ. **අසද්ධම්මං**- නීච ජනයන් ගේ ධර්මය. **ගාම ධම්මං**- ගම් වැසි මිනිසුන් ගේ ධර්මය. **වසල ධම්මං**- හීන පුරුෂයන් ගේ ධර්මය. **ඔදකන්තිකං**- උදක සෘත්‍යය අවසාන කොට ඇත්තා වූ. **රහස්සං**- රහසි ගතව උපදින්නා වූ. **ද්වයං ද්වය සමාපත්තිං**- දෙදෙනෙකු විසින් කෙරෙන අඹුසැමියන්ගේ ඒකයෝග සඞ්ඛ්‍යාත මෛථුන සේවනය. **ආදිකත්තා**- ආදි කර්තෘ වූයෙහි ය. **පුබ්බඞ්ගමෝ**- පූර්වාඞ්ගම වූයෙහි ය. **දුග්ගරතාය**- දුහරතා සඞ්ඛ්‍යාත අසංවරයා ගේ. **දුප්පෝසතාය**-

දුප්පොසතා සඞ්ඛ්‍යාත අසංවරයා ගේ. **මහිච්ඡතාය**- මහිච්ඡතා සඞ්ඛ්‍යාත අසංවරයා ගේ. **අසන්තුට්ඨිතාය**- අසන්තුට්ඨිතා සඞ්ඛ්‍යාත අසංවරයා ගේ. **සඞ්ගණිකාය**- ක්ලේශ සඞ්ගණිකා, ගණ සඞ්ගණිකා, සඞ්ඛ්‍යාත අසංවරයා ගේ. **කොසජ්ජස්ස**- කුසීත බව සඞ්ඛ්‍යාත අසංවරයා ගේ. මෙහි කාරණයෙහි කාර්‍යෝපචාර වශයෙන් දුභරතාදී ශබ්දයන් ගෙන් දුභරතාදීන්ට කරුණු වූ අසංවරය ම කියන ලදී.

**සුභරතාය**- සුභරතා සඞ්ඛ්‍යාත සංවරයා ගේ **සල්ලෙඛස්ස**- ක්ලේශ සංලිඛන සඞ්ඛ්‍යාත සංවරයා ගේ. **අපචයස්ස**- ක්ලේශාපචය (=නැසීම) සඞ්ඛ්‍යාත සංවරයා ගේ. **ධුතස්ස**- ක්ලේශ කම්පන සඞ්ඛ්‍යාත සංවරයා ගේ. මෙහි ද මේ සියලු පදයන් ගෙන් පෙර මෙන් ම සුභරතාදීන්ට කරුණු වූ සංවරය ම කියන ලදී.

**සඞ්ඝසුට්ඨුතාය**- සඞ්ඝයා ගේ යහපත් බව පිණිස **ඵාසුතාය**- සුඛ විහරණය පිණිස. **දුම්මඞ්කූනං පුග්ගලානං**- දුශ්ශීල පුද්ගලයන්ට. **පෙසලානං**- ප්‍රිය ශීලී වූ. **දිට්ඨධම්මිකානං ආසවානං**- ඉහාත්මයෙහි පැමිණිය යුතු හස්තච්ඡේද පාදච්ඡේද ආදී දුඃඛ විශෙෂයන් ගේ. **සම්පරායිකානං ආසවානං**- පරලොව හි දී පැමිණිය යුතු පාපමූලික දුඃඛ විශෙෂයන් ගේ. **විනයානුග්ගහාය**- සංවර, පහාන, සමථ, පඤ්ඤත්ති, යන විනයානුග්‍රහය පිණිස **දසඅත්ථවසෙ පටිච්ච**- ශික්ෂාපද පැනවීම හේතු කොට වන ආනිසංස විශේෂයන් දසයක් සලකා යි කී නියායි.

---

## මක්කටී වත්ථු.

---

### 22 පිට.

**ආමිසෙන**- කැද බත් ආදී ආමිසයෙන්. **උපලාපෙත්වා**- පොළඹවා. **ආහිණ්ඩන්තා**- ඇවිදින්නා හු. **කටිං**- කටිය ඉහ. **පෙච්ඡං**- නගුට. **ඔඩ්ඩි**- අභිමුඛ කොට එළඹ වී ය. **නිමිත්තම්පි**- මෛථුනාභිප්‍රාය නිමිත්ත ද. **නිස්සංසයං**- නිසැක ව. **නිලීයිංසු**- සැඟවුණාහු ය. **ඒකදෙසං**- එක් කොටසක්. **නාඑව නාම හොති නනු**- ඒ ශික්ෂාපදය තිරශ්චීන ස්ත්‍රියක සමග වුවද එ සේ ම නො වන්නේ ද.

**නිට්ඨිතා මක්කටී වත්ථු.**

## 24 පිට.

**වජ්ජිපුත්තකා**- වැදූරට විසාලාවෙහි වූ කුලයන් ගේ පුත්‍ර වූ එනම් ඇති භික්ෂූහු. **යාවදත්ථං**- ඇතිතාක්. **අපච්චක්ඛාය**- ප්‍රතික්ෂේප නො කොට. **දුබ්බල්‍යං**- දුබල බව. **අනාවිකත්වා**- පහළ නො කොට. **ජුට්ඨා**- ස්පර්ශ කරන ලද්ද හු. ( = මඩන ලද් ද හු) **අනඤ්ඤගරහිනො**- අනෙකෙකුට ගර්හා නො කරන්නෝ වෙමු. **අලක්ඛිකා**- නිශ්‍රීකයෝ කාලකණ්ණියෝ. **විපස්සකා කුසලානං ධම්මානං**- කුශල ධර්මයන් බලන්නා හු සිතන්නා හු. **පුබ්බරත්තං**- රාත්‍රිය ගේ පූර්වභාගයෙහි (= ප්‍රථම යාමයෙහි) **අපරරත්තං**- රාත්‍රිය ගේ අපර භාගයෙහි ( = පශ්චිම යාමයෙහි ) **බෝධිපක්ඛියානං**- අර්හත්මාර්ග ඥානයට උපකාර වූ. **සමූහනෙය්‍ය**- සමූහනය (= අවලංගු කිරීම) කරන්නේ නම්. **ඨානං අට්ඨානං**- එය කාරණා රහිතය. **සික්ඛා සාජීව සමාපන්නො**- ( අධිශීල සඞ්ඛ්‍යාත ) ශික්ෂාවට හා ( ප්‍රඥප්ත ශික්ෂාපද සඞ්ඛ්‍යාත ) සාජීවයට පැමිණියේ. **යථායුත්තො**- යම් බඳු වූ කර්මයක යුක්ත වූ. **යථා ජච්චො**- යම් බඳු ජාති ඇත්තා වූ. **යථා සීලො**- යම් බඳු ස්වභාව ඇත්තා වූ. **යථා ගෝචරෝ**- තවකම් ගෝචරාදී වූ යම් බඳු ගෝචර ඇත්තා වූ. **භික්ඛකෝ'ති**- ලබන්නේ හෝ නො ලබන්නේ ආශිය වූ ඉල්ලීමෙන් ඉල්ලන්නේ නු යි. **භින්නපටධරෝ'ති**- අගස - එස්ස - වණ්ණ - යන තුන් අයුරින් බුන් වස්ත්‍ර දරන්නේ නු යි. **සමඤ්ඤාය**- ව්‍යවහාරයෙන්. **පටිඤ්ඤාය**- ප්‍රතිඥාවෙන්. **භද්‍රෝ**- අපාපක වූ. **සාරෝ**- ශීලාදී සාර ඇත්තා වූ.

## 25 පිට.

**අකුප්පේන** - ( වත්ථු, ඤත්ති, අනුසාවණ, සීමා, පරිස සම්පත්ති, සම්පන්න හෙයින් ) අකෝප්‍ය වූ. **ඨානාරහේන**- කාරණාර්හ වූ ශාස්ත්‍ර ශාසනාර්හ වූ. **ඤත්ති චතුත්ථේන කම්මේන**- ඤත්තිය සතර වන කොට ඇති කර්මයෙන්. **දුබ්බල්‍යාවිකම්මඤ්චෙව**- දුබල බව ප්‍රකට කිරීම ද. **සික්ඛාච අපච්චක්ඛාතා හෝති**- ශික්ෂාව ප්‍රතික්ෂේප නො කරන ලද්දී ද වෙයි. **සාමඤ්ඤා**- ශ්‍රමණ භාවයෙන්.

**අට්ටීයමානො**- පෙළෙනු ලබන්නේ. **හරායමානො**- ලජ්ජා වන්නේ. **පච්චක්ඛෙය්‍යං**- ප්‍රතික්ෂේප කරන්නේ නම්.

## 26 පිට.

**පජාපති**- බිරිඳ. **වත්ථුං**- ඉඩම. **සිප්පං**- කුම්භකාරාදී ශිල්ප. **සමනුස්සරාමි**- සිහි කරමි.

28 පිට.

**දුච්චරං**- හැසිරීමට දුෂ්කරය. **න උස්සහාමි**- උත්සාහ නො කරමි.

29 පිට.

**සුමුත්තෝ අහං**- මම මනා කොට මිදුණේ වෙමි. **බුද්ධචේ වචනානි**- බුද්ධපරියාය (= සමාන) වචනයෝ. **ඛිත්ත චිත්තෝ**- වික්ෂිප්ත වූ. **වේදනාට්ටෝ**- වේදනායෙන් පීඩිත වූයේ. **අරිය-කේන**- ආර්යයෙකු විසින්. **මිලක්ඛස්ස**- අන්ධ දමිළාදී මෙල්වඡ යෙකු ගේ. **න පටිවිජානාති**- නො දනී.

30 පිට.

**දවාය**- ඉක්මනින්. **රවාය**- ඉක්මනින්. මේ පදද්වයයෙන් ම කියැවෙනුයේ අනෙකක් කියනු කැමැත්තෙන් සහසා භණිත යෙහි දී. "සික්ඛං පච්චක්ඛාමි" ය යි කීමෙන් ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානය නො වන බවය. පුරිමය පණ්ඩිතයෙකු පිළිබඳව ද දෙවැන්න විතයෙහි අදක්ෂ වූවෙකු පිළිබඳ ව ද සහසා භණිතයට යෙදීම පමණක් වෙනසය. මේ දක්වන ලද්දේ අටුවා ටීකා, ආදියෙහි ආනෙන අර්ථය යැ. "දවාය" ක්‍රියා පිණිස, රවාය- ශබ්දය පිණිස සි අර්ථ කියන ලද්දේ නම් මැනවැයි සිතමු. "දව රව" ශබ්දයන් ගේ සහසාර්ථයක් භාෂාවෙහි නැති හෙයිනුත් "දව" ශබ්දයා ගේ ක්‍රියාර්ථයත්, "රව" ශබ්දයා ගේ ශබ්දාර්ථයත්, භාෂාවෙහි ප්‍රසිද්ධ හෙයිනුත්, තදර්ථ කථනය සර්වාතෝචිත හෙයිනුත් ය. ධර්මකාරණ යට ද සහසාර්ථයට වඩා ක්‍රියාදි අර්ථ කථනය ම ගැලපෙන්නේ ය.

**අසංවෙතු කාමෝ**- නො අස්වනු කැමැත්තේ. **අවිඤ්ඤුස්ස**- කාරණාකාරණ නො දන්නෙකු හට. **ඒකං කම්මං**- සතර වැදෑරුම් වූ ම සඞ්ඝකර්මය. සීමා පරිච්ඡින්න වූ උපෝසථ කර්මය කාමය නො ලත් භික්ෂූන් විසින් එකතුව කරන කර්මය යි. **ඒකුද්දේසෝ**- පස්වැදෑරුම් වූ පාමොක් උදෙසීම. **සමසික්ඛතා**- සමව හික්මෙන බව, පනවන ලද සියලුම ශික්ෂාපද සියලුම ලජ්ජිපුද්ගලයන් විසින් සමව හික්මිය යුතු බැවින් සම සික්ඛතා නම්. **උභතෝ බ්‍යඤ්ජනකෝ**- ස්ත්‍රී පුරුෂ නිමිත්ත ද්වයයෙන් ම යුක්ත වූ තැනැත්තේ. **පණ්ඩකෝ**- නපුංසකයා ය.

31 පිට.

**භික්ඛු පච්චත්ථිකා**- විරුද්ධාචාර භික්ෂූනු. **අභිනිසීදන්ති**- සම්ප්‍රයෝග කෙරෙත්. **සාදියති**- ඉවසයි. **පච්චත්ථං සාදියති**-

ප්‍රවිෂ්ට කාලයෙහි ඉවසයි. **සිතං සාදියති**- ස්ථානයට පැමිණිකල ඉවසයි. **උද්ධරණං සාදියති**- ඉවතට ගන්නා කල ඉවසයි, කැමතිවෙයි.

32 පිට.

**ජග්ගරන්තිං**- නිදිවර්ජිත වූ. **සුත්තං**- සුප්ත වූ, නිදිගත්. **අක්ඛායිතං**- (බලු සිවල් ආදීන් විසින් සෑමෙන්) ක්‍ෂය නො වූ නිමිති ඇති. **යේභුය්‍යේන**- බොහෝ සෙයින්. **ආපත්ති ථුල්ලච්චයස්ස**- ථුලසි ඇවැත් වේ.

33. පිට.

**සන්ථතාය**- සන්ථත වූ (=වසන ලද) අඞ්ග ජාතයෙන්, සන්ථත නම් ස්ත්‍රියක ගේ ස්ත්‍රී නිමිත්ත හෝ **වච්ච, මුඛ,** මග්ගද්වයය වස්ත්‍ර, කොළ, ඊයම්පට, ආදී යම් කිසිවකින් වෙළා හෝ ඇතුළට කිරීමෙන් හෝ වැසීම යි. පුරුෂ ව්‍යඤ්ජන, වච්ච මුඛ මාගීයන්, පිළිබඳ සන්ථතය ද මෙසේ ම ය.

36 පිට.

**රාජ පච්චත්ථිකා**- විරුද්ධ රජවරු. **චෝර පච්චත්ථිකා**- විරුද්ධ සොරු. **ධුත්ත පච්චත්ථිකා**- ස්ත්‍රී ධූර්ත, සුරා ධූර්තාදී විරුද්ධ කාරයෝ. **උප්පල ගන්ධත්ථිකා**- හෘදය උපුටන්නෝ ය. කෘෂිකර්මාදිය නො කොට මං පැහැරීම්, ගම් පැහැරීම්, ආදිය කර මින් ජීවත් වන්නෝ ය. **මග්ගේන මග්ගං පවේසේති**- ස්ත්‍රියක ගේ මාගීත්‍රයයෙන් එක්තරා මගකින් තමාගේ අඞ්ගජාතය ප්‍රවේශ කරයි, **මග්ගේන අමග්ගං පවේසේති**-මාගීයෙන් අමාගීයට ප්‍රවේශ කරයි, පස්සාවාදී මගකින් ප්‍රවේශ කොට එයට හාත්පස වූ අමාගී සඞ්ඛ්‍යාත වණයකින් නීහරණය කෙරේ නම් එය '**මග්ගේන අමග්ග පවේසනය**' යි. **අමග්ගේන මග්ගං පවේසේති**- අමාගී යෙන් මාගීයම ප්‍රවේශ කරයි, මාගී සාමන්ත වූ වණයකින් ප්‍රවේශ කොට මාගීයෙන් බැහැර කෙරේ නම් එය "**අමග්ගේන මග්ග පවේසනය**" යි. **අමග්ගේන අමග්ගං පවේසේති**- එක් වූ වණදෙකක් ඇති කල්හි එකකින් ප්‍රවේශ කර අන්‍යකෙන් නීහරණය කිරීමෙහි මෙය යෙදේ. **විප්පටි පජ්ජති**- විරුද්ධාකාර යෙන් පිළිපදියි, අසද්ධර්මයෙහි යෙදෙයි. **උභෝ නාසේ තබ්බා**- දෙදෙනාම ශ්‍රමණ ලිඞ්ගනාශනයෙන් නැසිය යුත්තා හ. **දූසකෝ**- දූෂණ කාරී. **ඛිත්ත චිත්තස්ස**- යක්‍ෂාවේශාදියෙන් උමතු වූවහුට. **ආදි කම්මිකස්ස**- පළමු කර්මය කළාහුට.

**සන්ථත භාණවාරං නිට්ඨිතං**

37 පිට.

**නගගෙහි**- නගනව. **ගිහි ලිඞ්ගෙන**- ගිහි වශයෙන් ශ්වේත වස්ත්‍ර හැඳීමෙන්. **කුසචීරං**- කුසතණ ගොතා කළ සිවුර. **වාකචීරං**- රිටිපුඹුලින් කළ සිවුර. **ඵලකචීරං**- පුවරු මැසා කළ සිවුර. **කේස කම්බලං**- කේශයන් ගෙන් නූල් ගොතා එයින් කළ කම්බලය. **වාල කම්බලං**- සෙමෙර වල්ගවලින් නූල් ගොතා කළ කම්බලය. **උලූක පක්ඛං**- බක මුහුණු පියාපතින් කළ සිවුර. **අජිනක්ඛිපං**- ලොම් සහිත වූ බුර සහිත වූ අඳුන් දිවිසම.

38 පිට.

**අඞ්ගුට්ඨං**- මාපට ඇඟිල්ල. **නිලීයෙයි අච්ඡි**- සැඟවී සිටියේ ය. **පක්ඛාලෙත්වා**- සෝදා. **උග්ගණ්හිත්වා**- අල්වා ගෙන. **ආසාදියනතියා**- නො ඉවසන්නියට. **තඤ්ඤෙව උපජ්ඣං**- පූර්වයෙහි ගත් උපාධ්‍යාය ග්‍රහණය ම. **තමෙව උපසම්පදං**- පෙර කළ උපසම්පදාව ම. **භික්ඛුනීහි සඞ්කාමිතුං**- භික්ෂුණීන් හා එක්වීමට, ඒ ගණයට වැටීමට.

39 පිට.

**මුදු පිට්ඨිකො**- මෘදු වූ පිටු ඇත්තේ. **ලම්බි**- දික් හෙයින් එල්ලෙන අඞ්ගජාත ඇත්තේ. **තානි වස්සානි**- ඒ වස් ගණන ම. **අඞ්ගජාත සාමන්තා**- අඞ්ගජාතය හාත්පස. **ලේපචිත්තකස්ස**- චිත්‍රකර්ම රූපයක්හු ගේ. **ඡුපි**- සපයි කොළේ ය. **දාරුධීතලිකාය**- කාෂ්ඨමය රූපයක්හු ගේ. **රාජගහා**- රජගහ නුවරින්. **රථිකාය**- වීථියෙහි. **ආගමේහි**- ඉවසනු මැනව.

40 පිට.

**අඞ්ගජාතං සම්බාධවා**- ඇතුළත ගටා. **සීවථිකං**- සොහොනට. **විවටකතෝ මුඛෙ**- විවෘත කළා වූ මුඛයෙහි. **ඡුපනතං**- සපයි වන සේ. **නිමිත්තෙන අඞ්ගජාතං පටිපාදේසි**- නිමිත්තෙන් අඞ්ගජාතය මෙහෙය වී ය. **සංඛාදිත්වා**- රැස් කොට.

41 පිට.

**උපහතින්ද්‍රියෝ**- නැසුණු කාය ප්‍රසාදය ඇත්තේ. **නාවේදියාමි**- නො දනිමි, නො විඳිමි. **භද්දියෙ**- එනම් නුවර සමීපයෙහි වූ. **ජාතියා වනෙ**- එහි දෑසමන් මල් ගොමු බහුල කොට ඇති හෙයින් එනම් වූ වනයෙහි. **අඞ්ගමඞ්ගානි**- අවයවයෝ. **වාතූපත්ථද්ධානි**- වාතයෙන් සනබද්ධ වූවාහු. **කිලින්නං**- අසූචි

සෙන් තෙත් වූ බව, කිලිටි වූ බව. **උච්චාලිඞ්ගපාණකදමෙය්‍යන**- බූ පණුවන් (= දළඹුවන්) ගේ ස්පර්ශ වීමෙන්. **ඛටකහාරිකා**- දර ගෙන යන්නියක්.

42 පිට.

**රුක්ඛං අපස්සාය**- රුකක් ඇසුරු කොට. **අක්කමිත්වා**- පැහැර. **පවෙධෙති**- හෙළුවේ ය. **විහාර පෙක්ඛිකායෝ**- විහාර බලන්නා වූ. **පුරිසුසභෝ**- පුරුෂ ශ්‍රේෂ්ඨයෙකි. **දිවා පටිසල්ලීයනෙනත්න**- දවල් නිදන්නහු විසින්. **භාරුකච්ඡකෝ**- භාරුකච්ඡ ජනපද වාසී වූ. **සුපිනනෙත්න**- සිහිනෙන්. **විබ්භමිස්සාමී'ති**- සිවුරු හරින්නෙමි යි.

43 පිට.

**මුදුපසන්නතා**- මුඛ ප්‍රසන්න වූවා වෙයි. **ඌරන්තරිකාය**- ඌරු අතර. **උදර වට්ටියං**- බඩ රැල්ලෙහි. **උපකච්ඡකෝ**- කිසිල්ලෙහි. **අඞ්ගුලන්තරිකාය**- ඇඟිලි අතර. **විප්පටිපාදේසුං**- විප්‍රතිපාදනය කරවූ හ, අනාචාරයෙහි යෙදවූ හ.

44 පිට.

**ගිහිනියා**- ගෘහිනියක්. හා **පටික්කමනෙනෝ**- පස්සෙන් පස්සට යන්නේ. **උත්තානෝ**- උඩුකුරුව. **පරිපති**- පෙරළුණේ ය, වැටුණේ ය. **උබ්භුජිත්වා**- මතුයෙහි වැළඳ ගෙන.

**පඨම පාරාජිකං සමත්තං.**

---

## දුතිය පාරාජිකං.

---

**සන්දිට්ඨා**- දෘෂ්ටමාත්‍ර මිත්‍ර වූ. අති විශ්වාසක නො වූ. **සම්භත්තා**- අති විශ්වාසක වූ; දෘඪ මිත්‍ර වූ. **සම්බහුලා**- බොහෝ වූ, විනය ක්‍රමයෙන් භික්ෂූහු තිදෙනෙක් සම්බහුල නම්. **ඉසිගිලි පස්සෙ**- ඉසිගිලි පර්වත පාර්ශවයෙහි. **තිණකුටියෝ**- තෘණච්ඡදනමය කුටිහු. **කුම්භකාර පුත්තෝ**- කුම්භකාර පුත්‍ර වූ. **ආයස්මා ධනියෝ අපි**- ආයුෂමත් ධනිය ස්ථවිර තෙමේ ද. **තිණහාරියෝ**- තෘණ ගෙන යන ස්ත්‍රීහු ද. **සංකඩ්ඪිත්වා**- රැස් කොට.

45 පිට.

**සුසික්ඛිතෝ**- සුශික්ෂිතයෙමි. **අනවයෝ**- (අනූ අවයෝ) සියලු කුඹල් කම්හි අනූනයෙමි. **සකෝ ආචරියකෝ**- ස්වකීය

ආචාර්‍ය කර්මය වූ **කුම්භකාර කම්මේ**- කුඹල් කම්හි. **පරියෝදාත සිප්පෝ**- පිරිසුදු ශිල්ප ඇත්තේ වෙමි. **චික්ඛල්ලං**- මැටි. **සබ්බමත්තිකාමයං**- සියල්ල මැටිමය වූ. **පචි**- (ඇතුළත හා පිටත ගිනිදමා) පිසීය. **සෙය්‍යථාපි ඉන්දගෝපකො**- ඉඳු ගොව්වකු මෙන්. **ලෝහිතිකා**- ලෙහෙවන් වූවා. **කිඞ්කිණිකසද්දෝ**- කිකිණි දල් හඬ. **ඕරෝහන්තෝ**- බසින්නේ. **අනුද්දයා**- කාරුණාව. **අවිහේසා**- අවිහිංසාව. **පාතබ්බතං**- නැසිය යුතු බවට. **දාරුගහේ**- රජු ගේ දාරුභාණ්ඩාගාරයෙහි. **ගණකෝ**- ආරක්‍ෂක තෙමේ. **දාරූනි**- දව. **දාරුඛණ්ඩිකං**- දවයෙන් කළ හිනති ඇති.

46 පිට.

**දේවගහ දාරූනි**- රජු අයත් වූ දව. **නගර පටිසඞ්ඛාරිකානි**- නගර ප්‍රතිසංස්කරණයෙහි උපකරණ වූ. **ආපදත්ථාය**- විපත්තියක් පිණිස. **ඛණ්ඩාඛණ්ඩිකං**- කඩ කඩ කොට. **ඡේදාපෙත්වා**- කප්පවා. **නිබ්බාහාපෙත්වා**- පමුණුවා. **මගධමහාමත්තෝ**- මගධ රට මහාමාත්‍ය වූ හෝ මගධ රජු ගේ මහාමාත්‍ය වූ. **වස්සකාරෝ බ්‍රාහ්මණෝ**- එනම් බමුණු තෙම. **අනුසඤ්ඤායමානෝ**- ඒ ඒ තැන ගොස් පිරික්සන්නේ. **භණේ**- කොල, නීචාමන්ත්‍රණයකි. **සේනියෝ**- සේනා ඇති. **බද්ධං**- බඳනා ලද්දෙකු කොට. **ආණාපේසි**- ගෙන්වව. **නීයාසි**- පමුණුවන ලද්දෙහි ද? **තේසං දාරූනං කිච්චා**- ඒ දව කරුණු කොට ගෙන ය. **අහං**- මම. **පුරා හඤ්ඤාමි**- යම් තාක් නසනු ලබම් ද ඒ තාක්. **එය්‍යාසි**- එනු මැනව.

47 පිට.

**නාස්සරෙය්‍යාම**- සිහි නො කරන්නෙමු. **ඉඞ්ඝ**- චොදනාර්‍ථ නිපාතයෙකි, **පඨමාභිසිත්තෝ**- අභිෂිකතව පළමු කොට. **භාසිතා**- කියන ලද්දී. **සරාමහං**- සරාමි අහං- යි පදච්ඡේද යි. **අපරිග්ගහිතං**- අරක්‍ෂිතය යි. **තෙන ලේසේන**- ඒ ලේශයෙන්. කාරණින්. **පබ්බාජෙය්‍යථා**- පිටු වහල් කරන්නේ ද. **ලෝමෙන**- ප්‍රව්‍රජ්‍යාලිඞ්ග සඞ්ඛ්‍යාත ලෝමයෙන්. **මුච්චන්තෝසි**- මිදුණේ වෙහිය; ධූර්තයන් මුස් පිණිස ගත් මාං ඇඟි ලොම් ඇති එළුවෙකු දුටු නුවණැති මිනිසෙක් ලොම් නැති එළුවන් දෙදෙනෙකු ඔවුන්ට දී ඒ එළුවා ගත්තේ නම් ඌ ලොම් හේතු කොට ගෙන මරණින් මිදුණේ නම් වේ. එමෙන් වධ බන්ධනයට සුදුසු වූ ඔබ ප්‍රව්‍රජ්‍යාලිඞ්ගය වූ අහිත් බවජ (= චීවර) ය හේතු කොට ගෙන (මරණින්) මිදුණේය යන අර්‍ථයි. මේ දක්වන ලද්දේ අටුවාවට අනුව ලැබෙන

අර්ථය යි. එහෙත් ප්‍රව්‍රජ්‍යාලිඞ්ග සඞ්ඛ්‍යාත ලේශයෙන් යි ස්ථානෝ-චිතාර්ථයකු දු දිය හැකිය.

**උජ්ඣායන්ති**- ලාමක (= පහත්) කොට සිතත්. **ඛීයන්ති**- අගුණ පවසත්. **විපාචෙන්ති**- අගුණ පතුරුවත්. '**අලජ්ජිනෝ ඉමේ සමණා සක්‍යපුත්තියා**' යනාදිය උජ්ඣායනාකාරය යි. '**නත්ථි ඉමේසං සාමඤ්ඤං**' යනාදිය ඛීයනාකාරය යි. 'අපගතා ඉමේ සාමඤ්ඤා' යනාදිය විපාචනාකාරය යි. **පටිජානිස්සන්ති**- ප්‍රතිඥ කරත්.

**සාමඤ්ඤං**- ශ්‍රමණ භාවයක්. **බ්‍රහ්මඤ්ඤං**- ශ්‍රේෂ්ඨ භාවයක්. **ඉමේ රාජානම්පි වඤ්චෙන්ති**- යනු පද යෝජනා යි.

## ධනිය කථා නිට්ඨිතා.

---

48 පිට.

**පුරාණ වෝහාරිකො**- ගිහි කාලයෙහි අධිකරණ විනිශ්චය කාරයෙක් වූ. **කිත්තකේන**- කොපමණකින්. **පාදේන වා**- කහවණුවකින් හතරෙන් කොටසක් වූ පාදයකින් හෝ; මාසක විස්සක් කහවනුවයි. මෙහි පාදය ගත යුත්තේ පුරාණ නීල කහාපණයා ගේ වසයෙනි. **පාදාරහේන වා ඉති**- පාදයක් අගනා දෙයකින් හෝ යි. **පඤ්ච මාසකො**- පස් මසුවක්. **අදින්නං**- නුදුන් වස්තුව. **ථෙය්‍ය සඞ්ඛාතං**- සොර සිතින්, සොර සිත් නම් වූ එක් සිත් කොටසෙකින්. '**ථේනස්ස භාවෝ ථෙය්‍යං**' සොර බව ථෙය්‍ය නමි. මෙය සොර සිතට නමකි. '**සඞ්ඛා**' යනු හා '**සඞ්ඛාත**' යනු අර්ථවශයෙන් සමාන යි. '**සඤ්ඤා නිදානා හි පපඤ්ච සඞ්ඛා**' යනාදියෙහි මෙන් සඞ්ඛාත යනු කොටස යන අර්ථ ඇත්තේ ය, '**ථෙය්‍යඤ්ච තං සඞ්ඛාතඤ්ච ථෙය්‍ය සඞ්ඛාතං**' යනු විග්‍රහ යි. මෙය කාරණාර්ථයෙහි ප්‍රථමා හෙයින් සොර සිත් නම් වූ සිත් කොටසෙකින් යන අර්ථය ලැබෙයි. සාරාර්ථදීපනියෙහි මෙ කියන සිත් කොටස කුමක් ද යනු පිළිබඳව ඒ ඒ ආචාර්‍යවරයන් ගේ මතභේද දක්වන ලදී. '**අනේකප්පභේදත්තා චිත්තස්ස ඒකෝ චිත්ත කොට්ඨාසෝ'ති වුත්තං**' (= චිත්තය අනේක ප්‍රභේද වන බැවින් එක් සිත් කොටසෙකැ යි කියන ලදී) යන මහා ගණ්ඨිපද මජ්ඣිම ගණ්ඨිපද කාරයන් ගේ මතය ශාරිපුත්‍ර මහා ස්වාමීහු ද මැනැවයි පිළිගත්හ. **යථාරූපේ**- යම් බඳු වූ. **හනෙය්‍යුං වා**- මරත් ද, **බන්ධෙය්‍යුං වා**- බඳිත් ද, **පබ්බාජෙය්‍යුං වා**- රටින් හෝ නෙරපත් ද. **චෝරෝසී'ති**- ( දනා

අයත් දෙය) සොරා ගත්තෙහි ය යි. **ආදියමානෝ**- ගන්නා වූ. **අසංවාසෝ**- සෙසු උපෙක්ෂණීය කර්මය නො කළ භික්ෂූන් හා සංවාසයක් නැත්තේ වේ.

**රජක්ඛරණං**- රදා තොටට. **රජක භණ්ඩිකං**- රදවුන් ගේ රෙදි පොදියක්. **අවහරිත්වා**- සොර කම් කර ගෙන. **හරිත්වා**- ගෙනවුත්. **මහා පුරුසො අහු**- මහ පිනැත්තෝ වහු.

49 පිට.

**ඒක කුටිකෝ'පි**- එක ගෙයක් ඇත්තේ ද. **පරික්ඛිත්තෝ**- ප්‍රාකාරාදියෙන් වට කරන ලද්දේ ද. **ගෝනිසාදි නිවිට්ඨෝ'පි**- වීථි සන්ධි වේශාදි වශයෙන් නො වැස යම් සේ ගෙරිහු දෙතුන් දෙනා ඒ ඒ තැන්වල ලගිත් ද, එසේ ගෙවල් දෙකතුන ඉදි කොට ගෙන ගවයන් ලගින්නා මෙන් වුසුයේ ද ඒ ගෝනිසාදි නිවිට්ඨ නම්. **සකටෝ**- පා වෙලඳ මූලක් හෝ ගැල් වෙළඳ මූලක්. **අතිරේක චාතුමාස නිවිට්ඨෝ**- සිවු මසකට වැඩිය වාසය කරන ලද්දේ. **ඉන්දඛීලේ**- එළිපතෙහි. **මජ්ඣිමස්ස**- ශක්තියෙන් මධ්‍යම ප්‍රමාණ වූ. **ලෙඩ්ඩුපාතෝ**- කැට ගලක් වැටෙන තැනයි. **අනිස්සට්ඨං**- ( තමා අතින් හෝ තුබූ තැනින් හෝ ) බැහැර නො කරන ලද. **මමායිතං**- මෙය මාගේ යයි ගන්නා ලද. **පර පරිග්ගහිතං**- පරා අයත් වූ, අනුන් විසින් රක්ෂිත වූ. 'ථෙය්‍ය සඞ්ඛාතන්ති ථෙය්‍යචිත්තො අවහරණ චිත්තො' යන මෙහි 'ථෙය්‍ය සඞ්ඛාතං' යනු අර්ථවශයෙන් 'ථෙය්‍ය සඞ්ඛාතේන' (= සොර සිතින්) යි ලැබෙයි. සොර සිතින් ගන්නා තැනැත්තේ සොර සිත් ඇත්තේ නම් වේ. එහෙයින් ව්‍යඤ්ජනය නො ගෙන අර්ථයම දක්වන්නට 'ථෙය්‍ය චිත්තෝ අවහරණ චිත්තො' යි පද භාජනය කියන ලදී.

**ආදියෙය්‍ය**- මෙරමා අයත් ආරාමාදිය ගනී ද; **හරෙය්‍ය**- අන්‍යයෙකු ගේ පිරිකරක් (- බඩුවක්) ගෙන යමින් ගනී ද; **අවහරෙය්‍ය**- අනුන් තමා ළඟ තුබූ පිරිකරක් නැවත ඉල්ලූ කල මම් නොගතිමි යි කියා ගනී ද; **ඉරියා පථං විකෝපෙය්‍ය**- බඩු ගෙන යන්නහු හා සමග ගනු කැමතිව ඉරියවු විකෝපනය කෙරේද; **ඨානා චාවෙය්‍ය**- අනුන් අයත් දෙයක් සොර සිතින් (තුබූ) තැනින් පහ කෙරේ ද; **සඞ්කේතං වීති නාමෙය්‍ය**- පරි කල්පිත ස්ථානය ඉක්මවා ද, නොහොත් සුංවත් ගන්නා ස්ථානය ඉක්මවා ද. **අතිරේක පාදං වා**- පාදයකට වැඩිය හෝ 'පාදං' යන්නෙන් කාර්ෂාපණයා ගේ චතුර්ථභාගය වූ අකැප බඩුව ද; 'පාදාරහං' යන්නෙන් පාදයක් අගනා කැප බඩු වද, 'අතිරේක පාදං' යන්නෙන් ඒ දෙකම ද දක්වන ලදී.

**පථබ්‍යා රාජා**- සකල පෘථිවියෙහි රජ හෝ ලඞ්කාව වැනි එක් දිවයිනක රජය; **පදේස රාජා**- එක් දිවයිනක ප්‍රදේශාධිපති රජය; **මණ්ඩලිකා**- ද්වීප ප්‍රදේශයෙක්හි දු එක් එක් මණ්ඩලය- කට අධිපතිහු ය; **අන්තරභොගිකා**- දෙරජ කෙනෙකුන් අතර ගම් කීපයක හිමියෝ ය; **අක්ඛ දස්සා**- ධර්ම විනිශ්චය කාරණ අධි කරණ නායකයෝ ය; **මහා මත්තා**- තනතුරුවලට පත් මහ ඇමතියෝය යන මොහු සි. **ඡෙජ්ජ භෙජ්ජං**- සිඳීම හා බිඳීම. **අග්ඝනකං**- අගනා වූ. **කසාය**- කසයෙන්. **වෙත්තේන**- වේ වැලකින්. **අද්ධ දණ්ඩකේන**- මුගුරින්; නොහොත් දෙකට පැළූ දණ්ඩෙන්. **ඡෙජ්ජාය**- අත් පා ආදිය සිඳීමෙන්.

50 පිට.

**අන්දු බන්ධනේන**- නිගඩ බන්ධනයෙන්, නිගඩ නම් පා විලංගු සි. **සංඛලිකාය**- හැකිල්ලකින්. **ඝරබන්ධනේන**- ගෘහ බන්ධනයෙන්, ගෙයක දමා සිරකර තැබීමෙන්. **පුරිස ගුත්තිං**- පුරුෂයෙකු ආරක්ෂාවට තැබීම. **පරිභාසෙයි**- අවමන් කිරීම සි. **පුරිමං උපාදාය**- ( මෙවුන් දම් සෙවිමෙන් පරිජී ඇවෑසට පැමිණි ) පුද්ගලයා ගෙන. **පණ්ඩු පලාසෝ**- පඬුවන් වූ කොළයක්. **බන්ධනා**- නටුයෙන්. **පවුත්තෝ**- මිදුණේ. **හරිතත්තාය**- පලා- වන් බව පිණිස. **නිඛාතං**- වළලන ලද්දේ. **පිටකං වා**- පැසක් හෝ. **තතෝ**- ඒ මිතුයෙහි. **ජාතකං**- හටගත්. **චන්දුහති**- පිරයි. (= එක් පසෙක් හි රුස් කෙරේ) නම් හෝ 'විපුහති' යි ද පොත්හි එයි. **මුට්ඨිංවා ඡන්දති**- ( ඇඟිලි අතරින් නිකුත් කහවණු නිධි- කුම්භියෙහි වූ කහවණුහි නො ගැවෙන සේ ) මිට මොළවා නම් හෝ. **සුත්තාරූළ්හං භණ්ඩං වා**-(**සුත්තං ච තං සුත්තාරූළ්හං ච සුත්තාරූළ්හං**) **සුත්තං භණ්ඩං වා**- සූත්‍රමය භාණ්ඩයක් හෝ; **සුත්තාරූළ්හං භණ්ඩං වා**- හුයෙහි නගා, (= අවුණා ) කළ බඩු- වක් හෝ. **පාමඞ්ගං**- ( පමු ) දමක්. රතින් හෝ රිදියෙන් හෝ හුයින් කරන ලද්දේ සි. මුතුවැල් ආදිය ද මෙහිම සඞ්ගෘහීත සි. **කණ්ඨ සුත්තකං**- ග්‍රීවයෙහි පලඳින එනම් ආභරණයක්. **වෙඨ- නං**- හිස් වෙළුම් පටක්.

51 පිට.

**උච්චාරේති**- නගයි ද. (= ඔසොවයි ද) **මෝරෝ**- මයුර යෙක්. **කපිඤ්ජරෝ**- ගෞර වර්ණ තිත්තිර පක්ෂියෙක්. **තිත්තිරෝ**- කැට කුරුලු පක්ෂියෙක්. **ඡිජ්ජමානං**- සිඳිමින්. **චීවර වංසේ**- සිවුරු හුණෙහි; සිවුරු තැබීම දැමීම පිණිස බැඳ තුබූ අත් අඬු ද මෙහිම සඞ්ගෘහීත ය. **භිත්තිඛීලේ**- භිත්තියෙහි (සෘජුව ගැසූ)

හුලෙක් හි. **නාගදන්තෙ**- (බිත්තියෙහි ගැසූ) මුව අං ආදී කොක්කෙක් හි. **ලග්ගිතං**- එල්වන ලද්දේ. **භිසං**- නෙළුම්දළි හෝ නෙළුම්ල.

52 පිට.

**සඞ්කාමෙති**- සඞ්ක්‍රමණය කරවා ද. **වයහං**- සිවිගෙය. **සන්දමානිකා**- පල්ලැක්කිය. **පුප්ඵාරාමෙ**- (දෑසමන් ආදී) මල් වත්තය. **ඵලාරාමෙ**- (පොල් ආදී) පල වත්තය. **අභියුඤ්ජති**- අන්සතු වූවක් මෙය මාගේ යයි බොරු කියා අයිති කොට ගන්නට සභායාදි භාවය පිණිස දෙවැනියෙකු සෙවීම් ආදි වශයෙන් එහි යෙදේ ද. **ධුරං නික්ඛිපති**- බලාපොරොත්තුව අාශාව අත් හරී ද.

53 පිට.

**ධම්මං චරන්තො**- විශ්වයෙහි යෙදෙන්නේ. **පරජ්ජති**- තෙමේ පරදී ද. **පුබ්බණ්ණං**- මුං මෑ ආදීය. **තිලං**- ඉම් සාණ්ඩුව. **වතිං**- වැට, **මරියාදං**- තියර. **ඒකං පයොගං**- එක් අවසාන ප්‍රයෝගය, **වත්ථු**- වසතුව, **ආරාම වත්ථු**- පුෂ්පාරාමාදිය පිණිස සකස් කළ භූමි භාගය, කලින් ආරාමයක්ව තිබී පසුව එය විනාශව ඉතිරි වූ ආරාම කෘත්‍යය නො කරන හිස් බිමද ආරාම වත්‍ථු නමි. **විහාර වත්ථු**- විහාර පිරිවෙන් ආදිය තැනීම පිණිස සකස් කළ භූමි භාගය. කලින් විහාරයක්ව තිබී පසුව එය විනාශව ඉතිරි වූ විහාර කෘත්‍යය සිද්ධ නො කරන හිස් බිම ද විහාර වත්‍ථු නමි.

55 පිට.

**වනප්පති**- වනජ්‍යෙෂ්ඨ වෘක්ෂය. **මනුස්සානං පරිග්ගහිතො**- මනුෂ්‍යයන් විසින් රක්නා ලද. **පරිභොගො**- පරිභෝගාහී වූ. **ඒකං පහාරං**- එක් අවසාන පහර **හරණකං**- (සිසහාරාදි වශයෙන්) ගෙන යනු ලබන. **සහභණ්ඩ භාරකං**- භාණ්ඩය ගෙන යන්නහු සමග. **උපනික්ඛිතකං**- රක්නා පිණිස මෙරමා විසින් තබන ලද බඩුව යි, **සුඞ්කඝාතං**- සුංවත් ගන්නා ස්ථානය, සුංවත් දීමට සුදුසු බඩුවක් සුංවත් නො දී යම් තැනෙකින් නිකුත් කොට ගෙන යෑමෙන් රජු ගේ සුංවත් නැසීම වේ ද එතැන සුඞ්කඝාත නමි. **ඨපිතං**- ව්‍යවස්ථාවක් තබන ලද්දේ. **පඤ්ච මාසකං වා**- පස් මසුවක් හෝ. **අතිරේක පඤ්ච මාසකං වා**- පස් මසුවකට වඩා හෝ. **අග්ඝනකං**- අගනා වූ. **රාජග්ගං භණ්ඩං**- රාජාර්හ භාණ්ඩයක් (= සුංවත් රජුට දියයුතු බඩුවක්) **'රාජග්ගං'** යන්නෙහි **'රාජකං'** සිද්‍ධ පාඨයකි මෙ මැ අර්ථයි. **බහි**-

**සුඛකසාතං**- සුඛකසාතයෙන් පිටතට. **පරිහරති**- පරිහරණය කෙරේ ද, ලෙඩ්ඩුපාත දෙකක් පමණ වූ උපචාරයට පැමිණ ගෙනයා ද.

**අහි**- ( අහිගුණ්ඩිකාදීන් විසින් ගන්නා ලද හෙයින් හිමි යෙකු ඇති සර්පයා. **මච්ඡා**- මත්ස්‍යය යන මොහු සි.

56 පිට.

**පක්ඛජාතා**- හමගත් පියාපත් ඇත්තෝ ද යන මොහුයි, මොනර කුකුළු ආදි ලොම් පියාපත් ඇත්තෝය, වවුල් ආදි සම් පියාපත් ඇත්තෝ ය, බමර ආදි ඇට පියාපත් ඇත්තෝ ය යි පක්ඛජාතයෝ ත්‍රිවිධ වෙති. **ඔට්ඨා**- ඔටුවෝ ය. **ගෝණා**- ගොන්හු ය. **ගද්‍රභා**- කොටලුවෝ ය. **පසුකා**- අවශෙෂ චතුෂ්පද ජාතීහුය යන මොහු සි. **විච්ඡිකා**- ගෝනුස්සෝ ය. **සතපදී**- පත්තෑයෝ ය. **උච්චාලිඞ්ග පාණකා**- දළඹුවෝ ය යන මොහු යි. **ඕචරකෝ**- ඔත්තු බලන්නා. **ඕචරිත්වා**- ඔත්තු බලා. **ඕනිරක්ඛෝ**- තමා වසන තැනට ගෙන ආ බඩුවක් මද වේලාවකට ආරක්ෂා කරන්නා. **සංවිදහිත්වා**- සම්මත කොට ගෙන, බැණ ගෙන. **සංවිදාවහාර** නම් අසවල්හු ගේ බඩු සොරා ගනුම්හ යි අනුන් හා බැණ ගෙන ගැනීම සි. **දිවාවා**- දහවල් හෝ යි; **සඞ්කේතං කරෝති**- ( කාල පරිච්ඡේද වශයෙන් ) සලකුණු කෙරේ ද. **තං සඞ්කේතං**- ඒ සලකුණු කළ කාලයට. **මූලට්ඨස්ස**- මූලසථයා හට හෙවත් අණවූවහුට. **අවහාරකස්ස**- සොරා ගන්නහුට. **සඞ්කේත කම්ම** නම් අසවල්හු ගේ බඩු පෙර වරු ආදි කාලයන් අතුරෙන් අසවල් කාලයෙහි සොරා ගනුව යි කියන ලද්දහු සලකුණු කළ කාලය නො වරදවා ගැනීම සි. **නිඛනිස්සාමි**- තෙරන්නෙමි. **නිමිත්තං කරෝති**- (සංඥා උපදවනු පිණිස ඇස් තෙරුම්, බැම නැගුම්, ආදි කිසියම්) නිමිත්තයක් කරයි ද, නිමිත්ත කම්ම නම් ඇස් තෙරුම්, බැම නැගුම්, ආදි යම් කිසි නිමිත්තයක් මා කළ කල අසවල්හු ගේ බඩු සොරා ගනුව යි කියන ලද්දහු කළ නිමිති නො වරද වා ගැනිම සි.

57 පිට.

**තං නිමිත්තං**- ඒ නිමිත්තයට. **තං මඤ්ඤමානෝ**- (යමක් නියමිත ද) එයම ය සි හඟිමින්. **පාවද**- කියව. **පච්චාගච්ඡති**- පෙරළා එයි ද. **මා අවහරී'ති**- සොරා නො ගනුව යි **න සාවෙති**- නො අස්වයි ද.

58 පිට.

**සෝ ආණත්තෝ අහං තයා'ති**– හෙතෙමේ තා විසින් මම අණවන ලදිමි යි **සුවඤ්ඤ'ති**– මැනවැයි. **ඕරමති**– එයින් වලකී ද. **පරපරිග්ගහිතසඤ්ඤච හෝති**– අනුන් අයත් (අනුන් විසින් රක්‍ෂිත) වස්තුවකුත් වේ ද. **පරපරිග්ගහිතසඤ්ඤීච**– අනුන් අයත්ය යන සංඥ (=කල්පනා) ඇත්තෙක් වේ ද; **ගරුපරික්ඛාරෝච හෝති**– අග–යෙන් මහත් වස්තුවකුත් වේ ද; **පඤ්චමාසකග්ඝනකංච** එළඹ සිටියේ ද; **න ච සකසඤ්ඤී**– තමා ගේ යන සංඥ ඇත්තේ නො වෙයි ද. **න ච විස්සාසග්ගාහී**– විශ්වාස ග්‍රහණය ඇත්තේ නො වෙයි ද; **න ච තාවකාලිකං**– තාවකාලිකව ගැනීමක් නො වේ ද; **සසඤ්ඤිස්ස**– සවකීය ය යන සංඥ ඇත්තහුට ද; **පේතපරිග්ගහේ**- ප්‍රේතයන් අයත් වස්තුව ගැනීමෙහි ද; **තිරච්ඡානගතපරිග්ගහේ**- තිරිසනුන් අයත් වස්තුව ගැනීමෙහි ද; **පංසුකූලසඤ්ඤිස්ස**- (මෙය අස්වාමිකය යි) පාංශුකූලය යන සංඥ ඇත්තහුට ද.

---

## අදින්නාදානම්හි පඨම භාණවාරං.

---

60 පිට.

**උත්තරත්ථරණං**– මත්තෙහි අතුරන ඇතිරියක්.

61 පිට.

**පත්ථරිත්වා**– පතුරුවා, වකා. **මා නස්සි'ති**– නො නසීවා යි; **පවිස්සාමේසි**– තැන්පත් කොට තැබීය. **අවහරන්ති**– පැහැර ගන්නා ලද්දේ දැයි. **නං ආදියි**– ඒ භික්ෂුව සොරෙකැයි පරාමර්‍ශනය කොළේය, ගත්තේය. **නිරුත්තිපථෝ**– ව්‍යවහාර මාත්‍ර ඇත්තේ. **නිරුත්තිපථේ**– ව්‍යවහාර වචන මාත්‍රයෙහි.

62 පිට.

**වතියා**– වැටෙහි. **වාතමණ්ඩලිකාය උක්ඛිත්තං**– සුළි හුළඟින් ගෙන එන ලද. **පුරේ**– ඉදිරියෙහි. **අභින්න සරීරේ**– අභින්න වූ සිරුරෙහි, කාක කුලලාදීන් විසින් දළින් හෝ තුඩින් මදක් පමණ මුත් පැළීමෙන් හෝ වැරීමෙන් යම් සිරුරක සිවිය පමණවත් සිදුණේ නම් එය භින්න සරීර නම්. තවද සජීව කාලයෙහි හටගත් ගණ්ඩ පිලකාදියකින් හෝ වෙන යම–කින් වූ වණයක් වී නම් ඒ සිරුරද මැරී තුන් දවසේ පටන් ඉදිමීම් ආදියෙන් කුණප බවට ගිය සිරුර ද භින්න සරීර සඞ්ඛ්‍යා–

වර ගේ. එසේ නො වූ උණුසුම් සහිත තෙත් වූ සිරුර අභිනහා සරීර නම්. අධිවසෙථා- ශාටක තෘෂ්ණාවෙන් ඒ සිරුරෙහි උපන්නේ. අනාදියනෙතා- ඒ වචනය නො පිළි ගනිමින්. එකෙකෂි- වැසිය. පරිපති- වැටුණේය, නොහොත් ප්‍රේතයා ඒ ශාටකයෙහි නිරාලයව යථාකාමිත්වයට ගිය බැවින් සිරුර බිම පතිත විය. හාජියමානේ- බෙදනු ලබන කල්හි. කුසං සංඛා මෙත්වා- කුසපත සඞ්ක්‍රමණය කොට. ජනනාසරෙ- ගිහිගල් ගෙහි. අනතරවාසකං- අඳනය.

63 පිට.

සීහ විඝාසං- සිංහයන් විසින් කෑමෙන් ඉතිරි වූ මාංසය. පචාපෙතවා- පිසවා. තරච්ඡ- වලස්. අමූලකං- අමූලකාව. තිම්බරූසකෝ- තිඹිරි. ඔදනීය ඝරං- විකිණීම පිණිස බත් පිසනු ලබන ගෘහයට. පතන සූරං- පාත්‍රය පුරා. සූනාඝරං- විකිණීම පිණිස මස් පිසනු ලබන ගෘහයට. පූවඝරං- විකිණීම පිණිස කැවිලි පිසනු ලබන ගෘහයට. සකබලියෝ- එනම් ඛාද්‍ය විශෙෂයන්. මෝදකො- එනම් ඛාද්‍ය විශෙෂයන්.

64 පිට.

භිසිං- මෙට්ටයක්. පටිවිංසා- කොටස්; උපනික්ඛිත්තා හොනති- තැන්පත් කොට තබන ලද්දාහු වෙත්.

65 පිට·

පාතෙතවා- හෙලා. භණ්ඩිකං- පොදියක්. ලබුජ- දෙල්. ඔවිනිතවා- කඩා රුස් කොට. තාලපකක- තල් ගෙඩි.

66 පිට.

වුතෙතා වජෙජ්මි- තා විසින් කියන ලදුයෙම් තොපගේ වචනයෙන් කියමි. වුතෙතා වජෙජ්සි- මා විසින් කියන ලද්දේව මගේ වචනයෙන් කියව. ආලහකං සපපිං- නැලි හතරක් ගිතෙල්, තුලංගුලං- සියක් පලමක් සකුරු; දෙණං තණ්ඩුලං- ද්‍රෝණයක් සහල්; ආහරාපෙතවා- ගෙන්වා ගෙන. ගිලානාලයං කාරිතවා- ගිලන් බැව් දක්වා.

67 පිට.

න අකල්ලකෝ- ගිලනෙක් නො වෙමි. අතිකකාමෙකි- ඉක්මවනු මැනවි. පාසෙ- මල පුඩුවෙකි. කුම්හේ- කෙම්හෙති. පවටෙවතවා- පෙරළා. කුලලේන- උකුස්සෙකු විසින්.

68 පිට.

**උළුම්පං**- පසුරක්. **ඕසාදෙන්ති**- ගිල්වත්. **උත්තාරේසුං**- එතර කරවූහ. **ආලග්ගෙත්වා**- එල්වා. **උච්චාරං**- උච්චාර කම්-යට. **මුක්කං**- ගිලිහුණු. **ලග්ගං**- ලගන වූ යේ. **සප්පි කුම්භිං**- ගිතෙල් සැළියක්.

69 පිට.

**ආපණිකස්ස**- වෙළෙඳෙකු ගේ. **තණ්ඩුල මුට්ඨිං**- සහල් මිටියක්. **මාස මුට්ඨිං**- මෑ මිටියක්. **ලූනං**- කපන ලද. **ලාසිත්වා**- සිඳ. **මයං පරිභොගත්ථා**- අපි පරිභෝගය ප්‍රයෝජන කොට ඇත්තෝ වෙමු. **පරිභෝගත්ථාය**- සඞ්ඝිකා වූ එලාඑල ආගන්තුක යන් හට කො දුන්කාල පරිභෝගය පිණිස ඔවුන් විසින් තෙලවා සෙසු භික්ෂූන් හටබෙදා දීම වරද නොවේ.

70 පිට.

**ගොපේතුං**- රකින්නට. **කුක්කුච්චායන්තා**- සැක කරන්නාහු. **ගොපකස්ස දානෙ**- ආරක්ෂා කරන්නහු ගේ දීමෙහි (පිළිගැනීම වරද නො වේ.) **උපත්ථම්භෙසි**- උපස්තම්භයක් (= රුකුලක්) කෙළේ ය. **පුඤ්ජකිතං තිණං**- රැස් කරන ලද තණ. **ඛාදේසි**- දෑවීය. **බිම්බොහනං**- කොට්ටයක්. **ආලෝකසන්ධිං**- ආලෝක සන්ධියක්. **ගොනිසාදිං**- ගො නැස්සක්. **විහාර පරිභෝගං**- විහාරයෙහි පරිභෝගය පිණිස වූ. **සන්නිසජ්ජම්පි**- හිඳිනා ආසනය ද. **ඡමායං**- භූමියෙහි.

71 පිට.

**පංසුකිතානි**- පස් වැකුණා හු. **තෙකටුල යාගුං**- තල, සහල්, මුංවලින් හෝ, තල, සහල් මෑ වලින් හෝ තල සහල් කොල්ලු වලින් හෝ යුක්තව ද්‍රව්‍යත්‍රයයකින් පිසන ලද කැඳක්. **මධුගොළකං**- අතිරස පූව. **අජ්ජුකස්ස**- අජ්ජුක භික්ෂුව ගේ. **භාගිනෙය්‍යෝ**- බෑනා. **ඔකාසං**- වසතුව. **කුටුම්බකඤ්ච**- පවුල ද. **සඤ්ඤාපෙසි**- සංඥාපනය කෙළේ ය. **දායජ්ජෝ**- දායාදය. **මෙවුනකස්ස**- බෑනාට. **පක්ඛෝ හෝති**- පක්ෂය ඇත්තේ වෙයි.

72 පිට.

**උපඤ්ඤාතං**- උපඥව කරන ලද්දේ වෙයි. **නීතා**- ගෙන යන ලද්දාහු. **සූකරිකානං**- හුරු මැද්දන් ගේ. **මේදවට්ටි**- මේද තෙල් භාජනයක්. **උත්තිණ්ණං**- තරණය කළා වූ, ගොඩ බටුවාවූ.

**විබ්භමිස්සාමි**- සිවුරු හරින්නෙමි. **අග්ඝාපේසි**- මිල (වටිනාකම) තක්සේරු කරවිය.

## දුතිය පාරාජිකං සමත්තං.

---

### 73 පිට.

**ආදිස්ස ආදිස්ස**- කරුණු ගෙන හැර පපා. **පටිසල්ලීයිතුං**- හුදෙකලාව වාසය කරන්ට. **අඤ්ඤත්‍ර පිණ්ඩපාත නීහාරකේන**- පිණ්ඩපාත ගෙන එන්නෙකු හැර. **අනේකාකාර වෝකාරං**- නොයෙක් ආකාරයෙන් මිශ්‍ර වූ. **අනුයුත්තා**- යුක්ත ප්‍රයුක්ත වූවාහු. **දහරෝ**- ප්‍රථම යෞවනයෙහි සිටි හෙයින් දහර වූ. **යුවා**- තරුණ වූ **ආසත්තේන**- ඇලුණා වූ. **ජීවිතා**- ජීවිතයෙන්. **වෝරෝපෙන්ති**- තොර කරත්. **සමණකුත්තකං**- ශ්‍රමණ වේශධාරී වූ. **මිගලණ්ඩිකම්පි**- මිගලණ්ඩිකයා වෙත ද. **භතෝ**- පෝෂිත වූ යේ. **ලෝහිතකං**- ලෙහෙ වැකුණා වූ. **සසුකං**- රැස් කරන ලදී. **වග්ගුමුදා නදී**- ලෝකයා විසින් පුණ්‍ය සම්මත හෙයින් වග්ගුමුදා නම් නදිය. **මාරකායිකා**- මාරපාක්ෂික වූ. **අච්ඡිජ්ජමානේ උදකේ**- නො ගැලෙන්නා වූ ජලයෙහි. **අතිණ්ණේ**- සංසාරයෙන් තරණය නො කළවුන්. **ඡම්භිතත්තං**- තැති ගැනීමක්. **ලෝමහංසෝ**- ලොමු ඩැහැගැනීමක්.

### 74 පිට.

**ඒකාහේන**- එක් දිනකින්. **තනුභූතෝ විය**- තුනී වූවාක් මෙන්. **අඤ්ඤං පරියායං**- අනෙකාරණයක්. **අඤ්ඤාය**- රහත් බැව්හි. **උපනිස්සාය**- ඇසුරු කොට.

### 75 පිට.

**ආනාපාන සති සමාධි**- ආශ්වාස ප්‍රාශ්වාස පරිග්‍රාහක වූ සිහියෙන් යුත් සමාධිය. **අසේචනකෝ**- අනාශිකත වූ හෙවත් සවභාව මධුර වූ. **ඌහතං**- උඩ නැංගා වූ. **රජෝජල්ලං**- රජස් දූලි. **ඨානසෝ අන්තරධාපේති**- එකෙණෙහි ම අතුරු දහන් කරවයි. **සුඤ්ඤාගාර ගතෝ**- විවිකතාවකාශයකට ගියේ. **පල්ලඞ්කං**- ඌරුබද්ධාසනයක්. **ආභුජිත්වා**- බැඳගෙන. **උජුං කායං පණිධාය**- ඌර්ධවකාය සෘජුව පිහිටුවා ගෙන. **පරිමුඛං සතිං උපට්ඨපෙත්වා**- කර්මස්ථානාභිමුඛ කොට සිහිය පිහිටුවා. **සබ්බකාය පටිසංවේදී**- සියලු ආශ්වාස ප්‍රාශ්වාස කාය දන්නේ. **පස්සම්භයං**- මැඩ ලමින්. **අභිප්පමෝදයං**- සතුටු කරවමින්.

**සමාදහං**- සතුටු කරවමින්. **විමෝචයං**- නීවරණයන් කෙරෙන් මුදවමින්. **විරාගානුපස්සී**- විරාගය අනුව දක්නා සුලු වූයේ. **පටිනිස්සග්ගානුපස්සී**- දුරලීම අනුව දක්නා සුලුවූයේ.

76 පිට.

**අස්ස**- ඔහු සමීපයෙහි. **සත්ථහාරකංවා**- ජීවිතය හරනා ශස්ත්‍රයක් හෝ. **පරියේසෙය්‍ය**- (මියනු කැමති කල ගත හැකි සේ) එලවා තබාද. **කත හිරොත්තප්පෝ**- කරන ලද හිරුත්‍රාණ ඇත්තේය හෙවත් භයට කරන ලද ආරක්ෂා ඇත්තේ ය. **අකත කිබ්බිසෝ**- නො කරන ලද පාප ඇත්තේ ය. **දුජ්ජීවිතා**- දුඃඛ ජීවිතයෙන්. **තේ ජීවිතා**- තංගේ ජීවත්වීමට වඩා. **මතං සෙය්‍යෝ**- මියයාම උත්තමය. **ඉතෝ**- මේ මනුලොවින්.

77 පිට.

**පරිචාරෙස්සාමි**- ඉන්ද්‍රියයන් හසුරු වන්නෙමි.

**සායනියානිසායී**- රස විඳගතයුතුදෙය රස විඳගත්තේ ය. **සඤ්චිච්ච**- දැන දැන.

78 පිට.

**ඉති චිත්තමනෝ**- මෙබඳු මරණ සිත් ඇත්තේ. **චිත්ත සඞ්කප්පෝ**- මෙ බඳු (මරණ සංඥාදී) විසිතුරු විධාන ඇත්තේ. **අනේක පරියායේන**- නොයෙක් කාරණයෙන්. **මරණාය වා සමාදපෙය්‍ය**- මරණය පිණිස උපාය හෝ උගන්වා ද. **චෙච්ච**- වධක චේතනා වශයෙන් සිතා. **අභිවිතරිත්වා**- උපක්‍රම වශයෙන් මඩිමින් නිරාසඞ්ක චිත්තය මෙහෙයවා. **වීතික්කමෝ**- ව්‍යති ක්‍රමය. **පඨමං චිත්තං**- පළමු ප්‍රතිසන්ධි චිත්තය. **විඤ්ඤාණං**- ප්‍රති-සන්ධි විඥානය. **උපරෝධෙති**- (ජීවිතේන්ද්‍රිය පිළිබඳ නොසුන් ගැලපීම) වළක්වයි. **සන්තතිං විකෝපේති**- ජීවිතේන්ද්‍රිය සන්ත තිය ගේ පැවැත්ම වෙනස් කරයි. **සත්තිංවා**- අඩයටියක් හෝ. **හෙණ්ඩිංවා**- එනම් ආයුධ විශේෂයක් හෝ 'භින්දිපාල' නම් ආයුධ විශේෂය යයි සිතිය හැකිය. **ලගුලං**- මුගුර. **උබ්බන්ධිත්වා**- බැඳ.

79 පිට.

**සොබ්භේවා**- ගැඹුරු වළක හෝ. **නරකේවා**- භූමිපර්තාදී විවරයක හෝ. **අප්පටිසන්ධිකා හෝති**- සන්ධි කළ නො හැකි වෙයි ද. **සාමං අධිට්ඨාය**- තෙමේ ඉටා. **දූතෙන**- දූතයෙකු ලවා. **දූත පරම්පරාය**- දූත පරම්පරාවෙන්. බුද්ධරක්ඛිත තෙමේ ධම්මරක්ඛිතට සඞ්ඝරක්ඛිත ලවා මනුෂ්‍යයෙකු මැරවීමට

නියම කරයි, දූත පරම්පරාවෙන් ඇණවීම කරනුයේ මෙසේය. **විසක්කියේන දූතේන**- විසඞ්ක්ත කළ දූතයෙකු ලවා, ආචාර්යන් අතින් ඇණවීම ලත් බුද්ධරක්ඛිත තෙමේ ආචාර්යයන් වහන්සේ නියම කළ ධම්මරක්ඛිතට නො කියා සඞ්ඝරක්ඛිත ලවා මැරීම කරවිතම් සඞ්ඝරක්ඛිත විසක්කිය දූත නම්. **ගතපච්චාගතේන දූතේන**- ගොස් පෙරළා ආවා වූ දූතයා ලවා. **අරහෝ**- සම්මුඛ වූයේ. **රහෝසඤ්ඤී**- අසම්මුඛය යන සංඥ ඇත්තේ. **ලේඛාය**- ලේඛනයෙන්. **ඕපාතං**- බොරු වළක්. **අපස්සේනං**- හේත්තු වන පුවරුවක් හෝ එසේ නිත්‍ය පරිභෝගික වූ ඇඳ පුටු ආදියක්. **උපනික්ඛිපනං**- එළවා තැබීම. **රූපූපහාරෝ**- රූප එළවීම. **ආචික්ඛනා**- කීම. **කාය පටිබද්ධේන**- කයින් නො මිදූ කඩු ආදි ආයුධයකින්. **නිස්සග්ගියේන**- කයින් හා කාය පටිබද්ධවූවකින් මිදුවා වූ හී අඩයටි ආදියකින්. **අධිට්ඨායිත්වා**- සමීපයෙහි සිට.

80 – 81 පිටු.

**උල්ලපති**- කියයි. **සාසනං**- හස්නක්. **ලේඛං ඡින්දති**- කොළයක හෝ පොතක අකුරු ලියයි. **පපතිත්වා**- වැටී. **මඤ්ඤති**- ගල්වයි. **උපනික්ඛිපති**- එළවා තබයි.

82 – 83 පිටු.

**සායිත්වා**- රස විඳගෙන. **භේරවං**- භයානක වූ. **ඛුඤ්සිත්වා**- වියළී. **අලාභකේන**- නො ලැබීමෙන්. **ඝායිත්වා**- ආඝ්‍රාණය කොට. **ජේගුච්ඡිතා**- ජුගුප්සාභාවය හේතු කොට ගෙන. **පාටිකූල්‍යතා**- පිළිකුල් බව හේතු කොට ගෙන. **නේරයිකස්ස**- නිරයෙහි ඉපදීමට සුදුසු සත්වයෙකුට. **අධිමුත්තෝ**- දැඩි වසයෙන් එහි ගැලුණේ.

# මනුස්ස විග්ගහ පාරාජිකම්හි පඨම භාණවාරං.

---

84 පිට.

**සිලෝතිකාය**- රෙදි කඩකින්. **ඔකාසිත්වා**- යට කොට. **භත්තගෙශ්**- බත් බුදිනු ලබන සථ්‍ථානය වූ. **අනන්තරසරෙ**- ඇතුළු ගෙහි. **මුසලේ උස්සිතේ**- මොල [illegible] දතක් එකට බිත්තියට හේත්තු කොට තුබූකල්හි. **පටිපඤ්** [illegible] පෙරළී. **අවසාසි**-

වැටුණේය. **උදුක්ඛල භාණ්ඩකං**- වංගෙඩි පිණිස ගෙනෙන ලද දූව භාණ්ඩයක්. **අක්කමිත්වා**- ඇද. **පිතා පුත්තා**- පියා හා පුත්‍රයා.

85 පිට.

**පතිමානෙන් ති'ති**- බලාපොරොත්තු වන්නේය යි. **පිටකිය ගහෙත්වා**- පිට ගෙන. **පක්කාමෙසි**- බැහැර කෙළේ ය. **විලග්ගංහෝති**- ලගනවූයේ වෙයි. **පටික්කමනං**- ආසන ශාලාවට. **හරිත්වා**- ගෙන ගොස්. **අග්ගක්ඛාතිකං**- දූත සඞ්ඛ්‍යාත අග්‍රක්‍රියාවෙන් යුක්ත වූවක් කොට. **විමංසාධිප්පායෝ**- පරීක්‍ෂා කරන අදහස් ඇත්තේ.

86 - 87 පිටු.

**උපවාදේසි**- එසවීය. **උපනිමේත්ත භික්ඛුනා**- මත්තෙහි වූ භික්‍ෂුව විසින්. **උටකාපෙන්ති**- නංවත්. **ලුටකසං**- ගඩොලක්. **දුග්ගතිකා**- වරදවා ගන්නා ලද. **ඩාහිං**- වැය. **අච්ඡකාං**- පලන්විය. **ඡාදෙත්වා**- වසා. **ඔහරති**- බසියි. **විලිවකාරං**- කුලු පොත්තෙකු **න පාකෝ සාතබ්බං**- නො හෙළිය යුතුයි. **පච්ඡිණ්ඩිංසු**- පෙරලූවාහු ය. **දවාය**- ක්‍රීඩා පිණිස.

88 - 89 පිටු.

**සේදේසුං**- සෙව්ද කම් කරවූහ. සෙව්ද කම් නම් වේදු ඇල්ලීම් ආදියෙන් ශරීරය තැවීම යි. **සීසාභිතාපෙන්**- හිස රුජාවක්. **නස්සුං**- නස්‍ය කම්ය. **සම්බාහේසුං**- අත්පා මැඩවූ හ. **අබ්භඤ්ජිංසු**- ගැල්වූ හ. **නිපාකෝසුං**- හොවාලූ හ. **අන්නං**- ආහාර. **පවුත්ථ පතිකා**- ප්‍රවාසයට විදේශයට ගිය හිමියා ඇත්තී. **ජාරේන**- සොර හිමියා කාරණ කොට ගෙන.

90 - 91 පිටු.

**සබ්බස්ස කුටුම්බස්ස**- මුළු වස්තුවට. **මද්දන්සු**- පොඩිකරව. **තාපේහි**- තවව. **අඞ්ගුලි පතෝදකේන**- ඇඟිලි වලින් කිති කැවීමෙන්. **උත්තසයෙන්**- කලානත වන්නේ. **අනස්සාසකෝ**- ආශ්වාස රහිත වූයේ. **සාමඤ්ඤං**- අනාචාර කම්ය. **භූතවෙජ්ජකෝ**- භූත වෛද්‍යයෙක්, කට්ටඩියෙක් වූ. **වාළයක්ඛ විහාරං**- චණ්ඩ යක්‍ෂයන් ඇති විහාරයකට. **පාකේසි**- යැවිය. **වාළකාන්තාරං**- චණ්ඩ සත්වයන් ඇති කාන්තාරයකට. **වාළා**- සිංහාදී චණ්ඩ සත්වයෝ. **චොරකාන්තාරං**- සොරුන්ගෙන් ගහණ වූ කාන්තාරයකට.

## 93 පිට.

**දුයං**- වනයක්. **ආලිම්පෙය්‍යුං**- ගිනි තැබූහ. **ආඝාතනං**- වධස්ථානයට. **හත්ථපාදච්ඡින්නකෝ**- අත් පා සිඳුණේ. **සම්පරිකිරිංසු**- ගැවසී ගත්තේ. **තක්කං**- මෝරු. **ලෝණසෝවීරකං**- සියලු රසයන් ගෙන් පිළිවෙළ කරගත් බෙහෙතකි. අරළු - බුළු - නෙල්ලි - කහ සහ සියලු ධාන්‍ය, සියලු අපරණ්ණ, සප්තවිධ ධාන්‍යයන් ගේ බත්, කෙසෙල් ගෙඩි ආදී සියලු ඵලවර්ග, වේ - වැටකේ - හිඳි ආදීන්ගේ බඩ, මත්ස්‍ය - මාංස සහ මී පැණි - සකුරු - සහිඳ ලුණු - සාටුකරෝසන යන මේවා දමා සැළි මුඛය වසා අවුරුදු එකක් හෝ දෙකක් හෝ තුනක් තබා පස්සවා මෙය පිළිවෙළ කර ගනිති. කාශ ශ්වාස භගන්දරාදියට මෙය ඉතා ප්‍රත්‍යක්ෂ ඖෂධයකි

**තතියපාරාජිකං සමත්තං**

---

## 94 පිට.

අභිධෙය්‍යම- අනුශාසනා කරමු. **මඤ්ඤිස්සන්ති**- හඟින්. **දූතෙය්‍යං**- දූත කර්මය. **හරාම**- ගෙන යමු. **හරේන**- ගෙන යෑමෙන්. **අඤ්ඤමඤ්ඤස්ස**- ඔවුනොවුන් පිළිබඳව. **උත්තරිමනුස්සධම්මස්ස**- ධ්‍යානාදි උත්තරිමනුෂ්‍ය ධර්මයාගේ. **භාසාම**- කියමු. **තෙවිජ්ජෝ**- (දිව්‍යචක්ෂුර් ඥානය, පූර්වේනිවාසානුස්මෘති ඥානය, ආශ්‍රවක්ෂයකර ඥානය යන) ත්‍රිවිද්‍යා ඇත්තේ ය. **ඡළභිඤ්ඤෝ**- (ඉද්ධිවිධ - දිබ්බසොත-පරචිත්ත විජානන පුබ්බේනිවාසානුස්සති - දිබ්බචක්ඛු ආසවක්ඛයඤාණය යන) ෂට් අභිඥා වන් ඇත්තේ ය.

## 95 පිට.

**කච්චි ඛමනීයං**- කිම යාපනය කළ හැකිද? **භූතං**- ඇත්තා වූ දෙයක්. **තිණ්ණෙන**- තියුණු වූ. **ගෝවිකත්තනේන**- ගෙරින් කපන කැත්තකින්. **පරිකන්තෝ**- කපන ලද්දේ නම්.

## 96 පිට.

**හනන්තෝ**- මරමින්. **ඝාතෙන්තෝ**- මරවමින් නොහොත්. **හනන්තෝ**- බැඳීම් තැළීම් ආදියෙන් හිංසා කරමින්. **ඡින්දන්තෝ**- අනුන්ගේ අත් පා ආදිය සිඳිමින්. **පචන්තෝ**- තර්ජනය කරමින් හෝ උද්වෙග කරමින් නොහොත් ගම්වල ගෙවල් ගිනි තබමින්.

**පාචෙන්තෝ**- එළු තිරෙළු ආදීන් පිසවමින්. **ආහිණ්ඩිස්සාමි**- ඇවිදින්නෙම් ද. **අපචිතෝ**- අපචායනය කරන ලද්දේ. **ගහට්ඨානඤ්චෙව පබ්බජිතානඤ්ච**- ගෘහස්ථයන් විසින් හා ප්‍රව්‍රජිතයන් විසින් ද. **පරියාපුණිත්වා**- ප්‍රගුණ කොට. **අත්තනෝ දහන්ති**- තමාගේ ආත්මය උසස් කොට පිහිටුවයි. **අනුද්ධංසේන්ති**- චෝදනා කරයි. **ලෝහකුම්භී**- ලොහො සැළිය. **ලෝහභාණකෝ**- ලොහො සැල. **ලෝහවාරකෝ**- ලොහො කළය. **ලෝහකටාහං**- ලොහො කටාරම. **කුඨාරී**- කෙටේරිය. **කුද්දාලො**- උදැල්ල. **නිඛාදනං**- නියන. **වල්ලී**- ( වේ වැල් ආදි ) වැල්. **වේළු**- (මහ හුණ ආදි) හුණ. **මුඤ්ජං**- මුදු තණ. **බබ්බජං**- බබුස් තණ. **තිණං**- (ඉළුක් ආදි ගේ සොයන) තණ. **දාරුභණ්ඩං**- දැව මුවා බඩු. **උපලාපෙන්ති**- පොළඹවයි. **ථෙය්‍යාය**- සොරකමින්.

97 පිට.

**1. යෝ**- යමෙක්; **අඤ්ඤථා සන්තං**- අන් පරිද්දකින් ඇත්තා වූ; **අත්තානං**- ආත්මය. **අඤ්ඤථා**- අන්‍ය ප්‍රකාරයකින්; **පවේදයේ**- ප්‍රකාශ කරන්නේ ද; **කිතවස්සේව**- ලිහිණි වැද්දෙකු ගේ ලිහිණි මස් බුදීම මෙන්; **තස්ස**- ඔහු විසින්; **නිකච්ච**- වඤ්චා කොට; **තං**- ඒ සිවුපස පරිභෝගය; **ථෙය්‍යේන**- සොර බැවින්; **භුත්තං**- අනුභව කරන ලද්දේය;

**2. පාපධම්මා**- පවිටු ස්වභාව ඇති; **අසඤ්ඤතා**- කාය වාක් සංවර රහිත; **කාසාවකණ්ඨා**- කාසාවෙන් වෙළුණු කණය ඇති පුහුලෝ; **බහවෝ**- බොහෝ වෙති; **තේ පාපා**- ඒ ලාමක පුද්ගලයෝ; **පාපේහි කම්මේහි**- කරන ලද අනුන් වඤ්චා කිරීම් ආදි පව් කම් කරණ කොට ගෙන; **නිරයං**- නරකයෙහි; **උපපජ්ජරේ**- උපදිත්;

**3. චෙ**- ඉදින්. **අසඤ්ඤතෝ**- කාය වාක් සංයම රහිත වූ; **දුස්සීලෝ**- දුශ්ශීලයෙක් තෙම; **රට්ඨපිණ්ඩං**- රටවැසියාගේ පිණ්ඩය; **යං**- යම් හෙයකින්; **භුඤ්ජෙය්‍ය**- අනුභව කරන්නේ ද; (එයට වඩා) **අග්ගිසිඛූපමෝ**- ගිනි සිලක් වැනි වූ; **අයෝගුළෝ**- ලොහො ගුලියක්; **භුත්තෝ**- වළඳන ලද්දේ නම්; **සෙය්‍යෝ**- උතුම්;

**අනභිජානං**- ස්වසන්තානයෙහි නො උපන් හෙයින් තමා කෙරෙහි ඇතැයි ) නො දන්නේ; **අලමරියඤාණදස්සනං**- කෙලෙස් දුරලීමෙහි සමත් පිරිසුදු වූ ඥානදර්ශන ඇති; **උත්තරිමනුස්සධම්මං**- ධ්‍යානාදි වූ උතුරුමිනිස් දම්. **අත්තූපනායිකං**- තමා කෙරෙහි එළවා හෝ තමා එහි එළවා; **ඉති ජානාමි**- මේ

කාරණයෙන් මා කෙරෙහි ඇතැයි දනිමි; **ඉති පස්සාමි-** මේ කාරණයෙන් (ඇසින් දුටුවා මෙන්) දකිමි යි; **අසන්තං අධිමානා-** (අධිගත ධර්ම ඇත්තෙමි යන) අභිමාන නැතිව; **සමුද්දවරෙය්‍ය-** (නුවණැති වූ කාරණාකාරණ දත් මනුෂ්‍යයෙකු හට ) කියා ද. **තතො අපරේන සමයේන-** ඒ ආරෝපිත කාලයෙන් අන්‍ය කාලයෙක්හි; **සමනුග්ගාහියමානො වා-** ධ්‍යාන විමෝක්ෂාදීන් අතුරෙහි කවර ධර්මයක් තොප විසින් අධිගත ද යනාදීන්) විචාරනු ලබන්නේ හෝ; **අසමනුග්ගාහියමානො වා-** (එසේ) විචාරනු නො ලබන්නේ හෝ; **ආපන්නො-** (ආරෝපිත කාල යෙහි ම පාරාජිකාවට) පැමිණියේ; **විසුද්ධාපෙක්ඛො-** තමහට ගිහි බැව් ආදී පාරිශුද්ධිය කැමැත්තේ; **ආවුසො-** ඇවැත්නි! **අජානං-** (උතුරු මිනිස් දම් මා කෙරෙහි නැතිහෙයින් ම ඇතැයි) නො දන්නෙම්; **ඒවං ජානාමි-** මෙ සේ දනිමි යි; **අපස්සං-** නො දක්නෙම්. **ඒවං පස්සාමි-** මෙ සේ දකිමි යි; **අවචං-** කීමි. **තුච්ඡං-** වචනාර්ථ රහිත වූ හෙයින් හිස් වූ; **මුසා-** බොරු; **විලපිනන්ති-** කීමි යි; **ඒවං වදෙය්‍ය-** මෙසේ කියා ද;

අදිට්ඨ- (අතීන්ද්‍රිය චක්ෂුසින්) නො දක්නා ලද්දෙහි. **දිට්ඨ සඤ්ඤිනො-** අප විසින් අභීතව්‍ය දක්නා ලද්දේය යන සංඥ ඇත්තා හු. **අධිමානේන-** අධික මානය හේතු කොට ගෙන. **අසන්තං-** අභිතව්‍ය. **ව්‍යාකරිංසු-** පහළ කළහ. **අබ්බොහාරිකං-** ආපත්ති පැනවීමෙහි ව්‍යවහාරයට හෙවත් ආපත්තිශක ගේ අඞ්ග යක් බවට නො ය යි.

98 පිට.

**ලයං-** ක්ෂණය. **විතිවත්තෙත්-** ඉක්ම ගිය කල්හි. **ඉච්ඡාපකතො-** ඉච්ඡාවෙන් මඩනා ලද්දේ, පරාජිත වූයේ. **අභබ්බො-** භව්‍ය නො වූයේද. **විරූළ්හියා-** වැඩීමට. **සුඤ්ඤතො-** රාග ද්වේෂ මෝහයන් ගෙන් ශූන්‍ය හෙයින් සුඤ්ඤත නම් වූ. **විමොක්ඛො-** (විවිධ වූ කෙලෙශයන් කෙරෙන්) මිදීම (සතර ආර්‍ය මාර්‍ග යයි.) **අනිමිත්තො-** (රාග ද්වේෂ මෝහ නිමිති රහිත හෙයින්) අනිමිත්ත නම් වූ. **අප්පණිහිතො-** (රාග ද්වේෂ මෝහ ප්‍රාර්ථනා රහිත හෙයින්) අප්පණිහිත නම් වූ. **සමාධි-** සිත සමව අරමුණෙහි පිහිටුවානු යි සමාධි නම්. **සමාපත්ති-** ආර්‍යයන් විසින් මොනවට පැමිණීම කළයුතු හෙයින් සමාපත්ති නම්. **මග්ග භාවනා-** මෙහි මග්ගභාවනා යන්නෙන් මාර්‍ග සම්ප්‍රයුක්ත ලෝකෝත්තර වූ සත් තිස් බෝධිපාක්ෂික ධර්ම ගැනෙත්. **විනීවරණතා-** වෙන්වුණු බව. **සුඤ්ඤාගාරේ-** ශූන්‍යාගාරයෙහි. **අභිරති-** ඇලීම. **සමාපජ්ජිනත්ති-** සමවැදුණෙමි යි. **භණිස්සනති-** කියන්නෙම් යි.

### 100 පිට.

**දිට්ඨිං**- දෘෂ්ටිය. **විනිධාය**- ස්වකීය සන්තානයෙහි පිහිටුවා ගෙන. **ඛන්තිං**- ඉවසීම. **රුචිං**- රුචිය. **භාවං**- අභිප්‍රාය. **සමාපජ්ජාමි**- සමවදිමි. **සමාපන්නෝ**- සමවැදුණේ.

### 104 පිට.

**චත්තෝ**- හරන ලද්දේය. **වන්තෝ**- නැවත නො ගැනීම් වශයෙන් බැහැර කරන ලද්දේය. **පටිනිස්සට්ඨෝ**- දුරු කරන ලද්දේය. **උක්ඛෙට්ඨිතෝ**- නැවත නො ඇලීම් වශයෙන් පලවා හරින ලද්දේය. **සමුක්ඛෙට්ඨිතෝ**- මැනැවින් පලවා හරින ලද්දේය

### 105 - 113 පිටු.

**පටිවිජානන්තස්ස**- දන්නෙකු හට. **වචනානුවිසාරකස්ස**- කියන්නට සමර්ථ වූවහු ගේ. **අනුල්ලපනාධිප්පායස්ස**- කුහක භාවයෙහි පිහිටා යථොක්තාකාරයෙන් කීමේ අදහසක් නැත්තහුට.

**උත්තරි මනුස්ස ධම්ම චක්ක පෙය්‍යාලං නිට්ඨිතං.**

---

### 114 - 115 පිටු.

**ඒවං මං ජනෝ සම්භාවෙස්සතී'ති**- මෙසේ මට ජනයා සම්භාවනා කරන්නේ යයි. **සම්භාවේසි**- සම්භාවනා කෙළේ ය. **උල්ලපනාධිප්පායෝ**- (යථෝක්තාකාරයෙන් කියනු කැමැත්ත ඇත්තේ. **අපසාදේසි**- අවමන් කෙළේ ය. **අඤ්ඤං බ්‍යාකාතුං**- අර්හත්වය පහළ කරන්ට. **න දුක්කරං**- දුෂ්කර නො වෙයි. **ධම්මෝ**- උත්තරි මනුෂ්‍ය ධර්මය තෙම. **ආරාධනීයෝ**- ආරාධනය කරන්ට හෙවත් උපදවන්නට හැකිය.

### 116 - 117 පිටු.

**යෝ**- යමෙක්. **නූන**- ඒකාන්තයෙන්. **විප්පටිසාරී අස්ස**- විපිළිසර වන්නේ ද. **සම්මාපයුත්තේන**- මනාකොට යොදන ලද වීර්‍ය ඇත්තහු විසින්. **අධිවාසේතුං**- ඉවසන්ට. **සමුදාචරති**- ව්‍යවහාර කරයි. **පසාදභඤ්ඤේ**- ප්‍රසාද පූර්වක කීමෙහි. **තප්පෙන්තු**- ශරීර සන්තර්පණය කෙරෙත්වා. **ආවටා**- ප්‍රතික්ෂේප කරන ලදහ. **ඛණිකං කත්වා**- සම්මත කොට ගෙන.

### 118 පිට.

**පක්කමිස්සති**- ඉවත්ව යන්නේ ද. **සිතං පාත්වාකාසි**- සිනාව පහළ කෙළේය. **මං**- මා අතින්. **අට්ඨි සඞ්ඛලිකං**- ඇට

සැකිල්ලක්. **ගිජ්ඣාපි**- (යක්) ගිජුලිහිණියෝ ද. **කුලලාපි**- (යක්) උකුස්සෝ ද. **අනුපතිත්වා**- ලුහු බැඳ. **ඵාසුලන්තරිකාසු**- ඉල ඇට අතරෙහි. **විතුදෙන්ති**- විදිත්. '**විතුණ්ඩෙන්ති**' යනු ද පාඨයකි. ඒ අර්ථ පක්ෂයෙහි ඉලඇට අතරත කුඩා මත්ත් සිදුරු කොට ඒ සිදුරු අතරෙන් ඉගිලෙත් යි අර්ථ ගතයුතු යි.

**සා**- ඒ ඇට සැකිල්ල. **අට්ටස්සරං**- ආතුර ස්වරය. බැගැපත් හඬ. **යත්‍රාසි නාම**- යම් හෙයකින් වනාහි. **සක්ඛිංවා කරිස්සති**- ප්‍රත්‍යක්ෂ කරන්නේ ද. **චක්ඛුභූතා**- දිවැස් ඇත්තාහු නොහොත් ලෝකයාහට ඇසක් වැනි වූවාහු. **ඤාණභූතා**- උපන් නුවණ ඇත්තාහු. **ගිඣාවේ පුබ්බේ ච මේ සෝ සත්තෝ දිට්ඨෝ අහෝසි**- බෝ මැඩදී සර්වඥතාඥනාවබෝධයෙන් අප්‍රමාණ චක්‍රවාටයන්හි අප්‍රමාණ සත්ව නිකායයන් හා භවයෝනි ගතීන් ප්‍රත්‍යක්ෂ කරන්නා වූ මා විසින් තොෂ කිනු ලබන සත්ව තෙමේ දක්නා ලද්දේය යනු භාව යි.

119 පිට.

**න වාඃඛාසිං**- පහල නො කොළෙමි. **මේ**- මගේ (කිම) **පටිසංවේදේති**- විඳියි. **මංසපේසිං**- මස් පිඩුවක්. **වීතච්ඡෙන්ති**- (තුඩුවලින් සඟින්නාක් මෙන් මස්) කඩා ගනිති. **විරාජෙන්ති**- විලිඹනය (= ඉරීම) කරත්. **සාකුණිකෝ**- පක්ෂීන් මරා විකොට ජීවත් වන්නෙක්. **නිච්ඡවිං**- සම නැත්තා වූ. **ඕරබ්භිකෝ**- එළුවන් මරා විකොට ජීවත් වන්නෙක්. **අසිලෝමං පුරිසං**- කඩු වැනි ලොම් ඇති පුරිසයෙකු. **උප්පතිත්වා**- උත්පතනය වී. **නිපතන්ති**- වැටෙත්. **සූකරිකෝ**- හූරන් මරා විකොට ජීවත් වන්නෙක්. **සත්තිලෝමං**- අඩයටි වැනි ලොම් ඇති. **මාගවිකෝ**- මුවන් මරා විකොට ජීවත් වන්නෙක්. **උසුලෝමං**- හී වැනි ලොම් ඇති. **කාරණිකෝ**- (රාජාපරාධ කරුවන් නොයෙක් කරුණු වලින් පෙළා අවසානයෙහි හීයෙන් වීද මරන) රාජ වධකයෙක්. **සූචිලෝමං**- හිඳි කටු වැනි ලොම් ඇති. **සාරථිකෝ**- අශ්වයන් දමනය කරන්නෙක්. කුරුන්දිය අටුවාවෙහි හෝදම්කායෙකැයි ද කියන ලදී.

120 පිට.

**සීසේ පවිසිත්වා**- හිසින් ප්‍රවිෂ්ටව. **උරතෝ**- ළයෙන්. **ඌරූහි**- කලවා වලින්. **ජඞ්ඝාහි**- කෙණ්ඩ වලින්. **සූචකෝ**- කේලාම් කියන්නෙක්. **කුම්භණ්ඩං**- කළ වැනි අණ්ඩ ඇති. **බණ්ඩි**- දසරුවෙහි. **ආරෝපෙත්වා**- නංවාගෙන. **ගාමකූටකෝ**-

(රහසිගතව අල්ලස් ගෙන කූට විනිශ්චයෙන් නඩු විසඳූ) විනිශ්චයාමාත්‍යයෙක්. **ගූථකූපේ**- අසූචි වළෙක. **සසීසං නිමුග්ගං**- හිස සහිතව ගැලුණු. **පාරදාරිකෝ**- පරදාර කර්මය කළ තැනැත්තෙක්. **පාවචනේ**- ශාසනයෙහි. **දොණියෝ**- ඔරු. **ගූථස්ස පූරාපෙසඛා**- අසූචියෙන් පුරවා. **අතිචාරිනී**- පර පුරුෂ සේවනය කරන්නියක්. **මඞ්ගුලිං**- විරූප වූ, පිළිකුල් කටයුතු වූ. **ඉක්ඛණිකා**- යක්ෂ දාසි කර්මය කරන්නියක්. **උප්පක්කං**- ක්‍රෑර වූ ගින්නෙන් පැසෙන්නා වූ. **ඔකිලිනිං**- ඕජා වැගිරීමෙන් තෙත් වූ. **ඔකිරිණිං**- ගිනි අඟුරෙන් ගැවසී ගත්තා වූ. **ඉස්සාපකතා**- ඊර්ෂ්‍යාවෙන් මඩනා ලද්දී. **සපත්තිං**- සැතිරියකට. **අඞ්ගාරකටාහේන**- අඟුරු කබලකින්. **ඔකිරි**- විසුරුවාය. **අසීසකං**- හිසක් නැත්තා වූ. **කබන්ධං**- කවන්ධ රූපයක්.

121 පිට.

**සන්දති**- ගලා බසී ද. **සො දහෝ**- ඒ විල. **අච්ඡෝදකෝ**- ප්‍රසන්න ජලය ඇත්තේ ය. **සාතෝදකෝ**- මිහිරි වූ දිය ඇත්තේ ය. **සේතකෝ**- පිරිසුදු ය. **සුප්පතිත්ථෝ**- සුන්දර තීර්ථ ඇත්තේ ය. **පහූත මච්ඡකච්ඡපෝ**- බොහෝ මස් කැසුබුවන් ඇත්තේ ය. **චක්කමත්තානි**- රියසක් පමණ වූ.

122 පිට.

**කථිතා**- උණුව. **ද්වින්නං මහා නිරයානං අන්තරිකාය**- දෙ ලොහොකුඹු නිරයන් අතරෙන්. **පභඞ්ගෝ හෝති**- බිඳුණේ පැරදුණේ වෙයි. **සංකසායිත්වා**- රැජ් කොට. **නන්දි චරති**- විජය භේරිය හැසිරෙයි. **සඤ්ඤිනිකාය**- එනම් වූ. **ආනෙඤ්ජං සමාධිං**- අචල වූ. (චතුර්ථධ්‍යාන සමාධියට) **ඕගාහං උත්තරන්තානං**- බැස (නැවත) එතර වන්නා වූ. **නාගානං**- හස්තීන් ගේ. **කොඤ්චං**- කුඤ්ච නාදය.

**චතුත්ථ පාරාජිකං සමත්තං.**

---

123 පිට.

**යේසං**- යම් පාරාජිකා කෙනෙකුන් අතුරෙන්. **අඤ්ඤතරං වා අඤ්ඤතරං වා**- එක්තරා පාරාජිකාවකට. **පුබ්බේ යථා**- ගෘහස්ථ අනුපසම්පන්න කාලයෙහි යම් සේ ද. **පච්ඡා**- පසුව. **පරාජිකෝ**- පරිජිවූයේ ද. **තථා**- එ සේ ම. **අසංවාසෝ හෝති**- භික්ෂූන් හා සංවාසයක් නැත්තේ වෙයි. **තානි**- ඒ සතර

පාරාජිකාවෙහි ලා. **කච්චි පරිසුද්ධා අත්ථ**- කිම පිරිසුදු වන්නහු ද? **ඡෙජ්ජ වත්ථු අසංසයා**- සැක රහිත වූ ඡේද්‍ය වස්තුහු වෙති.

**පාරාජික කණ්ඩං නිට්ඨිතං.**

---

# තේරසකං.

---

124 – 125 පිටු.

**රාගෝ**- කාම රාගය තෙමේ. **අනුද්ධංසේති**- වික්ෂිප්ත කෙරෙයි ද, මලානික කෙරෙයි ද. **සඤ්චේතනිකා**- මෝචනාශාද චේතනා ඇති. **සුක්කවිස්සට්ඨි**- ශුක්‍ර මෝචනය. **ඔක්කමන්ති**- බසිත්. **සුපිනන්තේන**- සිහිනෙන්. **අසුචි**- ශුක්‍ර. **ලබ්භා**- ලැබිය හැකි ද. **අබ්බෝහාරිකා**- ආපත්ත්‍යඞ්ගයට නො පැමිණෙසි. **සඞ්ඝාදිසේසෝ**- සඞ්ඝාදිසේස නම් ආපත්තිය වේ, මේ ඇවතට පැමිණියහුට එසින් නැගී සිටිනු පිණිස මුලදී මෙන් ම අවසන් හි ද සඞ්ඝයා ම වුවමනා හෙයින් සඞ්ඝාදිසේස ය යි කියනු ලැබේ. **තක්කවණ්ණං**- මෝරුවර්ණය ඇති. **දකවණ්ණං**- ජලය හා සමාන වර්ණය ඇති. **දධිවණ්ණං**- දීවල වර්ණය ඇති. **මූලාය පටිකස්සති**- මූලාය පටිකස්සනය කරයි මුලට ඇදීම කරයි සේයි. **අබ්භේති**- අබ්භානය කරයි සඟ මැදට පමුණුවයි සේයි. **ආපත්තිනිකායස්ස**- ආපත්ති සමූහයට. **අධිවචනං**- නමකි.

**අජ්ඣත්තරූපේ**- සවකීය රූපයෙහි. **බහිද්ධාරූපේ**- පිතට රූපයෙහි. **කටිං**- උකුල.

126 පිට.

**රාගූපත්ථම්භේ**- රාගයෙන් දැඩි වූ කල්හි. **වච්චූපත්ථම්භේ**- වර්චසින් දැඩි වූ කල්හි. **පස්සාවූපත්ථම්භේ**- මූත්‍රාවලින් දැඩි වූ කල්හි. **වාතූපත්ථම්භේ**- වාතයෙන් දැඩි වූ කල්හි. **උච්චාලිඞ්ගපාණකදට්ඨූපත්ථම්භේ**- දළඹුවන් විසින් දෂ්ට කරන ලදින් දැඩි වූ කල්හි. **යඤ්ඤත්ථාය**- යාග පිණිස. **බීජත්ථාය**- කුල වංශාඞ්කුර වූ බීජය පිණිස. **වීමංසත්ථාය**- පරීක්ෂා කරනු පිණිස. **නීලං මෝචේති**- නිල්වන් සුකුරු මුදයි. **උපාදින්නේ**- පණ ඇත්තා වූ. **රූපේ**- (අත් ආදි) රූපයෙහි. **චේතේති**- සිතයි.

134 – 135 පිටු.

**භේසජ්ජන ආලිම්පනස්ස**- බෙහෙත් ගල්වන්නහුට. **කණ්ඩුවනස්ස**- කසන්නහුට. **වත්ථිං**- වස්තියක්. **ජනනාඞ්ගේ**-

ගිනිහල් ගෙහි. **පිට්ඨිපරිකම්මං**- පිට ඇතිල්ලීම. **ඌරුං**- කලවා. **මුට්ඨිනා**- මිටින්.

## 136 – 137 පිටු.

**කායං විජම්භනස්ස**- කාය විජෘම්භණය. (= ඇඟ මැලි කැඩීම) කරන්නහුට. **උපනිජ්ඣායි**- බැලීය. **තාලච්ඡිද්දං**- යතුරු සිදුරකට. **පටිසෝතේ**- ඉදිරියෙන් එන දිය පහරෙහි. **උදකඤ්ජලිං**- ජලසහිත මඩෙහි. **පුප්ඵාවළියං**- එනම් ක්‍රීඩා විශේෂය, එය තොලකාහු නදී ආදීන්හි සිඳුණු ඉවුර ජලයෙන් මඩ කොට එහි දෙපා දිගු කොට හුන්නාහු හෙත්. **'පුප්ඵාවලී'** යි ද පාඨයකි. මේ ටීකානුගත අර්ථයයි. මල්ගොඩක යයි සඵානෝ- චිතාර්ථයකුදු දිය හැකිය. **පොක්ඛරවණේ**- පියුම් වනයෙහි. **කද්දමං**- මැටි. **ඔසිඤ්චනස්ස**- තෙමන්නහුට. **අඞ්ගුට්ඨෙන**- මාපටැඟිල්ලෙන්.

**පඨම සඞ්ඝාදිසේසං නිට්ඨිතං.**

---

## 138 පිට.

**සමන්තා පරියාගාරෝ**- හාත්පස මණ්ඩලමාලයකින් පරික්ෂිප්ත වූ. **මජ්ඣෙ ගබ්භෝ**- මැද ගබඩාවක් වෙයි. **පරිවේණං**- පරිවේණ සඞ්ඛ්‍යාත ගෘහය. **සුසම්මට්ඨං**- මනාකොට අමදින ලද්දේ වෙයි. **විහාරපෙක්ඛකා**- විහාර බලන්නා වූ. **සපජාපතිකෝ**- බිරිඳ සහිත වූයේ. **අවාපුරණං**- යතුර. **සූචිකං**- අගුල. **උග්ඝාටෙත්වා**- හැර. **කවාටං**- කවුළුව. **පණාමෙත්වා**- විවෘත කොට. **එසනෙතෝ**- වසමින්. **ගබ්භං අනුපරිගන්ත්වා**- ගැබිය වටා ගොස්. **අඞ්ගමඞ්ගානි**- අවයවයන්. **නිච්ඡාරේසි**- නික්ම වීය. **උළාරත්තතා**- උදාර ආත්ම ඇති බවක්.

## 139 පිට.

**කුල සුණ්හාහි**- කුල යෙහෙළියන් සමග. **ඔතිණ්ණෝ**- කාය සංසර්ග රාගයට බටුයේ. **විපරිණතේන**- (කායසංසර්ග රාගය කාරණ කොට ගෙන) පෙරළුණු. **සමාපජ්ජෙය්‍ය**- පැමිණියේ නම්, **හත්ථගාහං වා**- අත (අල්වා) ගැනීමට හෝ. **වේණිගාහං වා**- (හෙතු නො ගෙතු) කෙහෙ අල්වා ගැනීමට හෝ. **අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා**- අනෙක් අවයවයක්. **පරාමසනං වා**- පරාමර්ශනයට ( අතගෑමට ) හෝ. **සාරත්තෝ**- ( කාය සංසර්ග රාගාපේක්ෂාවෙන්) අපේක්ෂා ඇත්තේ. **පටිබද්ධචිත්තෝ**- පිළිබඳ සිතැත්තේ. **රත්තම්පි**- රාගයෙන් ඇලුණා වූ ද **දුට්ඨම්පි**-

දෙව්ෂයෙන් දූෂිත වූ ද. **මූළහම්පි**- මෝහයෙන් මුළා වූ ද. **අපි ච**- එසේ නුමුත්. **මහනතාපි**- අතිශයින් මහත් සත්‍රියක් ගැන කියනුම කවරේ ද **අජඣාචාරෝ**- රාග වශයෙන් අභිභූත ව එයට පැමිණීම, එහි හැසිරීම. **ඛුප්පරං උපාදය**- වැලමිට පටන් ගෙන. **යාව අගගනබා**- නිය අගතෙක්. **වේණී**- කේශ කලාපය. **සුද්ධකේසාවා** හූ ආදියෙන් නො මුසු කෙස් හෝ. **සුත්තමිස්සාවා**- පස්වණින් යුත් හුයින් මුසු වූ කෙස් හෝ. **මාලාමිස්සාවා**- දෑසමන් ආදි මල්මාලා වලින් මුසු වූ හෝ. **හිරඤ්ඤමිස්සාවා**- කහවණු මාලාවෙන් මුසු කොට කරන ලද හෝ.

140 පිට.

**ආමසනමත්තා**- ස්පර්ශ කිරීම් මාත්‍රය යි. **සඤ්චෝපනා**- අත හෝ කාය හෝ හැසිරවීම. **ඔරෝපනා**- යටට බැස්වීම. **උද්ධං උච්චාරණා**- උඩට නැංවීම. **ඔනාමනා**- (කේශාදිය ගෙන සත්‍රිය) නැමීම. **ආවිඤ්ඡනා**- ( තමා අභිමුඛ කොට ) ඇදීම. **නිප්පීළනා**- පීඩා කිරීම. **කේනචි සහ නිප්පීළනා**- වස්ත්‍රාභරණාදි කිසිවක් සමග පෙළීම. **ඡුපනං**- ස්පර්ශ කිරීම. **වේමතිකෝ**- විමති ඇත්තේ.

147 පිට.

**පටිවිජානාති**- දනියි. **මොක්ඛාධිප්පායෝ**- මිදීමේ අදහස ඇත්තේ.

148 පිට.

**සුත්තිත්ථියා**- නිදිගත් සත්‍රියක ගේ. **මත්තිත්ථියා**- මළ සත්‍රියක ගේ. **දාරුධීතලිකාය**- කාෂ්ඨරූපයක්හු ගේ. **බාහාපරම්පරාය**- බාහු පරම්පරාවෙන්.

149 පිට.

**සඞ්කමං**- කුඩා හෙයක් ( හේ දණ්ඩක්) කෝෂ ග්‍රන්ථයන්හි දුර්ගස්ථානයට යන සොර මගැයි ද 'සඞ්කම' යයි කියනු ලැබේ. **පටිපථෙ**- පෙරමඟ. **අංසකූටේන**- කරෙන්. **අභිරූළ්හං**- නැංගා වූ. **ආවිඤ්ඡි**- ඇද්දේ ය **පණාමේසි**- බැහැර කෙළේ ය.

**දුතිය සඞ්ඝාදිසේසං නිට්ඨිතං.**

---

150 පිට.

**ආදිස්ස**- ගෙන හැර දක්වා. **ජිනනකා**- සිඳුණු ඔසප් ඇත්තාහු ද. **ධුත්තිකා**- කෛරාටික වූවාහු ද. **අහිරිකායෝ**- ලජ්ජාරහිත වූවාහු ද. **උහසන්තිපි**- මන්දහාස්‍ය ද කරත්.

ලලපන්තිපි- නානාවිධ ප්‍රලෝභ කථාද කරත්. උජ්ජග්ඝන්තිපි- මහ සිනාද සෙත්. උපසණ්ඩන්තිපි- මෙතෙම පණ්ඩකයෙකි, පුරුෂයෙක් නො වේ යනාදි වශයෙන් පරිහාස ද කරත්. හිරිමනා- ලජ්ජාසිත් ඇත්තාහු ද. නච්ඡනානං- නුසුදුසුය. දුමඞ්ගුලලාභි වාචාභි- (වසමග පසමග පිළිබඳ වූ) අසභ්‍ය තෙපුලින්. ඔභාසිස්සති- කියන්නේ ද.

යුවා- තරුණයෙක්. යුවතිං- තරුණියකට. මේථුනූප සංහිතානි- මෛථුන සන්නිශ්‍රිත වූ අසභ්‍ය බසින්. දුමඞ්ගුලලා දුමඞ්ගුලලං- සභ්‍යාසභ්‍ය තෙපුල්.

151 පිට.

ඛුංසේති- වචන නැමැති කෙවිටෙන් ගටයි. වම්භේති- ගරහයි. සුළසො- යහපත් ක්ෂණයක්. ජාරස්ස- සොර සැමියා හට. අනිමිත්තාසි- නිමිති රහිත වූයෙහිය. අලෝහිතාසි- වියලි ශ්‍රෝණිත ඇත්තියක් වන්නෙහිය. ධුවලෝහිතාසි- නිත්‍ය ලෝහිත වූයෙහිය; ධුවචෝලාසි- නිති බඟන ලද ආණි චෝලක යක් සේවනය කරන්නෙහිය. පග්ඝරන්තීසි- නිත්‍යයෙන් මූත්‍ර වැගිරෙන්නෙහිය. සිඛරිණීසි- පිටත නික්මුණු ආණිමාංස ඇත්තියක් වන්නෙහිය. ඉත්ථිපණ්ඩකාසි- අනිමිත්ත වූ නැනැත්තියක් වන්නෙහිය. වේපුරිසිකාසි- මශ්‍රැදයිකා ඇතිහෙයින් පුරුෂ ස්ත්‍රියක් වන්නෙහිය. සම්භින්නාසි- මිශ්‍ර වූ වසමග පසමග ඇත්තියක් වන්නෙහිය. උභතො බ්‍යඤ්ජනාසි- ස්ත්‍රී පුරුෂ නිමිත්ත අවයයෙන් යුක්ත වූයෙහිය.

152 පිට.

අධක්ඛකං- අකු ඇටයෙන් යට. උබ්භජානුමණ්ඩලං- දන මඩලෙන් උඩ. උබ්භක්ඛකං- අකු ඇටයෙන් උඩ. අධෝ ජානුමණ්ඩලං- දන මඩලෙන් යට. අත්ථ පුරෙක්ඛාරස්ස- අර්ථය පෙරටු කොට කියන්නහුට. ධම්ම පුරෙක්ඛාරස්ස- ධර්මය පෙරටු කොට කියන්නහුට. අනුසාසනි පුරෙක්ඛාරස්ස- අනුශාසනය පෙරටු කොට කියන්නහුට.

153 පිට.

නව රත්තං- අළුත් රතු වූ. ලෝහිතං මේ තේ භගිනී- නැගනිය තීගේ නිමිත්ත ලෙහෙවන්ය. ඛරලෝමං- තද ලොම් ඇති. කක්ඛස ලෝමං- කර්කශ ලොම් ඇත්තේ ය. නවාවුතං- අළුත වියන ලද. ආකිණ්ණ ලෝමං- ආකීර්ණ වූ ලොම් ඇත්තේ ය. පාවාරං- කොඳු පලසක්. වපාපෙන්ති- වපුරවා. වාපිතං- වපුරන ලද්දේ ද. මෙය අසද්ධර්මය සඳහා කියන ලදී. නෝ ච

**බෝ පටිවූළ්හකං**- නැවත නො වපුරන ලදී. පටිවූළ්හ නම් ප්‍රාණීන් විසින් නසන ලද බීජයන් ඇති කල්හි එසේ වූ ස්ථානයන්හි නැවත බීජ පිහිටුවීමාදිය යි. **සංසිරති**- වහනය වේ ද?

**තතිය සඞ්ඝාදිසෙසං නිට්ඨිතං-**

---

154 – 155 පිටු.

**මතපතිකා**- මළ සැමියා ඇත්තී. **යේන අත්ථෝ**- යමකින් ප්‍රයෝජන ඇත්තේ ද? **ඕවරකං**- ගබඩාවට. **උක්කණ්ඨා**- උඩු-කුරු වූවා. **වසලං**- හීන වූ. **ආමසිස්සති**- ස්පර්ශ කරන්නේ ද. **නිට්ඨුභිත්වා**- කාරා ( කෙළ දමා ) **අහං ඛොස්සා කේන හායාමි**- මම අනෙක් කවර නම් ස්ත්‍රියකට වඩා කිනම් භෝගයකින් හෝ අලඞ්කාරයකින් පිරිහෙම් ද? **අත්තකාම පාරිචරියාය**- තමා සඳහා මෙවුන් දම් සෙවීම් නැමැති රහස්‍ය කර්මයෙන් උපස්ථාන කිරීම පිළිබඳව. **වණ්ණිය** (ආනිසංස) **භගිනි**- නැගනියනි! **යා**- යම් ස්ත්‍රියක් තොමෝ. **සීලවන්තං**- සිල්වත් වූ. **බ්‍රහ්මචාරිං**- බ්‍රහ්මචාරි වූ. **කල්‍යාණධම්මං**- කල්‍යාණ ස්වභාව ඇත්තා වූ. **මාදිසං**- මා වැන්නෙකුට. **එතේන ධම්මේන**- මේ මෛථුන ධර්මයෙන්. **පරිචරෙය්‍ය**- උවටැන් කරන්නේ නම්. **එතං**- මේ මෛථුන ධර්මයෙන් උවටැන් කිරීම. **පාරිචරියානං**- පරිචර්‍යාවන් (= උපස්ථානයන්) අතුරෙන්. **අග්ගන්ති**- ශ්‍රේෂ්ඨ යයි. **මෙථුනූ-පසංහිතේන**- මෛථුන ධර්ම ප්‍රතිසංයුක්ත වූ වචනයෙන්. **වණ්ණං භාසෙය්‍ය**- යනු පද යෝජනා යි.

156 – 157 පිටු.

**වෙස්සිවා**- වෛශ්‍යජාතීය ස්ත්‍රියක් හෝ. **සුද්දිවා**- ශුද්‍ර ජාතීය ස්ත්‍රියක් හෝ. **කිං අහං තනෙත් අය්‍යස්ස දජ්ජාමි** යනු පද යෝජනා යි.

**චතුත්ථ සඞ්ඝාදිසෙසං නිට්ඨිතං.**

---

158 පිට.

**අප්පජාපතිකං**- බිරිඳක් නැත්තා වූ. **අපතිකං**- සැමියෙක් නැත්තා වූ. **පත්තා**- සුදුසුය. **කුමාරිකාය වත්තුං**- කුමාරිකාවට කියන්ට. **කිස්මිං විය**- (අපට) ලජ්ජාවක් මෙන් **ආවාහානිපි**- (දරුවෙකුට පර කුලයකින් දූරියක ගෙන ඒම් සඞ්ඛ්‍යාත) ආවාහයන් ද. **විවාහානිපි**- (තමන් ගේ දූරියක පර කුලයකට යැවීම් සඞ්ඛ්‍යාත) විවාහයන් ද. **වාරෙය්‍යානිපි**- විවාහය පිණිස රුචි කරවීම් හෝ දින නැකැත් ආදිය නියම කිරීම් ද **වත්තාජ්ජේත්ති**-

පවත්වයි. **පුරාණ ගණිකාය**- පැරණි ගණිකා භාර්‍යාවක ගේ. **තිරෝගාමකා**- පිටත ගම් වැසි වූ.

### 159 පිට.

**සුණිස භෝගේන**- යෙහෙළි පරිභෝගයෙන්. **දුසි භෝගේන**- දුසි පරිභෝගයෙන්. **භුඤ්ජිංසු**- පරිභෝග කළාහුය. **ආහාරූපහාරෝ**- ගැනීමක් හා දීමක්. **අපසාදිතා**- තර්ජනය කරන ලද්දී. **සමණේන**- ශ්‍රමණයා විසින්. **අබ්‍යාවටේන භවිතබ්බං**- මෙ වැනි කටයුතුවල නො යෙදුණෙකු වියයුතු යි. **සමණෝ**- ( එසේ වන්නා වූ ) ශ්‍රමණ තෙමේ. **සු සමණෝ අස්ස**- යහපත් ශ්‍රමණයෙක් වන්නේ ය.

### 160 පිට.

**සස්සුයා**- නැන්දනිය කාරණකොට ගෙන. **සසුරේන**- මාමා කාරණ කොට ගෙන. **ඕයාචන්ති**- (අවඥා සහගතව) ආයාචනය කෙරෙත්. **ඡ්ඩතු**- වැඩේවා. **සජ්ජිතා**- සියලු උපකරණයන් ගෙන් හා අලඞ්කාරාදියෙන් සැරසුණා හු. **භ[illegible]කානි**- යහපත් වූ. **ආයාචන්ති**- ( ප්‍රශංසා පූර්වකව ) ආයාචනය කරත්. **සඤ්චරිත්තං**- (ස්ත්‍රී පුරුෂයන් අතුරෙහි ආවාහ විවාහ වනු කැමති ස්ත්‍රී පුරුෂයන් ගේ පණිවිඩ පිළිගැනීම් විමසීම් නැවත ගෙන ඊම් ආදි ) සඤ්චරණ භාවයට. **සමාපජ්ජෙය්‍ය**- පැමිණියේ නම් කෙසේ ද? **පුරිස මතිං**- පුරුෂයා ගේ කැමැත්ත. **ඉත්ථියාවා**- ස්ත්‍රියට හෝ **ඉත්ථි මතිං**- ස්ත්‍රිය ගේ කැමැත්ත. **පුරිසස්සවා**- පුරුෂයාට හෝ. **ජායත්තනෙවා**- නිබඳ භාර්‍යා බැව්හි හෝ. **ජාරත්තනෙවා**- ජාර (= සොර සැමි) බැව්හි හෝ. **අන්තමසෝ**- යටත් පිරිසෙයින්. **තඞ්ඛණිකායපි**- එකෙණෙහි අභිරමණය කරනු කැමති ස්ත්‍රියකට ද ( පුරුෂයා ගේ පණිවිඩ ආදිය ) කියං නම්.

### 161. පිට.

**පරිචාරෙන්තා**- ඉන්ද්‍රියයන් හසුරු වන්නාහු. **වේසියා**- වෙසඟනක ගේ. **උය්‍යෝජෙස්සන්ති**- පිටත් කරන්නෝ ය. **අබ්භුතං අකංසු**- පරදු තිබීම ( = ඔට්ටු ඇල්ලීම ) කළාහුය.

### 162 පිට

**වසං වත්තෙන්ති**- සිය අණසක ඇය විෂය යෙහි පවත්වයි. **සගොත්තා**- සමාන ගොත්‍රයෙහි වූවෝ. **සහධම්මිකා**- එක් ශාස්තෘවරයෙකු උදෙසා පැවිදි වූ එක් ගණයකට අයත් වූවෝ.

ගබ්භේ ඨිතා- ගර්භයෙහි සිටිය දී ම. (මාගේ භාර්යාවයයි) **පරිග්ගහිතා**- පරිග්‍රහණය කරන ලද්දී. **මාලාගුණ-පරික්ඛිත්තාදි**- මල් දමකින් වට කරන ලද්දී ද. **කේනචි**- රාජාදි යම්කිසි කෙනෙකුන් විසින්. **දණ්ඩා**- දඩ. **ඡන්දවාසිනී**- තමාගේ කැමැත්තෙන් වාසය කරන්නී. **භෝගවාසිනී**- උදුකබල මුසලාදි වූ ගෘහෝපකරණ ලැබීමෙන් භාර්යාභාවයට යන ජනපද ස්ත්‍රියට නමකි මේ. **පටවාසිනී**- නිවාසන පිළි පුරණ මාත්‍රයක් ලදින් භාර්යාභාවයට යන දිළිඳු ස්ත්‍රියට නමකි මේ.

163 පිට.

**ඔදපත්තකිනී**- ස්ත්‍රී පුරුෂ දෙදෙනාම එකම දියබඳුනක අත් දමා මේ ජලය මෙන් එක්වූවාහු නොබිඳෙන්නෙමු යි කියා පාවාගත් ස්ත්‍රියට නමකි මේ. **ඔභත චුම්බටා**- හිස තුබූ සුඹුළුවක් බහා තබා වාසය කරවා ගනු ලබන ස්ත්‍රියට නමකි මේ. **කටඨහාරිකාදීනං දාසාදීනං**-සි අටුවා පාඨ යි. **ඔරෝපෙත්වා**-බහා තබා. **ධජාහටානාම**- ධ්වජයෙන් ගෙන එන ලද්දී නම්. **කරමරානීතා**- බලහත් කාරයෙන් ගෙන එන ලද ස්ත්‍රියයි. **මුහුත්තිකා**- මොහොතකට භාර්යා වන ස්ත්‍රිය. **පටිග්ගණ්හාති**- ආණාපකයාගේ සන්න පිළිගනියි **වීමංසති**- යවන ලද තැනට ගොස් එය කියයි. **පච්චාහරති**- නැවත අවුත් ආණාපකයාහට කියයි.

174-175 පිටු.

**සම්පාදේති**- පිළිගැනීමත් විමංසනයත් කරයි. **විසංවාදේති**- වරදවයි. **භණ්ඩිත්වා**- කලහ කොට. **සමෙමෝදනීයං අකාසි**- සළිත් සැමියා ගේ ගෙට යැමට සුදුසු ස්ත්‍රියක කෙළේය. **භික්ඛු**- භික්ෂුවක්. **අලං වචනීයා**- කරුණු නොකිය යුතු ස්ත්‍රියක් දැයි. **නාලං වචනීයා**- කරුණු නො කිය යුතු ස්ත්‍රියක් නො වේ. ඒ ඒ දනව්වල භාර්යාභාවයෙන් මුළුමනින් පහකළ ස්ත්‍රිය 'අලං වචනීයා' නම්වෙයි. කලහ විග්‍රහාදියෙන් සිත් අමනාප වී ගිය ස්ත්‍රිය 'නාලං වචනීයා' නම් වෙයි.

**පඤ්චම සඤ්චරිත්තසික්ඛාපදං නිට්ඨිතං.**

---

175 පිට.

**සඤ්ඤාචිකායෝ**- තමා ම ඉල්ලාගත් උපකරණ ඇති. **අස්සාමිකායෝ**- කරවා දෙන හිමියන් නැත්තා වූ. **අත්තුද්දේසිකායෝ**- තමා පිණිස වූ. **අප්පමාණිකායෝ**- මෙ පමණකින් අවසන් වන්නේය යි පිරිසිඳිනා ලද ප්‍රමාණයක් නැත්තා වූ.

පුරිසකාරං- පුරුෂයෙකු විසින් කළයුතු වූ ශක්තකර්මයක්.
උබ්බිජ්ජන්ති- උද්වේගයට, කම්පනයට පැමිණෙත්. අඤ්ඤේ-
නපි ගච්ඡන්ති- අන් මගකින් ද යෙති. අඤ්ඤේනපි මුඛං-
කරොන්ති- මුහුණ අන් අතකට ද කරවත්.

176 පිට.

අඞ්ගාලමෙව චෙතියෙ- අඞ්ගාලව නම් විහාරයෙහි. මණි-
කණ්ඨො නාගරාජා- (මහාඝවූ මැණිකක් බොටුවෙහි දැලද
හැසිරෙන හෙයින්) මණිකණ්ඨ නම් වූ නාරජ තෙමේ. භොගෙ-
හි- දරණ වැලින්.

177 පිට.

නාදස්සං- නො දත්තෙමි. අභියාචකො'සි- වඩා ඉල්
ලන්නෙක් වෙහිය. සක්ඛර ධොතපාණි- ගලෙහි මුවහත් කළ
කඩුවක් ඇති; සුසු- ශක්ති සම්පන්න වූ තරුණයෙක්; යථා-
යම්සේ ද; (එසේ) සෙලං- මැණික්ගල; යාචමානො- ඉල්ල
මින්; මා- මා; තාසයසි- භ්‍රාන්ත කෙලේ ය; නාදං තස්ස භොනා
ම අහොසි- එද ගියේ ම වූයේය;

178 පිට.

යස්ස- යමෙක්හුට; පියං- (යමක්) ප්‍රියය සි; ජිගිංසෙ-
දන්නේ ද; තං- එය; න යාචෙ- නො ඉල්වන්නේ ය; අභි-
යාචිතාය- වඩා ඉල්ලීමෙන්; දෙස්සො හොති- අප්‍රිය කෙ-
නෙක් වෙයි; බ්‍රාහ්මණෙන- පාපස බමුණා විසින්; නාගෙ-
නාරජහු (අතින්;) මණිං- මැණික; යාචිතො- ඉල්ලන ලද්
දේ ය; තං- එහෙයින්; අදස්සනඤ්ච එව- නො දැකීමට ද;
අජ්ඣගමා- ගියේය; සිමබග පහ- සියතුම් කාවෙජ් ද; තිතාපං-
පනත් වූ; පල්ලලං- ජලාශයක් පිය; මනාසකුණ යෙ යාසෙ- මහා
පසම් යමුගයත්; Cවිකා ගෙලා- පිඩිත වූයේ; අ ගොසෙ -
ගෙහෙට - වැද;

179 පිට.

රට්ඨපාල- රට්ඨපාලය! තෙ- යම් ඒ ජනපදයෙක්; මං-
මා තරා; සඞ්ගම්ම- එක්ව; යාචන්ති- ඉල්ලීම් කරත් ද; තෙ-
ඔවුන්; න ජානාමි- (නුවරහු ද නාගෙන් දුයි) නො දනිමි;
කස්මා- කුමන් හෙයින්; සං- තෝ; මං- මා අතින්; නායා-
චසි- නො ඉල්ලන්නෙහි ද;

යාචකො- ඉල්ලන තැනැත්තේ; අප්පියො හොති- අ-
ප්‍රිය වෙයි; යාචං- ඉල්ලන ලද්දේ; (නොහොත්) යාචිං- ඉල්ලන්

නාහට; අදදං- නොදෙන තැනැත්තේ; අප්පියෝ- අප්‍රිය වෙයි; තස්මා- එහෙයින්; අහං- මම; න යාචාමි- නො ඉල්ලමි; මෙ- මට; විදෙස්සනා මා අහු- අප්‍රිය භාවයක් නො වේවා;

ගිහීනං- ගිහීන් විසින්. භෝගානි- භෝගයෝ. දුක්ඛාභරණියානි- දුකසේ රැස් කළ යුත්තාහුය. සංහතානි පි- රැස් කරන ලද්දාහු ද. දුරනුරක්ඛියානි- දුකසේ ආරක්ෂා කළ යුත්තාහු ය.

සයංසංවිනාය- තමා විසින් ඉල්ලා ගන්නා ලද වැ පොරෝ ආදියෙන්; අස්සාමිකං- කරවා දෙන හිමියෙකු නැති හෙයින් අස්වාමික වූ; අත්තුද්දෙසං- තමා පිණිස කරවන බැවින් ආත්මෝද්දේශ කොට ඇති; කුටිං- කිළියක්; කාරයමානෙන- භික්ඛුනා පන- යනු පද යෝජනායි. පමාණිකා- ප්‍රමාණයෙන් යුත් කිළියක් හොමෝ; කාරෙතබ්බා- කරවිය යුත්තීය. තත්‍රිදං- ඒ කිළියෙහි; ඉදං පමාණං- මේ ප්‍රමාණය යි; දීඝසො- (ගිහිනැතිගෙහි දිගන) දිගින්; සුගතවිදත්ථියා- (මධ්‍යම පුරුෂයෙකුගේ අතින් එක් වියත් හමාරක් වූ) සුගත් වියතින්; ද්වාදස- විදත්ථියො- දොළොස් වියත් යහනි; තිරියං- සරස; අන්තරා- සිනනි ඇතුළෙහි; සත්ත- සත් වියතෙකි; උද්දෙසනාය- කුටියක් කරන බිම දෙසන පිණිස; භික්ඛූ- භික්ෂූන්; අභිනෙතබ්බා- එළවිය යුත්තාහ. තෙහි භික්ඛූහි- ඒ භික්ෂූන් විසින්; අනාරම්භං- (කුහුඹු සිවුපා ආදී උපද්‍රව රහිත බැවින්) නිරුපද්‍රව වූ; සපරික්කමනං- (බලිවද්ද යුත්ත යානයක් සිසාරව යා හැකි බැවින්) උපචාර සහිත වූ; වත්ථුං- කුටි වස්තුව; දෙසේතබ්බං- (ඤත්තිය දෙවන කොට ඇති කම්මවාචායෙන්) දෙසිය යුතුය; භික්ඛු- මානක් නොව; සාරම්භෙ- සෝපද්‍රව වූ; අපරික්කමනෙ- උපචාර නැත්තා වූ, වත්ථුස්මිං- කුටි වස්තුවෙහි; සයංසංවිනාය- තමා ඉල්ලන ලද වැ පොරෝ ආදී උපකරණයෙන්. කුටිං කාරෙය්‍ය- කුටියක් කරවූයේ වී නම්; වත්ථුදෙසනාය- කුටි වස්තුව දෙසනු පිණිස; භික්ඛූ වා අනභිනෙය්‍ය- භික්ෂූන් හෝ නො එළවූයේ වී නම්; පමාණං වා අතික්කාමෙය්‍ය- ප්‍රමාණය හෝ ඉක්මවූයේ වී නම්:

180 පිට.

උල්ලිත්තා වා හෝති- ඇතුළත ආලේප (සුණු පිරියම්) කරන ලද්දී හෝ වෙයි. අවලිත්තා වා- පිටත ආලේප කරන ලද්දී හෝ. උල්ලිත්තාවලිත්තා වා- ඇතුළත පිටත ආලේප කරන ලද්දී හෝ; බාහිරිමෙන මානෙන- (කුටි භිත්තියේ) පිටත සිට මැනීමෙන්. අබ්භන්තරිමෙන මානෙන- (භිත්තියේ පිටත කෙළවර

නො ගෙන) ඇතුළුත වූ කෙලවර සිට මැනීමෙන්; කංසපාතිවා- සමතලා වූ සිමා මණ්ඩලයක් මෙන්) ශුද්ධ කොට. සම්මන්නිතබ්බා- සම්මත කටයුත්තාහු ය.

181 පිට.

කිපිල්ලකානං- කුහුඹුවන් ගේ අාසයෝ හෝති- නිත්‍ය වාසස්ථානයක් වේ ද. උපචිකානං- වේයන් ගේ. උන්දූරානං- මීයන් ගේ. ගෝධිකානං- ගෝනුස්සන් ගේ. සතපදීනං- පත්තෑයන් ගේ. අමජ්ජානං- වලසුන් ගේ. තරච්ඡානං- කරබා නං වලසුන් ගේ. පුබ්බණ්ණ නිස්සිතං- සාලිව්‍රීහ්‍යාදි සප්තවිධ ධාන්‍ය වැඩෙන කෙතක හාත්පස වූ බිමක් ඇසුරු කෙලේ (හෝ වේ ද.) අපරණ්ණ නිස්සිතං- මුං මෑ ආදි අපරණ්ණ බීජයන් වැවෙන බිමක් ඇසුරු කෙලේ (හෝ වේ ද.) අබ්භාඝාත නිස්සිතං- කාරණා සරයක් හෙවත් චෝරාදී අපරාධ කරුවන් මැරීමට කරන ලද ගෙයක් ඇසුරු කෙලේ (හෝ වේ ද) සොරුන් මැරීම පිණිස කළ ගෙය 'අබ්භාඝාත' යයි කුරුන්දිය අටුවාවෙහි කියා තිබේ. ආඝාත නිස්සිතං- වධස්ථානයක් ඇසුරු කෙලේ (හෝ වේ ද.)

182 පිට

රාජවත්ථු- රජුන් අයත් භූමිය. පානාගාර- මත් පැන් හල. සූනානිස්සිතං- මස් විකුණන තැනක් ඇසුරු කෙලේ (හෝ වේ ද.) රච්ඡ- වීථිය. චච්චර- සතර මංසන්ධිය. සභා නිස්සිතං- බොහෝ දෙනා රැස් වන ශාලාවක් ඇසුරු කෙලේ (හෝ වේ ද.) සංසරණ නිස්සිතං- බොහෝ දෙනා හැසිරෙන ස්ථානයක් ඇසුරු කෙලේ (හෝ වේ ද.) යථා යුත්තේන සකටේන- සුදුසු පරිද්දෙන් ගවයන් දෙදෙනෙකු යොදන ලද ගැලකින්. කුරුන්දිය අටුවාවෙහි සතර දෙනෙකු යොදන ලද ගැලකින් යයි කියන ලදී. අනුපරිගන්තුං- වටා යන්නට. නිස්සේණියා- හිණෙකින්. ආයාමතෝ- දිගින්. විත්ථාරතෝ- පුළුලින්. අතික්කාමෙත්වා- ඉක්මවා. ඒකං පිණ්ඩං- එක් අවසාන ලේප පිණ්ඩය. ආපත්ති සඞ්ඝාදිසේසේන- සඞ්ඝාදිසේසා පත්තිය සමඟ. ද්වින්නං දුස්සකවානං- දුකුලා ඇවැත් දෙකකට.

183-190 පිටු.

සමාදිසති- නියම කරයි. විප්පකතානං- නොඑී නො නිම වන ලද්ද. පරියෝසාපෙති- අවසන් කරවයි. ලේනෝ- ලෙනක් මහත් කොට කිරීමෙහි ඇවැත් නො වේ. ගුහාය- ඉටය -සිලා- -දුරු- භූමි-ගුහාවන් අතරෙන් යම් කිසි ගුහාවක් ද මහත් කොට කිරීමෙහි වරද නො වේ.

**වාසාගාරං**– තමා ගේ වාසය පිණිස වූ ගෙය. **ඨපෙත්වා**– හැර. **සබ්බත්ථ**– අනෙක් භෝජනසාලං– උපෝසථාගාරාදිය මහත් කොට කිරී මෙහි දු ඇවැත් නො වේ.

**කුටිකාර සඞ්ඝාදිසේසං නිට්ඨිතං.**

---

## 190 පිට.

**චේතිය රුක්ඛං**– චෛත්‍ය සම්මත වූ පූජාහී වූ වෘක්ෂයක්. **ගාම පූජිතං**– ගමින් හෝ ගම විසින් පුදන ලද. **ජනපද- පූජිතං**– (එක් රජෙකු ගේ රාජ්‍යයක එක කොටසක් වූ) ජන පදයකින් පුදන ලද. **රට්ඨපූජිතං**– මුළු රටින් පුදන ලද. **ඒකින්ද්‍රියං ජීවං**– (කායෙන්ද්‍රිය නම් වූ) එක ඉන්ද්‍රියක් ඇති ජීව- යක්. **සස්සාමිකං**– (කාරවා දෙන හිමියෙකු ඇති හෙයින්) ස්වාමි සහිත වූ. **මහල්ලකං විහාරං**– (සංයාචිත කුටියට වඩා මහත් වූ හෙයින්) මහත් වූ විහාරයක්.

**විහාර කාර සඞ්ඝාදිසේසං නිට්ඨිතං.**

---

## 195 පිට.

**මල්ල පුත්තේන**– මල්ලරාජ පුත්‍ර වූ. **ආයස්මතා දබ්බේන**– ආයුෂ්මත් 'දබ්බ' ස්ථවිරයන් වහන්සේ විසින්. **ජාතියා**– උත්පත්තියෙන්. **යඤ්ච කිඤ්චි**– යම් කිසි (ත්‍රිවිජ්ජා- චතුප්පටිසම්භිදා– ෂළභිඤ්ඤා නවලෝකොත්තර ධම්ම යන ගුණ සමුදායයක්) වේ ද **සබ්බං**– ඒ සියල්ලට. **අස්ස**– උන්වහන්- සේ විසින්. **උත්තරිං**– මත්තෙහි. **කරණීයං**– කටයුතු වූ. **කිඤ්චි**– කිසිවක්. **නත්ථි**– නැත්තේ ද වෙයි. **කතස්ස**– කළ දෙය පිළිබඳ. **පතිචයෝ වා**– වැඩීමක් හෝ.

## 196 පිට.

**භත්තානි ච උද්දිසෙය්‍යං**– බත් ද උදෙසන්නෙම් නම්. **සභාගානං**– ගුණයෙන් සමාන වූ. **එකජ්ඣං**– එකට. **සුත්තන්තිකා**– සූත්‍රාන්ත හදරන්නෝ. **සඞ්ගායිස්සන්ති**– සඞ්ගා යනා කෙරෙත්. **විනිච්ඡිනිස්සන්ති**– විශ්චිතිය කෙරෙත්.

## 197 පිට.

**ඣායිනෝ**– ධ්‍යාන කරන සුලු වූවාහු වෙත් ද. **අඤ්ඤ- මඤ්ඤං නව්‍යාබාධිස්සන්ති**– ඔවුනොවුන්ට පීඩා නො කරන් නාහු ය. **තිරච්ඡාන කථිකා**– (දෙතිස් වැදෑරුම්) තිරශ්චීන

කථා ඇත්තාහු. **කායදළ්හි බහුලා**- කය දැඩි කිරීම බහුල කොට ඇත්තාහු. **ඉමාය'පි රතියා**- මේ තිරශ්චීන කථා රතියෙනුදු. **අවජිස්සන්ති**- හිඳින්නාහු ය. **තේජෝධාතුං සමාපජ්ජිත්වා**- තේජෝ කසිණය අරමුණු කොට ඇති සිවුවන ධ්‍යානයට. **අපිස්සු**- වැළිදු. **අපදිසන්ති**- කියත්.

රජගහ නුවර වටා සිටි පර්වත වල භාග්‍යවතුන් වහන්සේ හා තවශ්‍රාවක ගණයාත් වුසූ තැන් විය. ඉන් සමහරක්ය මෙහි දක්වුණේ එනම්:- චෝරපපාතය, ඉසිගිලි පර්වත පාශ්ර්වයෙහි වූ කාලා සිලාව, වේභාර පර්වත පාශ්ර්වයෙහි වූ සප්තර්ණී ගුහාව, සීතවන නම් විශාල මිනී පිට්ටනිය සමීපයෙහි වූ සප්පසොණ්ඩික පබ්භාරය, ගෝතම කන්දරය, තින්දුක කන්දරය, තපෝද කන්දරය, යන මේවායි.

**තපෝදාරාමේ**- තපෝද නම් උනුදිය උල්පත අසළ වූ ආරාමයෙහි. **ජීවකම්බවනේ**- රාජ වෛද්‍යයෙක් වූ කෝමාරභච්ච ජීවක තුමා විසින් පුදන ලද අඹවනයෙහි. **අඞ්ගුලියා ජලමානාය**- ඇවිලෙන්නා වූ, දිලිසෙන්නා වූ ඇඟිල්ලෙන් යුතුව. **පුරතෝ**- ඉදිරියෙහි. **පානීයං**- පියයුතු පැන්ය. **පරිභෝජනීයං**- මුඛ ධෝවනාදි පරිභෝග කටයුතු පැන්ය. **කත්තරදණ්ඩෝ**- සැරයටි දණ්ඩය. **කථිකා සණ්ඨානං**- සාකච්ඡාදිය පවත්වන ස්ථානය. **මෙත්තිය භුම්මජකා**- මෙත්තිය - භුම්මජක - යන භික්ෂූන් දෙදෙන. **නවකාචේ ව**- නවකයෝ වූවාහු ද.

198 පිට.

**අභිසඞ්ඛාරිකං**- නානා සම්භාරයන් ගෙන් යුක්තවූ මනා කොට සකස් කරන ලද. **උත්තරිභඞ්ගම්පි**- අවුළුපත් ද. **සඵාරණං**- කුඩු ආදී ද්‍රව්‍ය සහිත වූ ලෙසින්. **බිලඞ්ග දුතියං**- කාඩි හොද්ද දෙවනු කොට ඇති. **කණාජකං**- නිවුඩු සහ ලින් පිසූ බත්. **පාකතිකං**- ස්වාභාවික පරිදි ම. **කල්‍යාණභත්තිකෝ**- (ප්‍රණීතව දන් දෙනු ලබන හෙයින්) 'කල්‍යාණ භත්තික' යයි ප්‍රසිද්ධ වූ. **චතුක්ක භත්තං**- බත් සතරක්. **නිච්ච භත්තං**- නිති බත් වසයෙන්. **සපුත්ත දාරෝ**- පුත්‍ර දාරාවන් සහිත වූ යේ. **උපතිට්ඨිත්වා**- සමීපයෙහි සිට. **උද්දිට්ඨං හෝති**- උදෙසන ලද්දේ වෙයි. **භත්තිකා**- බත් ඇත්තෝව. **කොට්ඨකේ**- දොර කොටුවෙහි. **චිත්තරූපං**- සිත් වූ පරිදි.

199 පිට.

**න භත්තං සිද්ධං භවිස්සතී'ති**- බත් පිළිවෙළ වූයේ නොවන්නේ යයි. **උපගඤ්ජි**- වෙත එළඹියේය. **පරිභින්නා**- බිඳින

ලද්දුහුය. බ්හාරාම කොට්ඨකේ- වේළුවන විහාරයා ගේ බිහි දෙර කොටුවෙහි. සඞ්ඝාටි පලලත්ථිකාය- සඟළ සිවුරෙන් අසාවටු අවුළුවා හිඳිමෙන්. මඞ්කුභූතා- මකු වූවාහු පත්තක්ඛන්ධා පහතට හෙළූ ග්‍රීවා ඇත්තාහු. පජ්ඣායන්තා- සිතිවිලි සිතන්නාහු. අප්පටිභානා- වැටහීම් රහිත වූවාහු. අහං- මම අය්‍යානං- ආර්යයන්ට. කිං අපරජ්ඣාමි- කිනම් අපරාධයක්, වරදක්. කෙරෙම් ද අජ්ඣුපෙක්ඛසි- උපේක්ෂා වන්නෙහි. අනීතිකා- උපද්‍රව රහිත වූවා ද. යතෝ- යම් දෙසක. නිවාතං- වාතය රහිත් වී ද. තතෝ- ඒ දෙස. පවාතං- මහා වාතයක් පැන නැංගේ ය. උදකං- ජලය. ආදිත්තං- මඤ්ඤේ- ගිනි ඇවිලුණාක් මෙනි. දූසිතා අම්හි- දූෂණය කරන ලද්දී වෙමි.

200 පිට.

දබ්බ- දබ්බය ! ත්වං- තෝ. ඒවරූපං- මෙබන්දක්. කත්තා- කොළෙහි. සරසි- සිහි කරන්නෙහි ද? භගවා- භාග්‍ය වත්න් වහන්සේ. යථා- (ක්ෂීණාශ්‍රව බැවින් මගේ මෛථුන සේ වනයක් නැත්තේ යයි) යම් පරිද්දෙකින්. මං- මා. ජානාති- දන්නේය. දබ්බා- පණ්ඩිතයෙහි. ඒවං- මෙසේ පරප්‍රත්‍යයෙන්. න බෝ නිබ්බෙඨෙන්ති- නිරවුල් නො කෙරෙත්. අහං- මම. යතෝ- යම් කාලෙක. ජාතෝ- උපන්නෙම් ද. සුපිනන්තේනාපි- සිහිනෙනු දු. මේථුනං ධම්මං- මෙවුන් දම්. පටිසේවිතා- සේවනය කෙළෙ. න ජානාමි- නො දනිමි. ජාගරෝ- නිදිවර්ජිත වූයේ. පගේව- කියනු ම කවරේ ද. නාසේථ- (ලිඞ්ග නාශනයෙන්) නසව්. ඉමේ ච භික්ඛූ- මේ භික්ෂූනු ද. අනුයුඤ්ජථ- පරීක්ෂා කරව්. චාවනාධිප්පායේ හි- (ශාසනයෙන්) චුතකිරී මේ අදහස් ඇත්තා වූ.

යෝ පන භික්ඛු- යම් මහණෙක්. දුට්ඨෝ- දෙව්ෂයෙන් දූෂිත වූයේ. දෝසෝ- මෙරමා දූෂිත කරන්නේ. අප්පතීතෝ- ප්‍රීති සුඛාදියෙන් අපගත වූ යේ. තං- ඒ පුද්ගලයා. ඉමම්හා බ්‍රහ්මචරියා- මේ උතුම් චරියාවෙන්. චාවෙය්‍යං- පහ කෙළෙම් නම්. අපේව නාම ඉති- ඉතා යෙහෙකැ යි. භික්ඛුං- භික්ෂුවක් හට. අමූලකේන- දැකීම් - ඇසීම් - දැනීම් - සංඛ්‍යාත මුල් රහිත හෙයින්) අමූලික වූ. පාරාජිකේන ධම්මේන- එක්තරා පරිජි ඇවතකින්. අනුද්ධංසෙය්‍ය- චෝදනා කෙරේ නම්. තතෝ- ඒ චෝදනා කළ සමයයෙන්. අඤ්ඤේන සමයේන- අනෙක් සමයයෙක්හි. සමනුග්ගාහියමානෝ වා- ('කිනෙත් දිට්ඨං' යනාදීන්) විචා-

රනු ලබන්නේ හෝ. **අසමනුග්ගාහීයමානෝ වා**- නො විචාරනු ලබන්නා වූ හෝ. **භික්ඛු ච**- (චෝදනා කළ) භික්ෂු- තෙමේ ද. **දොසං පතිට්ඨාති**- ('තුච්ඡකං මයා භණිතං' යනා- දීන් තමා ගේ) දෝෂය ප්‍රතිඥා කෙරේ ද. **අධිකරණඤ්ච**- (පාරාජිකා සඞ්ඛ්‍යාත) ආපත්තාධි කරණය ද. **අමූලකඤ්චෙව හෝති**- (දෘෂ්ටාදී) මූල රහිත වේ ද.

201 පිට.

**අනභිරද්ධෝ**- නො සතුටු වූයේ. **ආහත චිත්තෝ**- ගැටුණු සිතැත්තේ. **ඛිලජාතෝ**- ද්වේෂ ඛිල හටගත්තේ. **අදිට්ඨං**- (ප්‍රසාද චක්ෂුසින් හෝ දිවැසින්) නො දක්නා ලද. **අසුතං**- (එසේ ම කිසි වෙකු විසින් කියන ලදුව) නො අසන ලද. **අපරිසඞ්කිතං**- සැක නො කරන ලද. **විවාදාධිකරණං**- '**ඉධ භික්ඛූ විවදන්ති ධම්මෝ'ති වා අධම්මෝ'ති වා**' යනාදීන් දක්වන ලද අටළොස් භේදකර වස්තූන් නිසා උපන් විවාදය විවාදාධි කරණ නම්. **අනුවාදාධිකරණං**- සීල-ආචාර ආජීව - දිට්ඨි - විපත්තීන් නිසා උපන් අනුවාදය අනුවාදාධි කරණ නම්. **ආපත්තාධිකරණං**- පඤ්චාපත්තිස්කන්ධය හෝ සප්තාපත්තිස්කන්ධය ම ආපත්තාධි කරණ නම්. **කිච්චාධිකරණං**- අපලෝකන කම්ම - ඤත්ති කම්ම - ඤත්තිදුතිය - ඤත්තිචතුත්ථ- කම්ම යන සිවු වැදෑරුම් සඞ්ඝකෘත්‍යය ම කිච්චාධි කරණ නම්. **අජ්ඣාපජ්ජමානෝ**- පැමිණෙන්නේ. **අජ්ඣාපන්නෝ අසි**- පැමිණියේ වෙහි.

202 පිට.

**දිට්ඨං නෝ සාපෙජ්ජති**- දක්නා ලද්ද නො අදහසි. **නාසරති**- සිහි නො කරසි. **පම්මුට්ඨෝ හෝති**- යමෙකු ඒ ඒ උපාය වලින් සිහි කරවනු ලබන්නේ ද සිහි නො කෙරේ ම ය.

204 පිට.

**අනෝකාසං කාරාපෙත්වා**- අවකාශ නො කරවා. **ඕමසවාදේන**- ජාත්‍යාදියෙන් ගටා බිණීම පිළිබඳයෙන්.

**අමූලක සඞ්ඝාදිසේසං නිට්ඨිතං.**

---

205 පිට.

**අජිකාය**- එළුදෙනක හා. **විප්පටිපජ්ජන්තං**- අසද්ධර්ම යෙහි යෙදෙන්නා වූ. **ඡගලකං**- එළුවෙකු. **සුතේන**- ඇසී මෙන්.

### 206 පිට.

අඤ්ඤභාගියස්ස- (මනුෂ්‍යජාති භික්ෂුභාව කොට්ඨාසාදියෙන් අන්‍ය වූ) තිරිසන් ජාති ඡකලක භාවාදි භාග ඇති. අධිකරණස්ස- දබ්බ මල්ල පුත්තාදී නාමකරණයට වස්තු වූ ඡකලකාදීහු ගේ. කිඤ්චිදේසං ලේසමත්තං- ස්වල්පදේශයක් වූ ලේශමාත්‍රයක්. උපාදය- චෝදනා කරනු පිණිස ගෙන. උපාදින්නො- (චෝදනා කරනු පිණිස) ගන්නා ලද්දේ වේ ද.

### 207 පිට

ආපත්තඤ්ඤභාගියං වා හෝති- ආපත්ති වශයෙන් අන්‍යභාගිය, අන්‍යපාක්ෂික හෝ වේද. අධිකරණඤ්ඤභාගියං වා- අධිකරණ වශයෙන් අන්‍යභාගිය වූයේ හෝ වේ ද. තබ්භාගියං- තත්පාක්ෂික වූයේ.

### 208. 209. 211. පිටු.

සාටක පත්තධරෝ- ලෝහ පාත්‍ර සමාන වූ සුසංස්ථාන වූ භ්‍රමරවර්ණ මෘත්තිකා පාත්‍රයක් දරන්නෙක්. සුම්භක පත්තධරෝ- ප්‍රකෘති මැටි පාත්‍රයක් දරන්නෙක්. ගහපති චීවරධරෝ- ගෘහපතියන් විසින් දුන් සිවුරු දරන්නෙක්. සේනාසනවාසිකෝ- සෙත සුනෙහි වසන තැනැත්තේ. කථාසඤ්ඤී- පරිජී ඇවතම ම පැමිණියේය යන සංඥා ඇත්තේ.

සඞ්ඝභේදං- සඞ්ඝභේදය. චක්කභේදං- ආඥාභේදය.

නවම සඞ්ඝාදිසේසං නිට්ඨිතං

---

### 212. පිට.

ඕසරෙය්‍ය- බසින්නේ නම්. තං- ඒ භික්ෂුව. වජ්ජං- ද්වේෂය තෙමේ. ඡුසෙය්‍ය- ස්පර්ශ කරන්නේ ය. නිමන්තනං- යමෙකු ගේ නිමන්ත්‍රණයක්. ඡන්නං- පියසි ආදියෙන් ප්‍රතිච්ඡන්න වූ සෙනසුනකට. සඤ්ඤාපෙස්සාම- දන්වන්නෙමු. ලූඛප්පසන්නා- කටුක ප්‍රතිපත්තියෙහි පැහැදුණාහු මෙන්. තිකෝටි පරිසුද්ධං- (අදිට්ඨ- අසුත- අපරිසඞ්කිත යන) කොළවර තුනකින් පිරිසුදු වූ. උදග්ගො- උස්වූ කාය චිත්ත ඇතියේ.

### 213. පිට

බාහුලිකෝ- චීවරාදි ප්‍රත්‍යය බාහුල්‍යය ඇත්තේය. භේදන සංවත්තනිකං වා අධිකරණං- අමලොස් භේදකර

වස්තුවක් හෝ; සමාදය- (භේද කරනු පිණිස) ගෙන;
පග්ගය්හ- දැඩි කොට ගෙන; සෝ භික්ඛු- ඒ(භේදක) මහණතෙම;
භික්ඛූහි- ලජ්ජී භික්ෂූන් විසින්; ඒවං- මෙසේ; වචනීයෝ අස්ස-
කියයුතු වන්නේය; මා පරක්කමි- උත්සාහ නො කරව;
මා අට්ඨාසි- නො සිටුව; ආයස්මා- ආයුෂ්මත් තෙමේ; සඞ්ඝේන-
සඞ්ඝයා හා; සමේතු- එක් වේවා; කුමක් නිසාදයත්? හි- ඒ
එසේ මැයි; සඞ්ඝෝ- සඞ්ඝ තෙමේ; සමග්ගෝ- සමගි වූයේ,
ඒකුද්දේසෝ- එකවූ පැමිණි පාමොක් උදෙසීම් ඇත්තේ;
සම්මෝදමානෝ- (ශීලාදීන් ගේ පරිපූර්ණත්වයෙන්) සතුටු
වනුයේ; අවිවදමානෝ- විරුද්ධවාද නො කරන්නේ. ඵාසු-
සුවසේ; විහරති- වාසය කරයිද එහෙයිනි; තස්ස පටිනිස්සග්ගාය
ඒ දෘෂ්ටිය දුරලීම පිණිස; යාව තතියං- තෙවන වර තෙක්;
සමනුභාසිතබ්බෝ- සමනු භාෂණ කර්ම්ය (ඥප්තිය සතර
වන කොටඇති කර්මවාක්‍ය කියා භික්මවීම) කටයුත්තේ යි.
ගණංබන්ධති- ගණ බන්ධනය කෙරේ ද. අට්ඨාරස භේදකර
වත්ථූනි- අටළොස් භේද කර වස්තූනු. "1 අධම්මං ධම්මෝති
දීපෙන්ති- 2 ධම්මං අධම්මෝති දීපෙන්ති- 3 අවිනයං විනයෝති දීපෙන්ති 4 විනයං අවිනයෝති දීපෙන්ති- 5 අභාසිතං අලපිතං තථාගතේන භාසිතං ලපිතං තථාගතේනාති
දීපෙන්ති- 6 භාසිතං ලපිතං තථාගතේන අභාසිතං- අලපිතං තථාගතේනාති දීපෙන්ති- 7 අනාචිණ්ණං තථාගතේන
ආචිණ්ණං තථාගතේනාති දීපෙන්ති- 8 ආචිණ්ණං තථාගතේන අනාචිණ්ණං තථාගතේනාති දීපෙන්ති- 9 අපඤ්ඤත්තං තථාගතේන පඤ්ඤත්තං තථාගතේනාති දීපෙන්ති- 10
පඤ්ඤත්තං තථාගතේන අපඤ්ඤත්තං තථාගතේනාති
දීපෙන්ති- 11 අනාපත්තිං ආපත්තීති දීපෙන්ති- 12 ආපත්තිං-
අනාපත්තී ති දීපෙන්ති- 13 ලහුකං ආපත්තිං ගරුකා ආපත්ති ති දීපෙන්ති- 14 ගරුකං ආපත්තිං ලහුකා ආපත්තීති
දීපෙන්ති- 15 සාවසේසං ආපත්තිං අනවසේසා ආපත්ති ති-
දීපෙන්ති- 16 අනවසේසං ආපත්තිං සාවසේසා ආපත්ති ති-
දීපෙන්ති- 17 දුට්ඨුල්ලං ආපත්තිං අදුට්ඨුල්ලා ආපත්ති ති දීපෙන්ති 18 අදුට්ඨුල්ලං ආපත්තිං දුට්ඨුල්ලා ආපත්ති ති දීපෙන්ති-"
දක්වන ලද මොවුහුට අටළොස් භේදකර වස්තූනු වෙති.

සඞ්ඝභේද සඞ්ඝාදිසේසං නිට්ඨිතං.

---

215 පිට.

තස්සේව ඛෝ පන භික්ඛුස්ස- ඒ සඞ්ඝභේදයට උත්සාහ
කරන භික්ෂුහට වනාහි; අනුවත්තකා- (ඔහුගේ දෘෂ්ටිය ගැනී-

මෙන්) අනුව පවත්නා වූ; **වග්ගවාදකා**- අසමගි තෙපුල් කියන්නා වූ; **භික්ඛූ**- භික්ෂූහු; **එකෝ වා**- එකෙක් හෝ; **ද්වේ වා**- දෙදෙනෙක් හෝ; **තයෝ වා**- තිදෙනෙක් හෝ; **හොන්ති**- වෙද්ද **තේ**- ඒ භික්ෂූහු; **ඒවං වදෙය්‍යුං**- මෙසේ කියන්නාහු නම්; **කො සේද?** **ආයස්මන්තෝ**- ආයුෂ්මතුනි! **ඒතං භික්ඛුං**- මේ භික්ෂුහට **කිඤ්චි**- කිසිවක්; **මා අවචුත්ථ**- නොකියව් **ඒසෝ භික්ඛු**- මේ මහණ තෙමේ; **ධම්මවාදී ච** ධර්මයද කියයි. **ඒසෝ භික්ඛු**- මේ මහණ තෙම; **විනයවාදී ච**- විනයද කියයි; **ඒසෝ භික්ඛු**- මේ මහණ තෙම; **අම්හාකඤ්ච**- අප ගේ ද; **ඡන්දඤ්ච**- කැමැත්ත (අදහස) ද; **රුචිඤ්ච**- රුචිය ද; **ආදාය**- ගෙන; **වෝහරති**- ව්‍යවහාර කරයි; (කියයි) **නෝ**- අප ගේ; (ඡන්දිය) **ජානාති**- දනියි; **භාසති**- කියයි; **අම්හාකං අපි**- අපටද; **ඒතං**- මෙය; **ඛමතීති**- රුචිවෙයයි **තේ භික්ඛූ**- ඒ සඞ්ඝභෙදානුවර්තික භික්ෂූහු; **ආයස්මන්තෝ**- ආයුෂ්මතුනි; **ඒවං**- මෙසේ; **මා අවචුත්ථ**- නො කියව්; **ඒසෝ භික්ඛු**- මේ මහණ තෙම; **ධම්මවාදී ච න**- ධර්මය කියන්නේත් නො වෙයි. **විනයවාදී ච න**- විනයකියන්නේත් නො වෙයි; **ආයස්මන්තානං**- ආයුෂ්මතුන්ටත්; **සඞ්ඝභේදෝ**- සඞ්ඝභේදය; **මා රුච්චිත්ථ**- රුචි නො වේවා; **ආයස්මන්තානං**- ආයුෂ්මතුන් ගේ; (සිත්) **සඞ්ඝේන**- සඞ්ඝයා හා; **සමේතු**- ඒකීභාවයට යේවා, කුමක්හෙයින්ද යත්? **සඞ්ඝෝ**- සඞ්ඝතෙම; **සමග්ගෝ හි**- සමගි වූයේ; **සම්මෝදමානෝ**- සතුටුවනුයේ; **අවිවදමානෝ** (මේ ධර්මය වේ මේ අධර්මයවේ යයි) විවාද නොකරන්නේ; **ඒකුද්දේසෝ**- එකට පැවති පාමොක් උදෙසීම් ඇත්තේ; **ඵාසු**- සුවසේ; **විහරතීති**- වාසය කරන්නේය යි; **ඒවං වචනීයා අස්සු**- මෙසේ කියයුත්තෝ වන්නාහුය; **ඒවඤ්ච**- මෙසේත්, **භික්ඛූහි**- (ලජ්ජී)භික්ෂූන් විසින්; **වුච්චමානා**- කියනු ලබන්නාවූ; **තේ භික්ඛූ**- ඒ භික්ෂූහු, **තථා ඒව**- එසේ ම; **පග්ගණ්හෙය්‍යුං**- දැඩිකොට ගන්නාහු නම්, **තේ භික්ඛූ**- ඒ භේදානුවර්තික භික්ෂූහු තුඹූ; **භික්ඛූහි**- සෙසු භික්ෂූන් විසින්; **යාවතතියං**- තුන්යලක්; **තස්ස පටිනිස්සග්ගාය**- ඒ දෘෂ්ට්‍යාදිය හරනා පිණිස; **සමනුභාසිතබ්බා**- සමනු භාෂණ කර්මය කටයුත්තාහුය.

**අනුවත්තක සඞ්ඝාදිසේසං නිට්ඨිතං.**

---

**අනාචාරං**- (අනේක ප්‍රකාර කාය වචීද්වාර ව්‍යතික්‍රම (සඞ්ඛ්‍යාත) අනාචාර යෙහි.

218 පිට.

**අභිසම්භිතෝ**- අවබොධ කරන ලද්දේය. **වායමානො**- හමන්නේ. **තිණකට්ඨපණ්ණසටං**- ඒ ඒ තැන වැටුණු තණ වියලි

දබු පරණලා; එකතෝ- එකට; උස්සාරෙය්‍ය- රැස් කරන්නේ ද; 'උස්සාදෙය්‍ය' යනුද පාඨයකි; පබ්බතෙය්‍යා- පර්වතයකින් ගලා බසින්නාවූ; නදී- ගඞ්ගාවක් තොමෝ; සඞ්ඛ- දික් මූල් ඇති කොල සෙවෙල්; සේවාල- නිල් සෙවෙල්; පණකං- අවසේස වූ උදක පප්පට තිල බීජාදිය; එකතෝ උස්සාරිතා- එක් ස්ථානයක රැස් කරන ලද්දුන.

භික්ඛු පන එව- භික්ෂුවක් වනාහි. දුබ්බච ජාතිකෝ- හෝති- දුර්වචස් සවභාවය (නොකීකරු ගතිය) ඇත්තේ වේද; උද්දේස පරියාපන්නේසු- ප්‍රාතිමෝක්ෂෝද්දේශයෙහි ඇතුළත් වූ; සික්ඛාපදේසු- ශික්ෂාපදයන්හි ලා; භික්ඛූහි- ලජ්ජීභික්ෂූන් විසින්; සහධම්මිකං- සහ ධර්මයෙන්; (ශික්ෂාපදයෙන්) වුච්චමානෝ- කියනු ලබන්නේ; අත්තානං- තමා; අවචනීයං- නො කියයුත්තෙකු; කරෝති- කෙරේද; ආයස්මන්තෝ- ආයුෂ්මත්වරුනි ! කල්‍යාණං වා පාපකං වා- යහපතක් හෝ අයපහතක් හෝ කිඤ්චි- කිසිවක්; මං- මට; මා අවචුත්‍ථ- නොකියව්; මම වචනාය- මට (කරන) අවවාදයෙන්; විරමථ- වෙන් වව්; භික්ඛූ- භික්ෂූන්ට; සහධම්මෙන- ප්‍රඥප්තිසඞ්ඛ්‍යාත ශික්ෂාපදයෙන්; එවං- මෙසේ; යදිදං- යම් මේ; අඤ්ඤමඤ්ඤ වචනේන- අන්‍යොන්‍ය අනුශාසනා වෙන්; (යදිදං- යම්මේ) අඤ්ඤමඤ්ඤ වුට්ඨාපනේන- අන්‍යෝන්‍යයන් ඇවතින් නගාලීමෙන්; තස්ස භගවතෝ- ඒ භාග්‍යවත්හු ගේ; පරිසා- පිරිස් තොමෝ; සංවඩ්ඪාහි ඉති- (ශීලාදීන් කාරණකොට ගෙන) අභිවෘද්ධිවන්නී ම යයි.

දුබ්බචස්ස කරණීයේහි- දුර්වචභාවය කරන්නාවූ. අක්ඛමෝ- අවවාද නොඉවසන්නේ. අප්පදක්ඛිණග්ගාහී- (අනුශාසනා ලෙස නො පිළිපදිනා හෙයින් අනුශාසනාව) නුහුරුව ගන්නේ.

දුබ්බච සඞ්ඝාදිසේසං නිට්ඨිතං

---

## 220 පිට.

අස්සජි පුනබ්බසුකා නාම- අස්සජිය- පුනබ්බසුකය යන නම් ඇති භික්ෂූහු දෙදෙන, කිටාගිරිස්මිං- එනම් ජනපදයෙහි, ආවාසිකා හොන්ති- ආවාස ඇත්තාහු වෙත්. මාලාවච්ඡං- තරුණ මල්ගස්. රෝපෙන්තිපි- තුමූ ද රෝපනය කරත් සිඤ්චන්තිපි- තුමූ ද දිය ඉසිත්. ඔචිනන්තිපි- තුමූ ද කඩා රැස් කෙරෙත්, ගන්ථෙන්තිපි- තුමූ ද (මල්දම් ආදිය) ගොතත්

ඒකතෝවණ්ටිකමාලං– මල් නැටි එකතු කොට කළ මල් දමක්. උභතෝවණ්ටිකමාලං– දෙපසෙහි මල් නැටි යොදා කළ මල්දමක් මඤ්ජරිකං– මල් කැනක් සේ කළ පුෂ්ප විකෘතියක්. විධූතිකං– හිදි කටුවෙකින් හෝ ඉර ටුවකින් හෝ සිඳුවාර පුෂ්පාදිය විද කරන ලද මාලාමය පිලන්ධනයක්. වටංසකං– සෑම මතුවෙහි පැලඳීම පිණිස කළ පුෂ්ප විකෘතිය, මේ ටීකානුගත අර්ථයයි කෝෂ ග්‍රන්ථයන්හි මුදුන් මල්කඩට ද 'වටංසක'– යයි කියනු ලැබේ. උරච්ඡදං– මුතුහරක් සමාන වූ ළෙහි පළඳනා පුෂ්ප දාමය. හරන්ති– ගෙනයත්. ඒකථාලකේ'පි– එක් තලියෙහි දු. තුවට්ටෙන්ති– හොවිත්. ඒකත්ථරණා'පි– එක් ආස්තරණය ඇත්තාහු ද. ඒකපාපුරණා'පි– එක් පොරෝනය ඇත්තාහු ද. ලාසෙන්ති'පි– ලාස්‍ය නෘත්‍යය ද නටත්.

221 පිට

නච්චන්තියා'පි නච්චන්ති– නටන්නියට අනුව ඒ භික්ෂූහු ද නටත්.

අට්ඨපදේ'පි කීළන්ති– (ගැබි අට අට බැගින් සූසැට ගැබෙන් ඇති) දූ පෝරු (දාං ලෑලි) ආදියෙහිදු කෙළිත්. දසපදේ'පි– (ගැබි දසය දසය බැගින් අසූ ගැබක් ඇති) දූ පෝරු ආදියෙහි දු (කෙළිත්.) ආකාසේ'පි කීළන්ති– (අට පද දස පද දූ පෝරු නැතිව) ඒ අහසේ ඇතියේ සලකා කෙළිත්. පරිහාරපථේ– කව්ටි පැනුම් ක්‍රීඩාවෙහු දු (කෙළිත්.) සන්තිකාය– එකට තුබුණු දූ කැට හෝ ගල් ගොඩ නො සොල්වා නියෙන් ඇදීම හා යළිත් ඇතුළු කිරීමෙන් කරනු ලබන ක්‍රීඩාවෙහු දු (කෙළිත්.). ඛලිකාය– දූ පෝරුවේ පසැටින් කෙළීමෙන් කරනු ලබන ක්‍රීඩාවෙහු දු (කෙළිත්.) ඝටිකේන– (සිං කෙළියෙන්) දික් දණ්ඩකින් කුඩා දණ්ඩකට ගැසීමේ ක්‍රීඩාවෙහු දු (කෙළිත්.) සලාකහත්ථේන– ලාකදිය පිටිදිය ආදියෙහි ඉරටු මිටියක් ගලා බිම හෝ බිත්තියෙහි ගසා ඇත් අස් රූප දක්වාලීමේ ක්‍රීඩාවෙන්. අක්ඛේන– පන්දු කෙළියෙන්. පඞ්ගචීරේන– කොළ නළා පිඹීමෙන්. වංකකේන– ගම් දරුවන් ගේ කුඩා නඟුලෙන් කරනු ලබන ක්‍රීඩාවෙන්. මොක්ඛචිකාය– කරණම් පැනීමෙන් පිඞ්ගුලිකේන– පුළුං පෙති කර කැවීමෙන්. පත්තාළ්හකේන– කොළ නැළියෙන් මැනීමෙන්. රථකේන– කුඩා රථයෙන්. ධනුකේන– කුඩා දුන්නෙන් (විදීමෙන්.) අක්ඛරිකාය– අහසේ හෝ පිටේ අකුරු ඇඳ කියවීමෙන්. මනේසිකාය– සිතූ දෑ කීමෙන්. යථාවජ්ජේන– කණුන්

කොරුන් පිළුන් ආදීන් සේ ඉරියව් දක්වා ක්‍රීඩා කිරීමෙන්. **හත්ථිස්මිම්පි**- හස්ති ශිල්පයෙහි ද. **ධනුස්මිම්පි**- දුනු ශිල්පයෙහි ද. **ථරුස්මිම්පි**- කඩු ශිල්පයෙහි ද. **ආධාවන්ති**- ආපසු දුවත්. **උස්සෙළෙන්ති පි**- මුඛයෙන් මහත් අව්‍යක්ත ශබ්දයනු දු පවත් වත්. (සිවුරු හබ ලත්) **'උසෙස් ළෙන්ති'**- යනු ද පාඨ යකි. **අප්ඵොටෙන්ති**- නමන ලද වම් අතෙහි දකුණු අතින් ගසා ශබ්ද කරත්. **නිබ්බුජ්ඣන්ති**- මල්ල යුද්ධ කෙරෙත්. (මල්ල පොර බැදීම) **මුට්ඨීහි**- මිටින් ගහගැනීමෙන්. **නලාටිකම්පි දෙන්ති**- යහපත භගිනිය යයි කියමින් සිය නළලෙහි ඇඟිල්ල තබා ස්ත්‍රිය ගේ නළලෙහි දු එය තබත්.

**පාසාදිකේන**- ප්‍රසාද එළවන්නා වූ. **අභික්කන්තෙන**- ඉදිරි ගමනින්; **පටික්කන්තෙන**- පෙරළා ඊමෙන්; **ආලෝකිතේන**- ඉදිරියෙහි බැලීමෙන්; **විලෝකිතේන**- ඔබ මොබ බැලීමෙන් (යුතුව.) **ඔක්ඛිත්ත චක්ඛු**- යටට හෙළන ලද ඇස් ඇත්තේ. **අබල බලෝ විය**- අතිශය මන්දධාතුකයෙකු මෙන්. **මන්ද මන්දෝ විය**- (අභික්කන්තාදි යෙහි අනුද්ධත භාවය හේතු කොට ගෙන) අතිශය සියුමැලි වූ වෙකු මෙන් (මෙයින් ගුණයක් ම දෝෂ වශයෙන් දැක්විණි.) **භාකුටික භාකුටිකෝ විය**- හකුළු වන ලද මුහුණු ඇත්තේ කුපිත වූවෙකු මෙන් වූයේ. **අයං කෝ**- මේ කවරෙක් ද.

**සණ්හා**- දක්ෂයහ. **සුඛ සම්භාසා**- සුව එළවන කථා ඇත්තාහු. **සඛිලා**- මධුර වචන සම්පන්නයෝ වෙති. **මිහිත පුබ්බඞ්ගමා**- සිනාව පෙරටු කොට කථා කරන සුලු වූවාහු. **ඒහි ස්වාගත වාදිනෝ** (උපාසකයෙකු දැක) එව තොපට යහපත් ගමනක් වේවා කියන්නාහු. **අබ්භා කුටිකා**- හකුළු වන ලද මුහුණු යුත් සවභාව යෙන් තොර වූවාහු. **අපි ලබ්භති**- ලැබේ ද?

222 පිට.

**දන්ත පන්තීනි**- තිබද පැවැති දත් වැටවල්. **උපචිජ්ඣන්තානි**- සිදුනාහු (අත් හැරුණාහු) වෙත්. **පිළන්ධන්ති**- ඉවත්ව යත්. **සණ්ඨපෙස්සං**- මනා කොට පිහිටන්නේ නම්. (ඒ පිණිස) **සම්ඤ්ඤාසුඛා**- ගිව්ස.

234 පිට.

**පබ්බාජනීය කම්මං**- (කුල දූෂණාදි කම් කළ වුන් ඒ නගර ග්‍රාමාදියෙන් බැහැර කිරීම නම් වූ) පබ්බාජනීය කර්මය **සාරේතබ්බා**- සිහි කරවිය යුත්තාහ. **චොදේතබ්බා**- ආපත්තිය

ආරෝපණය කට යුත්තාහ. **කුල දූසකා**- (පුෂ්ප දානාදි වශයෙන්) කුලයන් දූෂණය කරන්නාහු. **පාප සමාචාරා**- ලාමක සමාචාර ඇත්තාහු. **සූයන්ති ච**- අසනු ලැබෙත් ම ය.

225 පිට.

**න සම්මා වත්තන්ති**- (න උපසම්පාදේතබ්බාදි වශයෙන් නියමිත අටළොස් වතුත්හි) මනාකොට නො පවතිත්. **න ලෝමං පාතෙන්ති**- පතිත වූ මාන ලොම් ඇත්තෑහු නොහොත් භික්ෂූන්ට අනුකූල වූවාහු නො වෙත්. **න නෙත්ථාරං වත්තන්ති**- කළ කර්මයෙන් ඉවත් වීමට සුදුසු මගෙහි නො පිළිපදිත්. **ඡන්දගාමිනා**- ඡන්දගාමිත්වයෙන්. **පාපෙන්ති**- පමුණුවත්. (යොදවත්.)

226 පිට.

**පබ්බාජෙන්ති**- බැහැර කෙරෙත්. **චුණ්ණෙන**- නහන සුණු වලින්. **වෙජ්ජිකාය**- වෙදකමින්. **ජඞ්ඝ පේසනිකේන**- ගිහීන් ගේ ලියුම් ආදිය ගෙන යෑමෙන්. **තිරොක්ඛා**- අසම්මුඛයෙහි.

**කුල දූසක සඞ්ඝාදිසෙසං නිට්ඨිතං.**

---

**නව පඨමාපත්තිකා**- ව්‍යතික්‍රම ක්ෂණයෙහි ම පැමිණිය යුතු ඇවැත් නව දෙනෙකි. **චත්තාරෝ යාව තතියකා**- තුන් වැනි සමනුභාෂණයෙහි පැමිණිය යුතු ඇවැත් සතර දෙනෙකි. **පටිච්ඡාදේති**- (ප්‍රකාශ නො කොට) සඟවා ද. **යාවතිහං**- යම් පමණ දවස්. **ජානං**- දන්නේ. **තාවතිහං**- එපමණ දවස්. **අකාමා**- නො කැමැත්තෙනු දු. **පරිවත්ථබ්බං**- පිරිවෙස් විසිය යුතුයි. **ඡාරත්තං**- සරැයක්. **භික්ඛුමානත්තාය**- භික්ෂූන්ට බුහුමන් කිරීම පිණිස. **චිණ්ණමානත්තෝ**- පුරන ලද මානත් ඇති. **යත්ථ**- යම් සීමාවෙක්හි. **වීසතිගණෝ භික්ඛුසඞ්ඝෝ**- විංශතිවර්ගික භික්ෂු සඞ්ඝතෙම. **සියා**- වන්නේ ද. **අබ්භෙතබ්බෝ**- (අබ්භාන කර්ම විසින්) ඇතුළත් කටයුතුයි. **තත්ථ**- ඒ සඞ්ඝාදිසේසා පත්තියෙහි. **අයං**- මේ (පිරිවෙස් විසීමාදිය.) **සාමීචි**- (ලෝකෝත්තර ධර්මානුගත) ප්‍රතිපත්තියෙකි.

**තේරසකං නිට්ඨිතං.**

---

229 පිට.

ඕවරකේ- ගබඩාවෙහි. අලං කාමමනියේ- මෛථුනයට සුදුසු වූ. කාමෙසු- කෙළෙය. කාලඤ්ඤුතං- කාලාන්තරූප සේ. සමුල්ලපන්තෝ- ගේහ සිත කථා උල්ලපනය (කථනය) කරමින්. බහුනතා- බොහෝ මුණුබුරන් ඇත්තියකි. අග්ගමඞ්ගල සම්මතා- උතතම මඞගල සම්මත වූවාය. යඤ්ඤෙසු- දන ප්‍රදනයන්හි. ඡණෙසු- ආවාහ විවාහ මඞගලාදී උත්සවයන්හි. උස්සවෙසු- ආසාළ්හි පවාරණාදි මහෝත්සවයන්හි. නේන ධම්මෙන- එබඳු නිෂ්ඵලාදි ස්වභාවයෙන්. අනත්ථිකෝ- ප්‍රයෝජන නැත්තෙකි. දූසංදූසා ගතං- දූතසේ ඇදහ විය යුත්තාහ. නා දිසි- (වචනය) නො පිළිගත්තේ ය.

230 පිට.

කොරකිලිසා ව- පැලලීඅදි ද්‍රව්‍යයකින් හෝ. උප නිසිනෙනා- සමීපයට එළඹ හුන්නේ. උපක්කිණෙතා- සමීප යට එළඹ හොත්තේ උභෝ වා කිඩිනසා හොනති- දෙදෙනා ම පෙර පසු නො ව හුන්නාහු හෝ වෙද්ද

231 පිට.

ආගත ඵලා- ලබන ලද සෝතා පත්ති ඵලය ඇත්තී. අභිසමෙතාවිනී- ප්‍රතිවේධ කරන ලද සිවුසස් ඇත්තී. විඤ්ඤාත සාසනා- දන්නා ලද ශික්ෂාත්‍රය සඞ්ඛ්‍යාත ශාසන ඇත්තී.

පඨමෝ අනියතෝ නිට්ඨිතෝ.

---

236 පිට.

තිංස නිස්සග්ගියා පාචිත්තියා- තිස් නිසගි පචිති ඇවැත්හු. ගෝතමකෙ චෙතියෙ- ගෝතමක යක්‍ෂයා ගේ චෛත්‍යස්ථාන යෙහි කළ විහාරස්ථානයෙහි. අතිරෙක හි තිචීවරෙන- (විහාරයෙහි වසන කල සඟ තභානෝත්තරණාදියෙහි දරනු ලබන තුන් සිවුරෙන්) අන්‍ය වූ තුන් සිවුරකින් යුතුව ම. අනිට්ඨිතා චීවරං- නො ඉටූ නො විකැපූ සිවුරක්.

237 පිට.

කිවචිරං- කොපමණ දිගු කලකින්. දසාහ පරමං- දස දිනක් පරම කොට ඇති (දස දවසකට වැඩි නොවන කාලයක්.

**භික්ඛුනා**- භික්ෂුව විසින්. **නිට්ඨිත චීවරස්මිං**- සිවුර කොට නිම කරන ලද කල්හි. **කඨිනේ උබ්භතස්මිං**- කඨින චීවරය උදුළු කල්හි. **අතික්කාම යතෝ**- ඉක්ම වන්නාහට. **නිස්සග්ගියං පාචිත්තියං**- (නිසගි වූ වස්තුව සඞ්ඝයාහට හෝ පුද්ගලයෙකුට හෝ) නිස්සජනය (පැවරීම) කොට ඇවැත් දෙසා පිරිසුදු විය යුතු වූ පචිති ඇවත වේ. **චීවරාසා**- අසවල් කුලයෙහි සිවුරක් ලබමියි පවත්නා සිවුරු පිළිබඳව ආසාවක්. **උපච්ඡින්නාවා**- සිඳුනේ හෝ වේද. **අට්ඨන්නං මාතිකානං**- 1 පක්කමනන්තිකා, 2 නිට්ඨානන්තිකා, 3 සන්නිට්ඨානන්තිකා, 4 නාසනන්තිකා, 5 සවණන්තිකා, 6 ආසාවච්ඡේදිකා, 7 සීමාතික්කමනන්තිකා, 8 සහුබ්භාරා,- යි දක්වන ලද කඨිනෝද්ධරණයට හේතු වූ මාතෘකා අට අතරෙන්. **උබ්භතං හෝති**- උද්ධරණය කරන ලද්දේ වේ ද. **අන්තරා**- අතරතදී. **ඡන්නං චීවරානං**- ඛෝම- කප්පාසික- කෝසෙය්‍ය- කම්බල- සාණ- භඞ්ග- යන සිවුරු සයෙන්. **විකප්පනූපගපච්ඡිමං**- විකල්පනයට පොහෝනා පශ්චිම වූ. **බුද්ධානං**- වැඩි මහලු. **නිස්සට්ඨචීවරං**- නිස්සජනය (පැවරීම) කළ සිවුර.

238 පිට.

**අවිලුත්තෙක්**- බලහත් කාරයෙන් පැහැර නොගත් කල්හි.

**චීවර වග්ගේ කඨින සික්ඛාපදං නිට්ඨිතං.**

---

238 පිට.

**සන්තරුත්තරේන**- අඳනය සහ තනිපට සිවුර යන දෙකින් යුතුව. **ඛණ්ඩාඛණ්ඩිකානි**- ඛණ්ඩදියෙන් තෙමුණු ස්ථානයන්හි හටගත් කළු සුදු මණ්ඩලාකාර සටහන් ඇත්තාහු. **ඔත්ථතෙන්ති**- අව්වෙන් තවත්.

239 පිට.

**ඒකරත්තම්පි**- එක් රැයකුත්. **විප්පවසෙය්‍ය**- විසෝව (වෙන්ව) වෙසේ නම්. **අවිප්පවාස සම්මුතිං**- වෙන්ව විසීමේ දෝෂාභාව සම්මුතිය.

240 පිට.

**අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා**- සඞ්ඝසම්මුතියක් (සඞ්ඝයාගේ නියමයක්) නැතිව. **ඒක කුලස්සගාමෝ**- එක් රජෙකු

ගේ හෝ ගම්මුදලියෙකු ගේ හෝ ගමක්. **හත්ථපාසා**- (දෙරියන් හමාරක් පමණ වූ) අත් පසින් **නානාකුලස්සගාමෙ**- **නොයෙක්** රජවරුන්ගේ හෝ නොයෙක් ගම්මුදලියන් ගේ ගමක්. **සභායෙ වා**- රැස්වීම් ශාලාවෙහි හෝ. **ද්වාරමූලෙ වා**- නගරද්වාර සමීපයෙහි හෝ.

241 පිට

**නිවෙසනං**- වසනා ගෙය. **උදොසිතෙ**- යානාදි භාණ්ඩ තබන ශාලාව. **අට්ටෙ**- විරුද්ධ රාජාදීන් ගේ ප්‍රතිඝාතය පිණිස ගඩොලින් සාදා සන භිත්ති ඇති ගෘහ විශේෂයකි. **මාලෙ**- එක් කර්ණිකාවකින් සංග්‍රහ කොට කරන ලද සිවුරැස් පහය. **පාසාදෙ**- දික් පහය

242 පිට.

**හම්මියං**- සඳලු සහිත ගෙය. **සත්තබ්භන්තරා**- අබතුර හතක්, එක් අබතුරක් අට විසි රියනකි. **පස්සෙ**- පාශ්වීය කින්, **ඛන්ධස්සාරණං**- සාමත. **ආරාමෙ**- පුෂ්පාරාමය හෝ ඵලාරාමය.

243 පිට

**ඡායා**- සෙවනැල්ල. **එරති**- පැතිරේ ද. **අගාමකෙ අරඤ්ඤෙ**- නො ගම්හි අරණ්‍යයෙහි, වින්ධ්‍යාටවී ආදීන්හි සහ සමුද්‍ර මධ්‍යයෙහි කෙවුල් ජනයා නොයන ප්‍රදේශයෙහි ද අගාමක අරණ්‍ය ලැබෙයි. **විප්පවුත්ථෙ**- විප්පවාසයෙහි. **අපච්චුද්ධටෙ**- පච්චුද්ධරණය නො කළ කල්හි.

**චීවර වගෙන් උදොසිත සික්ඛා පදං නිට්ඨිතං.**

---

243 පිට.

**නප්පහොති**- නො පොහොනේ වෙයි. **උස්සාපෙත්වා**- ඔසොවා. **විමජ්ජති**- මඩියි, මේ භික්ෂුව රැලි නැසුණු කල්හි. සිවුර විශාල වේ ය යි. සිනා ජලයෙන් තෙමා පයින් මැඩ ඔසොවා පිටෙහි නොයෙක් වර ගැසීය. එහෙයින් **උස්සාපෙත්වා විමජ්ජති**, යයි කියන ලදී.

244 පිට.

**චීවරපච්චාසා**- (සිවුරක් ලබමියි යන) ආශාවක්. **අකාලචීවරං**- නො කල් සිවුරක්. **නික්ඛිපිතුං**- තැන්පත් කොට

තබන්ට. **භණ්ඩිකාබද්ධානි**- පොදි බදනා ලද්දහු.

**චෙ- ඉදින් පාරිපූරි නෝ අස්ස**- සම්පූර්ණ භාවය නො වී නම් (නොසෑ හේ නම්.) **නේන භික්ඛුනා**- ඒ භික්ෂුව විසින්. **ඌනස්ස පාරිපූරියා**- ඌනත පූරණය (අඩුව සම්පූර්ණ කිරීම) පිණිස. **සතියා පච්චාසාය**- (සිවුරක් ලබමි යි යන) ආසාවක් ඇති කල්හි. **මාසපරමං**- මසක් පරම කොට ඇති කාලයක්. **නික්ඛිපිතබ්බං**- (නො ඉවා නො විසාපා) තැන්පත් කොට තැබිය යුතුයි. **ඒකාදස මාසෙ**- (චීවර මාසය හැර) සෙසු එකොළොස් මාසයෙහි. **සත්ත මාසෙ**- (චීවර මාසය හා හේමන්ත ඍතුවෙහි සාරමස ද හැර) සෙසු සත් මසෙහි.

245 පිට.

**ආදිස්ස දින්නං**- සඞ්ඝයාට හෝ එක් පුද්ගලයෙකුට හෝ මේ අකාල චීවරය දෙමි යි දෙන ලද, (සිවුර ද) **තදහුප්පන්නේන් මූල- චීවරේ**- එදවස උපන් මූල චීවරය ඇති කල්හි. **දසාහා**- දස දවසකින් **විසභාගේ උප්පන්නෙ මූල චීවරේ**- සියුම් ආදිවශයෙන් අසමානව. උපන් මූල චීවරය ඇති කල්හි. **අකාමා**- නො කැමැත්තෙන්.

**චීවරවග්ගේ තතිය කඨින සික්ඛාපදං නිට්ඨිතං.**

---

246 පිට.

**අභික්ඛණං**- නිතර. **භත්තවිස්සග්ගං**- බත් උදරයට ප්‍රවේශ කිරීම, බත් කිස යයි සේයි. **සාරත්තො**- රාගයෙන් ඇලුණේ. **උපනිජ්ඣායි**- බැලීය. **අසුචි**- ශුක්‍ර. **ඒක දේසං**- එක් කොටසක්. **පක්ඛිපි**- දැමීය. **පුරාණ චීවරං**- (මද කුදු වැලඳ ගැන් මෙන්.) පැරණි වූ සිවුරක්.

247 පිට.

**අඤ්ඤාතකෝ**- නො නෑ වූවෙක්. **පතිරූපං**- සුදුසු දෙය. **පාසාදිකං**- ප්‍රසාද එලවන දෙය. **අඤ්ඤාතිකාය භික්ඛුනියා**- නො නෑ මෙහෙණක ලවා. **රජාපෙය්‍ය වා**- රදන් කරවා නම්, (-පඬු පොවවා නම්) හෝ. **ආකෝටාපෙය්‍ය වා**- (ශිලාමය වූ හෝ දරුමය වූ හෝ පුවරු ආදියෙක) ගස්වා නම් හෝ. **යාව සත්තමා පිතාමහ යුගා**- සත් වන මුත්තනු යුගය දක්වා. **උභතෝ සඞ්ඝෙ**- භික්ෂුනී සඞ්ඝයා කෙරෙහි සහ භික්ෂු සඞ්ඝයා කෙරෙහි ද. (අෂ්ටවාචික විනය

**කම්යෙන්)** **පාරුතමපි-** පොරෝනා ලද්දද.

248 පිට.

**නිසීදන පච්චත්ථරණං-** නිසී දනය හා පසතුරුණ. **අවුත්‍තා-** නොකියන ලද්දී.

**චීවර වග්ගෙහි පුරාණ චීවර සික්ඛාපදං නිට්ඨිතං.**

---

**කතකම්මා-** කරන ලද සොර කම් ඇත්තාහු. **චෝරගාමණිකෝ-** සොර දෙටු තෙමේ. **වරමංසානි-** උතුම් මාංස. **පකෝක්-** පිසුණු කල්හි. **පණ්ණපුටං-** කොළ ගොටුවක්. **උපස්සයං-** වාසාගාරයට. **භණ්ඩිකං-** පොදියක්. **පච්චුට්ඨාසි-** නැගී සිටියේය. **විහාරපාලෝ-** විහාරපාලකයාව **ඔහියකෝ-** අවශේෂ වූයේ, විහාර පාලන වාරය පැමිණ ඒ පිණිස හුදෙකලාව විහාරයෙහි සිටියේය' යනු එලිතාර්ථයි.

249 පිට.

**කිච්ඡලාභා-** දුකයේ ලැබෙන ලාභ ඇත්තෝ වෙමු. **සංවෙජ්-** (ඇතුන්ගේ) බඳ පටියෙහි. **සජ්ජයං-** ඇලෙන්නේ ද **කිස්ළියමානා-** දැඩිව පෙළනු ලබන්නී. **පාතිවට්ටකචීවරං-** මාරුකිරීමෙන් දෙනු ලබන සිවුර. **අසංඤ්ඤුත පාතිවට්ටකා-** (යටත් පිරිසෙයින් අරළු කඩ කුදු දී) මාරු කර ගැනීමක් නැතිව.

**චීවරවග්ගෙහි චීවර පටිග්ගහණ සික්ඛාපදං නිට්ඨිතං.**

---

251 පිට.

**පවෙවාං හෝති-** දක්‍ෂයෙක් වෙයි. **කිසම්ං විය-** කිලේසයක් මෙති, තිරි ඔතප් වශයෙන් කම්පනයක් මෙති, වත්මානයෙහි 'තිකම් මොකක්ද වගේ' යන ව්‍යවහාරයට සමානය. **ඉතෝ සුන්දරතරං වා-** මෙයට වඩා සුන්දර වූවක් හෝ.

252 253 පිටු.

**අච්ඡින්දිංසු-** පාත්‍ර චීවරාදිය පැහැර ගත්හ. **යථාභගගාව-** භගනයෝව ම. **අනුඤ්ඤාසි-** විචාරව. **විහාර චීවරං වා-** විහාර චීවරය හෝ, ශ්‍රද්ධාවත් බෞද්ධයෝ තමන් කරවනලද ආවාසයන් හි භික්ෂූන්ගේ පරිභෝගය පිණිස තුන්

සිවුරු පිළිවෙළ කොට තබත්, එයට විහාර චීවරයයි කියනු ලැබේ. **උත්තරත්ථරණං**- (මඤ්ච පීඨාදියෙහි මත්තෙහි අතුරන) උත්තරාස්තරණයක්. **භිසිච්ඡවි**- ගුදිරි උරයක්.. **ඕදහිස්සාමීති**- (පසුව) බනා තබන්නෙමියි. **අච්ඡින්න චීවරෝ වා**- (චෝරාදීන් විසින්) පැහැර ගන්නා ලද සිවුරු ඇත්තේ හෝ. **නට්ඨ චීවරෝ වා**- (ගිනිආදියෙන්) නැසුණු සිවුරු ඇත්තේ හෝ. **චූළකං හෝති**- හසං ශෙත යතා ලද්දේ වේද.

**අඤ්ඤාතක විඤ්ඤත්ති සික්ඛාපදං නිට්ඨිතං.**

---

254 පිට.

**මත්තං**- ප්‍රමාණය. **අභිහට්ඨුං**- කයින් හෝ වචසින් එළවා. **සන්තරුත්තර පරමං**- අඳනය හා පොරෝණය (තනිපට සිවුර) පරම කොට ඇති. **තතෝ**- ඒ එළවූ සිවුරු වලින් **උත්තරිං**- වැඩියක්.

**තතුත්තරි සික්ඛාපදං නිට්ඨිතං.**

---

255 පිට.

**අහං**- මම. **යං**- යමක් **න පරිභුඤ්ජිස්සාමි**- පරිභෝග නො කරන්නෙම් ද. **තේන**- එයින්. **අහං**- මම. **අවජානෙනී පි**- ආවජාදනය කරන්නේ තමුදු. **කිං කරිස්සාමි**- කෙසේ කරන්නෙම් ද. **විකප්පං**- අධික විධානයට.

256 පිට.

**චීවර චේතාපන්නං**- සිවුරු මිලක්. **උපක්ඛටං හෝති**- රැස් කොට තබන ලද්දේ වේද. **චේතාපෙත්වා**- විකිණී ගෙන. **කල්‍යාණ කම්‍යතං උපාදාය**- යහපතක් කැමති බව සිතීන් ගෙන. **වලිකෝ**- පලිගුවක්. **පටකෝ**- වසත්‍රයක්. **විත්ථතං**- පළල. **අප්පිතං**- සන.

**උපක්ඛට සික්ඛාපදං නිට්ඨිතං.**

---

258 පිට.

**අඤ්ඤාතකානං**- නො නැවූ. **උභින්නං ගහපතීනං වා**- ගෘහපතීන් දෙදෙනෙකු විසින් හෝ. **පච්චේක චීවර චේතාපන්නා**- වෙන වෙන සිවුරු මිල. **උභෝ ඒව සන්තා**- (තෙපි)

දෙදෙනම එක්ව. ඒකේන- එක් සිවුරකින්.

දුතිය උපක්ඛට සික්ඛාපදං නිට්ඨිතං.

260 පිට.

කාලේන- සුදුසු කාලයෙහි. සණ්ණඤ පෙසා- දන්වා. නිද්දිසි- දක්වීද. න අවචාසි- නො කියං. නේගමස්ස- නියම් ගම් වාසීන් ගේ. සමයෝ හෝති- සංගමයක් වෙයි. පඤ්ඤ සං බන්ධෝ ඉති- පණසක් දඩය යි; 'බද්ධ' යනුදු පාඨයි. අජ්ජුණ්හෝ ආගමේහි- අද එක දවසක් ඉවසුව මැනවං ඕ වට්ටිකාය- ඔවැටියෙන්. පරාමසි- ගත්තේය.

261 පිට.

රාජ භොග්ගෝ වා- රාජාමාත්‍යයෙක් හෝ. චීවරත්ථි කේන- සිවුරෙන් ප්‍රයෝජන ඇත්තා වූ. සාදේතබ්බෝ -සිහි කරවිය යුත්තේය. අභිනිපජ්ජාදෙය්‍ය- නිපදවීනම් (සම්පාද-නය කෙළේ නම්.)

262 263 පිටු.

න අනුහෝති- නො නිපයයි. ඨානං භඤ්ජති- ආ කරුණ තසියි. ආයස්මන්තෝ- ආයුෂ්මත් හු. සකං- ස්වකීය ධනයට.) පුප්ජන්තු- පැමිණෙත් වා. මා විනස්ස- නො නැසේ වා.

රාජ සික්ඛාපදං නිට්ඨිතං.

චීවර වග්ගෝ පඨමෝ.

264 පිට.

කෝසිය කාරකෝ- කෝසිය හුවලින් වස්ත්‍රාදිය කරන්නා වුන් කරා. කෝසකාරකෝ- කෝෂ කාරක ප්‍රාණීන්. පචථ- පිසව්. කෝසිය මිස්සකං- කෝසෙය්‍ය නූල් මිශ්‍ර කරන ලද. සන්ථතං- ඇතිරියක්. ආජීවස්ස හේතු- ජීවත් වීම හේතු කොට ගෙන. සංඝාතං- වැනසුමට. ආපාදේමු- පැමිණෙවු ද. අවායිමං- නො වියන ලද. සන්ථරිත්වා- අතුරා. කතං හෝති- කරන ලද්දක් වෙයි, සන්ථතය වනාහි සම බිමක කෝසිය හු මතුමත්තෙහි අතුරා එහාටෙක සවිවීම පිණිස කැඳ ආදී යමක් වත් කොට (ඉස) පිළිවෙල කර ගත

සුත්තකී. කෝසියංසුනා- කෝසිය නූලකින්.

කෝසියවග්ගෙ කෝසිය සික්ඛාපදං නිට්ඨිතං.

---

265 266 පිටු.

සුද්ධකාළකානං- හුදු කළු වූ. අනෙත් ආදියිත්වා- කොළවර (තුවාවක් මෙන්) අල්වා.

සුද්ධකාළක සික්ඛාපදං නිට්ඨිතං.

---

ගෝචරියානං- කිඹුල් වර්ණ වූ, කාළක ඕදාත වර්ණවත් ලෝම් හැර සෙසු වර්ණවත් එළලොම් කපිල වර්ණයෙහිම ඇතුළත් වෙයි.

267 පිට.

ද්වෙ තුලා- තුලා දෙකක්. අනුවස්සං- වසක් පාසා.

268 පිට.

ඌහදන්ති' පි- උච්චාර කර්මය ද කෙරෙත්. උම්මිහන්ති පි- පස්සාව කර්මය ද කෙරෙත්. ඔජ්ජන්ති- කනු ලබත්. එතර්හි- මෙපිට (මෑත කාලයෙහි.) විස්සජ්ජෙය්‍ය වා- (කිසි කෙනෙකුට) දී හෝ.

ඡබ්බස්ස සික්ඛාපදං නිට්ඨිතං.

---

271 272 පිටු.

පඤ්ඤායිස්සති- ප්‍රකට වන්නේය. පිහෙන්තා- කැමති වන්නාහු. උජ්ඣිත්වා- හැර. අනාදා- නො ගෙන. සදසං- දසා සහිත වූ. වට්ටං වා- වට වූ (රවුම් වූ) කොටසක් හෝ.

නිසීදන සන්ථත සික්ඛාපදං නිට්ඨිතං.

---

273 274 පිටු.

උප්පණ්ඩිංසු- කවට කම් කළහ. කිත්තකෝ උදයෝ- කොපමණ වැඩීමක්. තිට්ඨතෙව- සිටියේම. ආසුම්භි- බිම හෙළිය. හාරකෝ අසන්තෙත් අපි- ගෙන යන්නෙකු නැති කල් හිත්. අච්ඡින්නං- සොරුන් පැහැර ගන්නා ලද්දක්. කාව

භණ්ඩං- කළ භාණ්ඩයක්.

එළක ලෝම සික්ඛාපදං නිට්ඨිතං.

---

විජටාපෙන්ති- අවුල් හරවත්. විසුවනන්ති- අත්හරිත්.

275 276 පිටු.

රජන්ති- රඤ්ජනය කරන ලද්දාහු. අවුත්තා- නො කියන ලද්දී.

එළක ලෝම ධෝවාපන සික්ඛාපදං නිට්ඨිතං.

---

277 පිට.

පටිවිංසං- කොටස. කිං ආහරීයතූති- කුමක් ගෙන එන්ට දැයි. පරිච්චජෙතාති- පරිත්‍යාග කරන ලද්දේ ද.? ජාතරූප රජතං- රන් රිදී (මසු කහවණු) උග්ගණ්හෙය්‍ය වා- (තමන් උදෙසා) ගත්තේ නම් හෝ. උපනික්ඛිත්තං- (තමන් පිණිස) එළවා තබන ලද්දක්. සජ්ඣුවණ්ණො- තථාගත වර්‍ණය ඇති ලෝහ විශේෂය. දාරු මාසකො- දැවමය මස්ස. ජතුමාසකො- ලාකඩ හෝ මැලියම්වලින් කළ මස්ස. වෝහාරං- ගනු දෙනුවට.

278 279 පිටු.

ඡඩ්ඩෙසි- යම් කිසි තැනක දමව. අනිමිත්තං කත්වා- සලකුණු නො කොට (ඇස පියාගෙන.) පාතෙතබ්බං- දැමිය යුතු යි. අජ්ඣාරාමෙ- තමා වසන ආරාමයෙහි. නික්ඛිපති- තැන්පත් කොට තබයි ද.

රූපිය සික්ඛාපදං නිට්ඨිතං.

---

279 පිට.

රූපිය සංවොහාරං- රන් රිදී මසු කහවණු පෙරළීමට (ගනු දෙනු කිරිමට.) සීසූපගං- සීසු පග වූ (මෙයින් හිසෙහි පැළැඳීමට සුදුසුව කළ ආභරණා දිය කිය වේ.) සබ්බූපගං -කාපි උපගං- ගනු පදච්ඡෙද යි. ඝන කතං- ඉෂ්ට කාදිය.

රූපිය සංවොහාර සික්ඛාපදං නිට්ඨිතං.

---

## 281 පිට.

පට පිලෝතිකානං- වස්ත්‍ර ඛණ්ඩයන් පිළිබඳ වූ. මහග්ඝං පටං- බොහෝ අගනා වස්ත්‍රයක්. ජානාහි- (මේ අවස්ථාවෙහිම) සලකව. ආවුසෝ! අයං සඞ්ඝාටි තේ- යනු පදයෝජනා යි. කතිහි'පි- කී දිනකට. භවිස්සති- වන්නේ ද? නං- යනු නාමාර්ථ නිපාතයකි. කයවික්කයං- ගනු දෙනු කිරීමට.

## 282 පිට.

දසික සුත්තම්පි- දසික සූත්‍රයකු දු. කයිතං- අනුන් ගේ බඩු ගන්නා ලද්දේ. වික්කයිතං- තමන් ගේ බඩු දෙන ලද්දේ. අග්ඝං- වටිනා කම.

**කය වික්කය සික්ඛාපදං නිට්ඨිතං.**

---

**කෝසිය වග්ගෝ දුතියෝ.**

## 283 පිට.

සන්නිචයං- රැස්කිරීම. පත්තවාණිජ්ජං- පාත්‍ර වෙළඳම. ආමත්තිකාපණං- කුලල් බඩු වෙළඳ හලක්. පසාරෙස්සන්ති- ප්‍රසාරණය (විවෘත කිරීම) කෙරෙද් ද. අතිරේක පත්තං- නො ඉටු නො විකෘපූ පාත්‍රයක්.

## 284 පිට.

වණ්ණා- ප්‍රමාණයෝ. අඩ්ඪාළ්හකෝදනං- මගධ නැළියෙන් සහල් නැළි දෙකකින් පිසූ බත්, ආළ්හක නම් නැළි සතරකි. චතුභාගං- බතින් සතරෙන් කොටසක් පමණ වූ.

තදූපියං- ඒ බතට අනුරූප වූ. පත්ථෝදනං- සහල් නැළියක බත්.

**පත්තවග්ගෙ පඨම සික්ඛාපදං නිට්ඨිතං.**

---

## 285 286 පිටු.

පත්තෙන- පාත්‍රයෙන් (පුදම්) වික්කායිකං- විකිණිය යුතු වූ. විලිඛිත මත්තෙන- රේඛා මාත්‍රය කිනුදු (ස්වල්ප වූ ඉරකිනු දු.)

287 පිට.

**ඌන පඤ්ච බන්ධනේන**- බන්ධන පසකින් අඩු වූ. **පත්තේන**- පාත්‍රයකින් (යුතුව) **යෝ ච පත්තපරියන්තෝ**- (හැම දෙනා වහන්සේ ම ගෙන) කෙළවර ලද යම් පාත්‍රයක් වේ ද. **යාව භේදනාය**- බිඳීම දක්වා. **රාජි**- ඉරක්. **අනුද්දයතාය**- කරුණාවෙන්.

**ඌන පඤ්ච බන්ධන සික්ඛාපදං නිට්ඨිතං**

---

290 291 පිටු.

**පබ්භාරං**- පජීත ගුහාවක්. **විස්සරිතබ්බා**- අමතකව. **සබ්බකම්මිකං**- සාර්වත්‍රික වූ හෙවත් හැම කටයුත්තෙහි අධිකාරී වූ. **විගණෙතබ්බා**- ගණන් කොට. **පටිස්සුණිතබ්බා**- ගිවිස. **පාටියෙක්කෝ**- වෙන ම. **නිවිට්ඨි**- පිහිටියේ ය. **මාලාකිතා**- පැලඳි මල් මාලා ඇත්තාහු.

292 පිට.

**තිණණ්ඩුපකං**- තණ සුඹුළුවක්. **පටිමුඤ්ච**- තබව. **චෝරිකාය**- සොරකමින්. **බන්ධාපේසි**- බැන්ද වී ය. **පටිවිස්සකේ**- අසල් වැසියන් ගෙන්. **අභිජ්ඣිච්චි** ඉටු වේය. **සරාජිකාය**- රජු සහිත වූ. **අභිහරිංසු**- එළවූවාහුය.

293 පිට.

**කෝලම්බම්භි**- මහ සැළිද. **පටිසාමෙන්ති**- තැන් පත් කරයි. **ඕලීන විලීනානි**- වැගිරි වැගිරී. **ඔකිණ්ණ විකිණ්ණා**- උඩ යට ගැවසී ගත්තාහු. **අනෙකා කොට්ඨාගාරිකා**- ඇතුළත පිහිටු බතලද භාණ්ඩාගාර ඇත්තාහු. **පටිසායනීයානි**- අනුභව කටයුතු වූ **සත්තාහ පරමං**- සත්දවසකට වැඩි නො වන කාලයක්. **සන්නිධි කාරකං**- සන්නිධි කොට (සුරක්ෂිත කොට තබා.) **අජිකාසපි**- එළු ගිතෙල්. **මහිස**- මීමුන් ගේ (ගිතෙල්).

294 පිට.

**න අපෙක්ඛෝ භවිතබ්බං**- අනු භව නො කටයුතු යි. **උපනේතබ්බං**- එළ විය යුතුයි. **වන්තේන**- දුරලන ලද සිතින්.

**භේසජ්ජ සික්ඛාපදං නිට්ඨිතං.**

---

294 පිට.

**ඕවස්සාපෙන්ති**- තෙමත්. **ඔතේන**- මෑත භාගයෙන් (පශ්චිම මාසයට කලින්.) **උක්කඩ්ඪිය න්ති**- උඩට අදිනු ලැබේ ද.

**වස්සික සාටික සික්ඛාපදං නිට්ඨිතං.**

---

297 298 පිටු.

**අච්ඡින්දි**- පැහැර ගත්තේය. **සාමං**- තෙමේ. **තන්තවායේහි**- පෙහෙරුන් ලවා. **වායාපේම**- විය වමු.

299 පිට.

**ආයෝගේ**- යෙදවීමෙහි. **පවාසං**- විදේශයට. **ධාරසිත්වා**- ප්‍රමාණ කොට, රැස් කොට. **නිකකිස**- තබව **සුවීතඤ්ච**- සෑම තැනම සමකොට වියීම ද. **සුප්පවායිතඤ්ච**- හැම තැනම නූල් සම කොට තන්හි පහරන ලද්දු ද. **සුවිලේඛිතඤ්ච**- වලයෙන් මොනවට ගහන ලදුවා ද. **සුවිතච්ඡිතඤ්ච**- කොස්සෙන් ගසා මොනවට මදින ලදුවා ද.

300.202 පිටු.

**විනාසි**- වියව. **තේ**- ඒ අංගනාදීහු. **ජූතෙන්තා**- හුඩින්. **පටිබද්ධං**- විතල වූයේ. **කාසෙස්**- කත්හි. **උපනෙත්වා**- එලවා. **සේනාය**- සේනාවට. **දූපාතං**- දූත ගැනීමට දූතකාරය. **අච්චෙක චීවරං**- ඉක්මන් කටයුතු සිවුරක්.

303 පිට.

**කත්තික තේමාසි පුණ්ණමං**- වප් මස මැදි පොහොය. **දසාහානාගතං**- පඤ්චමියෙහි පටන් දස දවසකින් අසම්ප්‍රාප්ත කාල්හි. (හෙවත් දස දිනකින් පැමිණෙන කල්හි.) **යාව චීවරකාල සමයං**- චීවර කාල නමැති සමය යම්තාක් ද ඒ තාක්. **සඤ්ඤාණං**- සලකුණක්.

304 පිට.

**කත්තික චෝරකා**- කාර්තිකේය මාසයෙහි සොරු. **පරිපාතෙන්ති**- උවදුරු කරත්. **අන්තර ඝරේ**- ඇතුළු ගමෙහි.

305 පිට.

**උපවස්සං බෝ පන**- වස් වැස වනාහි. **කත්තික පුණ්ණමං**- (පවාරණය කළ දා සිට) ඉල් මස මැදි පොහොය

දක්වා. (මසක් මුළුල්ලෙහි) **සාසඞ්කසම්මතානි**- (සොරු විසන තැන් දැකීමාදියෙන්) සැක සහිත ය යි දන්නා ලද.

306 307 පිටු.

**පූගස්ස**- සමූහයක් හු ගේ. **චීවරභත්තං**- සිවුරු සහිත බතක්. **පටියත්තං**- පිළිවෙළ කරන ලද්දේ. **සොවණ්ණි**- කාවරෙක් නම්. **ඕණොජෙථ**- දෙව්. **පටිසඞ්ඛාරං වා**- පටිසඞ්ඛරණය හෝ.

**සත්තවග්ගො නිට්ඨිතො.**

---

## පාරාජිකා පාළි නිට්ඨිතා.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු